# වාර්ෂික වාර්තාව
# 2019



වැවිලි අමාත්‍යාංශය
பெருந்தோட்ட அமைச்சு
Ministry of Plantation

සී/ස හලාවත වැවිලි සමාගම
சிலாபம் பெருந்தோட்ட நிறுவனம்
CHILAW PLANTATIONS LTD

# අන්තර්ගතය


Page No

| | |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 02 |
| මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා | 03 - 04 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 05 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 06 - 08 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 09 |
| කළමනාකරණ විමසුම | 10 - 22 |
| මූල්‍ය සමාලෝචනය | 23 - 27 |
| ආයතනික පාලන ප්‍රකාශය | 28 |
| අවධානම් කළමනාකරණය | 29 - 30 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 31 |

**මූල්‍ය වාර්තා**

| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 32 - 34 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 35 |
| විගණකාධිපති වාර්තාව | 36 - 42 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 43 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 44 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 45 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 46 |
| ගිණුම්කරණ, ප්‍රතිපත්ති සහ සටහන් | 47 - 82 |

| | |
|---|---|
| දස වසරක සාරාංශය | 83 |
| වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය | 84 |
| පෙරකලාසි අයදුම් පත | 85 |
| ආයතනික විස්තරය | කවරයේ ඇතුලත |



# දැක්ම

පොල් කර්මාන්තයේ තිරසර සංවර්ධනය මඟින්
ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබාදීම.

# මෙහෙවර

පොල් පාදක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා තමන් සතු සීමිත සම්පත් ඵලදායී ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් පිළිගත් ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ සහ මහජනතාවගේ ජීවන තත්වය නංවාලීම.

# අගයන්

| | |
|---|---|
| අවංක බව | කණ්ඩායම් හැඟිම |
| අඛණ්ඩතාව | සවිබල ගැන්වීම |
| විනිවිදභාවය | නව්‍යකරණය |
| නායකත්වය | වෘත්තීයභාවය |

වගකීම සහ වගවීම

# මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

| | 2019 | 2018 | වෙනස % |
|---|---|---|---|
| පොල් නිෂ්පාදනය ගෙඩි '000 | 14,994 | 8,132 | 84 |
| **සාරාංශ ප්‍රතිඵල** | රු. 000 | රු. 000 | % |
| අයභාරය | 445,502 | 350,022 | 27 |
| දළ ලාභය | 89,086 | (208) | 42,930 |
| පොලිය සහ බදු පෙර ලාභය | 89,951 | (14,529) | 719 |
| බදු පෙර ලාභය | 60,908 | (35,179) | 273 |
| බදු පසු ලාභය | 49,440 | (36,642) | 235 |
| රඳවාගත් ලාභය | 747,823 | 708,382 | 6 |
| දැව සංචිතය | 130,655 | 95,398 | 37 |
| සමුච්චිත මුළු ලාභාංශ (1992-2018) | 466,650 | 456,650 | 2 |
| **මූල්‍ය තත්වය** | | | |
| ජංගම නොවන වත්කම් | 1,178,237 | 1,120,859 | 5 |
| මේරු/නොමේරු වගා | 917,169 | 870,102 | 5 |
| ජංගම වත්කම් | 234,091 | 184,466 | 27 |
| තොග | 67,383 | 56,610 | 19 |
| කෙටි කාලීන ආයෝජන (ස්ථාවර තැන්පතු) | 105,000 | 80,625 | 30 |
| මුළු වත්කම් | 1,412,328 | 1,305,325 | 8 |
| ජංගම වගකීම් | 157,011 | 107,101 | 47 |
| ජංගම නොවන වගකීම් | 307,494 | 289,841 | 6 |
| කොටස් ප්‍රග්ධනය | 200,000 | 200,000 | - |
| කොටස් කරුවන්ගේ අරමුදල් | 947,823 | 908,382 | 4 |
| **මූලික දර්ශක** | වාර/ % | වාර/ % | වෙනස/ % |
| ජංගම අනුපාතය (වාර) | 1.49 | 1.72 | (13) |
| ක්ෂණික අනුපාතය (වාර) | 1.06 | 1.19 | (11) |
| දළ ලාභ අනුපාතය | 20 | (0.06) | 33,751 |
| කොටසක ඉපයීම රු. | 2.37 | (1.62) | 246 |
| සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) % | 5.33 | (3.95) | 235 |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) % | 7.17 | 1.21 | 691 |
| ණයගැති අනුපාතය | 0.33 | 0.30 | 8 |
| කොටස් කරුවන්ගේ අරමුදල් අනුපාතය % | 67.11 | 69.59 | (4) |
| පොලි ආවරණය වාර | 2.26 | (0.41) | 651 |


අයභාරය
රු. "000"
500,000
400,000
300,000
200,000
100,000
445,502
350,022
2019
2018


දළ ලාභය
රු. "000"
100,000
80,000
60,000
40,000
20,000
89,086
(208)
2019
2018


බදු පෙර ලාභය
රු. "000"
80,000
60,000
40,000
20,000
-
(20,000)
(40,000)
60,908
(35,179)
2019
2018


දළ ලාභ අනුපාතය
%
20%
15%
10%
5%
0%
-5%
20%
-0.06%
2019
2018


වත්කම් සමුදාය
රු. "000"
1,450,000
1,400,000
1,350,000
1,300,000
1,250,000
1,412,328
1,305,325
2019
2018


කොටස් කරුවන්ගේ අරමුදල
රු. "000"
950,000
940,000
930,000
920,000
910,000
900,000
890,000
880,000
947,823
908,382
2019
2018


කෙටි කාලීන ආයෝජන
රු. "000"
120,000
100,000
80,000
60,000
40,000
20,000
105,000
80.625
2019
2018


කොටසක ඉපයීම
රු. "000"
3.00
2.00
1.00
-
(1.00)
(2.00)
2.37
(1.62)
2019
2018


ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම්
%
8
6
4
2
0
-2
7.17
-1.21
2019
2018

## සභාපතිතුමාගේ පණිවුඩය

අභිනවනයෙන් පත්වූ හලාවත වැවිලි සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස 2019 වර්ෂය සඳහා වූ සමාගමේ ප්‍රතිඵල සමාලෝචනය සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීමට ලැබීම ගැන ඉතාමත් සතුටට පත්වෙමි. 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය ආයතනයට තීරණාත්මක වසරක් වූයේ 2018 වර්ෂයේ ආයතනයේ කාර්යය සාධනය අවම මට්ටමක පැවති බැවිනි. 2019 වර්ෂය ලාභදායීව නිම කිරීමට වසර මුල සිටම ආයතනක් ලෙස හලාවත වැවිලි සමාගම අධිෂ්ඨාන කර තිබිණ. 2018 වර්ෂයේ පොල් වගාව සඳහා වූ හිතකර කාලගුණය 2019 වසර සඳහා වු පොල් නිෂ්පාදනය වැඩි කිරීමෙහිලා දායක විය.

### කාර්යය සාධනය

### පොල්

2019 වර්ෂය තුලදී පොල් ගෙඩි මිලියන 14,993,952ක නිෂ්පාදනයක් හලාවත වැවිලි සමාගම විසින් වාර්තා කරනු ලැබීය. මෙය පෙර වසරට සාපේක්ෂව ඉතා සාධනීය ප්‍රතිඵලයක් වන අතර එය පෙර වසරට සාපේක්ෂව 84%ක වර්ධනයකි. කෙසේ වෙතත් පොල් ප්‍රමාණයේ වැඩිවීමට සාපේක්ෂව වසර අවසන් භාගයේ සිදුවූ මිලෙහි සීඝ්‍ර අඩුවීම ආයතනයේ කාර්යය සාධනය කෙරෙහි බලපෑම් එල්ල කරනු ලැබිණ. වසර අවසන පොල් විකුණුම් මිල ලෙස රු.25/- ක් ලෙස සටහන් වූ අතර එය පසුගිය වසර 8 ක කාලය තුල වාර්තා වූ අවම මිල වේ.

### කජු

තම්බපණ්ණි සහ මංගල එළිය යන වතු වෙන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂයේ මෙ.ටො. 152ක වාර්ථාගත කජු අස්වැන්නක් ලබා ගැනීමට සමත් විය. මෙය ඕනෑම වර්ෂයක් තුල ආයතනය විසින් ලබාගත් ඉහළම කජු අස්වැන්න වේ. හිතකර කෘෂිකාර්මික වත්පිළිවෙත් සහ අස්වැන්න සුරකීම සඳහා අනුගමනය කරනු ලැබූ දැඩි ආරක්ෂිත ක්‍රියා මාර්ගද අස්වැන්නේ වැඩිවීම සඳහා ඉවහල් විය. 2020 වසරේ කජු අස්වැන්න තවදුරටත් වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වන්නේ නිසි කෘෂිකාර්මික හා අස්වනු නෙලීම් ක්‍රම ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීමෙනි. අගය එකතු කරන ලද කජු සඳහාද මේවන විට වෙළඳපොල තුල සැලකිය යුතු ඉල්ලුමක් ඇති වී ඇති අතර එය සපුරාලීම සඳහා හලාවත වැවිලි සමාගම කටයුතු කරමින් පවතී.

### වැසි ජලය රැස් කිරීම

වැඩිමනක් වතු වියළි කලාපයේ පිහිටා ඇති වතු සමාගමක් ලෙස ජල කළමනාකරණයේ වැදගත්කම ඉතා හොඳින් අවධාරණය කරගෙන ඇත. එම කරුණ සාර්ථක කර ගැනීම සඳහා වැසි ජලය එක් රැස් කර ගැනීමටත් භූගත ජල මට්ටම් පවත්වා ගැනීමටත් වතු කලාප වල පවතින වැව්/පතස් ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර ඇත. මෙම ප්‍රයත්නයන් වල හිතකර ප්‍රතිඵලයන් ඉදිරි වර්ෂයන් වලදී ලබාගත හැක.

### ජල සම්පාදනය

ඉදිරි කාලයේ පරිනත වන පොල් වගාවන් සුරක්ෂිත කිරීම උදෙසා සමාගමට අයත් සීනුගල වත්තේ නළ මගින් ජලය ලබාදිය හැකි වාරි පද්ධතියක් ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද අතර එය මේ වන විට සැලකිය යුතු ආකාරයේ ප්‍රගතියක් ලගාකරගෙන ඇත. මෙවැනි ජල සම්පාදන පද්ධති තවදුරටත් ව්‍යාප්ත කිරීමට සමාගම අපේක්ෂා කරයි.

### අගය එකතු කරන ලද නිෂ්පාදන සහ අලෙවිය

පොල් තෙල්, කජු, මුදවපු කිරි සහ යෝගට් යන අගය එකතු කර ලද නිෂ්පාදන අපගේ වෙළඳ සැල් මඟින් හා ජංගම රථ මඟින් පාරිභෝගිකයින් වෙත ලබාදීමට කටයුතු කර ඇත. මෙම කාර්යය තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා හලාවත වැවිලි සමාගම මඟින් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේද අලෙවි සැලක් ආරම්භ කරන ලද අතර එය ප්‍රදේශයේ ජනතාව තුල, හලාවත වැවිලි සමාගමේ නැවුම් නිෂ්පාදන මිලදී ගතහැකි ප්‍රචලිත අලෙවි සැලක් බවට පත්ව ඇත.

### සුභ සාධනය කටයුතු

හදුනාගන්නා ලද පුහුණු අවශ්‍යතා සඳහා විවිධ ආකාරයේ පුහුණු සැසි ආයතනයේ සේවක සේවිකාවන් හට ලබාදුන් අතර වාර්ෂික සුහද හමු ආදිය මඟින් සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීමට කටයුතු කරනු ලැබිණ. සේවකයින්ගේ කාර්යය සාධානය හා ඔවුන් ඇගයීමට ලක්කිරීමද වසර තුල සිදුකරන ලදී.

### ඉදිරි දැක්ම

සමාගමේ ඉදිරි පැවැත්ම සඳහා, විවිධාංගීකරණයේ වැදගත්කම හලාවත වැවිලි සමාගම විසින් අවබෝධකරගෙන ඇති අතර මෙයට සමගාමීව වැවිලි ක්ෂේත්‍ර තුල රැඳී පැවතීමට විවිධ අංශවල ආදායම් ඉපැයීමේ ව්‍යාපෘති රැසකට මේවන විට මූලික අඩිතාලම් සකසා ඇත. මෙම කරුණ ඉදිරි වර්ෂයන් සඳහා සකසන ලද සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත කර ඇති විවිධ ව්‍යාපෘති මඟින් තවදුරටත් තහවුරු වනු ඇත. ජාතික ආර්ථිකයට සැලකිය යුතු මිටටමේ දායකත්වයක් ලබාදෙමින් වැවිලි ක්ෂේත්‍රය තුල කැපී පෙනෙන ආයතනයක් ලෙස පැවතීමට මෙමඟින් හලාවත වැවිලි සමාගමට හැකියාව ලැබෙනු ඇත.

### තුති පිදුම

හලාවත වැවිලි සමාගමෙහි කටයුතු වෙනුවෙන් නිරන්තර මඟපෙන්වීම් සිදුකරමින් අප උනන්දු කරනු ලැබූ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, හලාවත වැවිලි සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයටද, ඉහත කාර්යය සාධනයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගය දෙනු ලැබූ සාමාන්‍යාධිකාරී ඇතුළු හලාවත වැවිලි සමාගමෙහි දියුණුවට කැපවන සියළුම අංශයන් නියෝජනය කරන නිලධාරී මඩුල්ලටද ස්තූතිය මෙයින් පුද කර සිටිමි.

ඊට අමතරව, අපගේ ව්‍යාපාර ප්‍රජාව නියෝජනය කරන පාරිභෝගිකයින්, තැරවුකරුවන්, පොල් ගැණුම්කරුවන්, භාණ්ඩ සපයන්නන්, වාණිජ බැංකු, වෘත්තීය සමිති නියෝජිතයින් ඇතුළු සමස්ථ ප්‍රජාවට මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කර සිටිමි.

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
හලාවත වැවිලි සමාගම



**ජූඩ් රූකාන්ත පෙරේරා මහතා**
(B.A. M.A. H.S.D.)
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි



**එච්.ජී. සුමනසිංහ**
අධ්‍යක්ෂ

ජූඩ් රූකාන්ත පෙරේරා මහතා 2020 ජනවාරි 01 වන දින සි/ස හලාවත වැවිලි සමාගමෙහි සභාපති / ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාරගන්නා ලදි.

ඔහු, වැදගත් නීතිඥ පවුලකින් පැවත එන අතර ඔහු විසින් ශාස්ත්‍රවේදී උපාධිය හා පශ්චාත් උපාධි ලබා ඇත. මොහු කොළඹ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය හා ඇක්වයිනාස් ආයතනය තුල අධ්‍යාපනය හදාරා ඇත. තවද ඔහු ඇමරිකන් ෆීල්ඩ් සර්විසස් ආයතනයෙහි ශිෂ්‍යත්වලාභියකුද වේ.

ජූඩ් රූකාන්ත පෙරේරා මහතා කෑගල්ල ප්‍රදේශයේ නගරාධිපති ලෙස තේරී පත් වූ අතර එකල කෑගල්ල නගර සභාව ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම නගර සභාව බවට නගා සිටුවන ලදී. සම්බන්ධිකරණ ලේකම් සහා මාධ්‍ය ලේකම් වශයෙන් විවිධ අමාත්‍යංශ වල කටයුතු කර ඇති අතර රාජ්‍ය අංශයේ ක්‍රියාකාරිව කටයුතු කල නිලධාරියෙකි. ඔහු 2009 සිට 2015 කාලය දක්වා කුරුණෑගල වැවිලි සමාගමේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ ලෙස කටයුතු කල අතර ඉහළ ලාභ ලබමින් එම ආයතනයේ උන්ණතිය වෙනුවෙන් සුවිශේෂි මෙහෙවරක් ඉටු කරන ලදී. පිළිගත් පෞද්ලික ආයතනයකද ඉහළ කළමනාකාරිත්ව සාමාජිකයකු වූ අතර ඔහු රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම කැපී පෙනෙන දක්ෂ නිලධාරියකි.

ඔහුගේ නායකත්වය යටතේ ඉතා කෙටි කාලයක් තුල හලාවත වැවිලි සමාගමේ සීඝ්‍ර වර්ධනයක් දැකිය හැකි අතර 2020 ජුලි මස අවසානය වන විට 400% ක ඉතිහාසගත වැඩිම ලාභයක් වාර්තා කරන ලදී. ඊට සමගාමීව ලබන වසරේදී අන්තර්ජාතික වෙළඳපල සඳහා අගය එකතු කරන ලද නව නිෂ්පාදන ව්‍යාපෘතීන් ආරම්භ කිරිමටද අපේක්ෂා කර ඇත .

ඔහු වැවිලි ක්ෂේත්‍රය පිළිබඳව මනා දැනුමක් හා පළපුරුද්දක් සහිත කැපී පෙනෙන කළමනාකරණ හා නායකත්ව හැකියාවන් ඇති උගත් නිලධාරියෙකි.

එච් ජී සුමනසිංහ මහතා 2020 පෙබරවාරි මස 05 වන දින සි/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලද අතර ඔහු මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂක මණ්ඩල සමාජික ලෙස කටයුතු කරන අතර වෙනත් රාජ්‍ය ආයතන කිහිපයකද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරයි.

එච් ජී සුමනසිංහ මහතා මුදල් අමාත්‍යංශයේ අතිරේක ලේකම් තනතුර හොබවන අතර රාජ්‍ය සේවයේ විසිපස් වසරක පලපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණි නිලධාරියෙකි.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙහි වාණිජවේදී උපාධිධරයෙකු වන අතර දකුණු ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් (Flinders) විශ්වවිද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධිදාරියෙකි.



**අරුණි එස් රණසිංහ මහත්මිය**
අධ්‍යක්ෂ

අරුණි එස් රණසිංහ මහත්මිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරමින් 2020 පෙබරවාරි මස 14 වන දින සිට සි/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයකු ලෙස කටයුතු කරනු ලබන අතර වෙනත් රාජ්‍ය ආයතන කිහිපයකද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරයි.

ඇය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) ලෙස වර්තමානයේ සේවය කරන අතර රාජ්‍ය සේවයේ වසර විසිදෙකක පලපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණි නිලධාරිනියකි.

අරුණි එස් රණසිංහ මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය හදාරා ඇත.



**කීර්ති පතිරණගේ මහතා**
අධ්‍යක්ෂ

කීර්ති පතිරණගේ මහතා 2020-02-05 දින සි/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයකු ලෙස පත්කරන ලද අතර ඔහු දැනට සෙවනගල ලංකා සීනි සමාගමෙහි ප්‍රධාන මෙහෙයුම් නිලධාරි ලෙස කටයුතු කරමින් පවතී.

2013-2015 දක්වා කාලය තුලදී ඔහු හලාවත වැවිලි සමාගමේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ ධුරය හෙබවූ අතර ඔහු හෝටල් ක්ෂේත්‍රයේ පළපුරුදු ගණකාධිකාරිවරයකු වේ.



**නලින්ද කසුන් රාජසිංහ මහතා**
අධ්‍යක්ෂ

නලින්ද රාජසිංහ මහතා 2020-02-05 දින සි/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයකු ලෙස තේරී පත්වන ලදී. තවද ඔහු රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කරනු ලැබේ.

වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවතින JCT ආයතනයේ මෙහෙයුම් හා ව්‍යාපාර සංවර්ධන ප්‍රධානී ලෙස කටයුතු කරන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් පවතී.



**අජන්ත මූණමලේ මහතා (Lt. Col.)**
අධ්‍යක්ෂ

අජන්ත මූණමලේ මහතා 2020-02-05 දින හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජියකු ලෙස තේරී පත්විය.

අවු. 39 ක වැවිලි ක්ෂේත්‍රයේ පළපුරුදු නිලධාරියකු වන අතර දැනට කෑගල්ල වැවිලි සමාගමේ වතු සමූහ කළමනාකරුවකු ලෙස කටයුතු කරනු ලබයි.

ඉන්දියාවේ චාටඩ් ෆයිනෑන්ෂල් ආයතනයෙහි ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය ලබා ඇති අතර මානව සම්පත් හා අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරයකු වේ.

ඔහු ශ්‍රී ලංකා යුධ හමුදාවෙහි ස්වේච්ඡා බල ඇණියේ ලුතිනන් කර්නල්වරයකු වන අතර ශ්‍රී ලංකා මානව සම්පත් කළමනාකරණ ආයතනයේ සාමාජිකයකු ද වේ.



**ඩබ්.ඩබ්.ඒ.එන්.ටී.ඒ ප්‍රනාන්දු මහතා**
අධ්‍යක්ෂ

නිරෝෂ් ප්‍රනාන්දු මහතා 2020-02-05 දින සිට සී/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කරන අතර තවත් රාජ්‍ය ආයතන කිහිපයකම අධ්‍යක්ෂධුර දරනු ලබයි.

ඔහු පාරම්පරික ව්‍යාපාරික පවුලකින් පැවත එන සර්ව නිපුණ ව්‍යාපාරිකයෙකි.



**අයි. එස්. ජේ. පි. ගුණවර්ධන**
අධ්‍යක්ෂ

අයි එස් ජේ පී ගුණවර්ධන මහතා 2020-02-05 දින සී/ස හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජියකු ලෙස කටයුතු කරනු ලබයි.

ඔහු මහජන බැංකුවේ විශ්‍රාමික බැංකු නිලධාරියකු වන අතර බැංකු ක්ෂෙත්‍රයේ සියලු විභාග සම්පූර්ණ කරන ලැබූ සුදුසුකම් ලත් නිලධාරියෙකි.

## පෙර පැවති අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| වි.කේ.සී. හේරත් මහතා (14.07.2016 - 31.12.2019) | සභාපති |
| එම්.කේ.බි. සෙනවිරත්න මහතා (08.05.2015 - 05.02.2020) | විධායක අධ්‍යක්ෂ |
| පී.සී. විජේවර්ධන මහතා (28.02.2019 - 05.02.2020) | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| පී.බි.එස්.සි. නෝනිස් මහතා (05.09.2016 - 03.02.2020) | අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත |
| ඒ. ලක්කතාස් මහතා (19.05.2016 - 28.02.2019) | අධ්‍යක්ෂ |
| අරුණි එස්. රණසිංහ මහත්මිය (28.02.2019 - 05.02.2020) | අධ්‍යක්ෂ/ අමාත්‍යාංශ නියෝජිතවරිය |
| ජෙ.බි. කළුආරච්චි මහතා (31.01.2019 - 05.02.2020) | අධ්‍යක්ෂ |
| ආනන්ද පුෂ්පකුමාර මහතා (19.03.2019 - 05.02.2020) | අධ්‍යක්ෂ |
| එච්.එම්.එන්.සි. හේරත් මහතා (20.03.2015 - 31.01.2019) | අධ්‍යක්ෂ |
| එස්. විජේගුණවර්ධන මහතා (24.07.2018 - 28.02.2019) | අධ්‍යක්ෂ |

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

### ප්‍රධාන කාර්යාලය

| | | | |
|---|---|---|---|
| 01. | ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා | - | සභාපති/ප්‍රධාන විධායක නිලධාරී |
| 02. | ඒ.ජී.ආර්.එම්.එම්. රණවීර මහතා | - | සාමාන්‍යාධිකාරී |
| 03. | බී. හෙට්ටිආරච්චි මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි |
| 04. | ආර්. එම්.ආර්.බී. රත්නායක | - | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී |
| 05. | එච්.පි.එම්.ඩබ්. හේමචන්ද්‍ර මහතා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 06. | ඒ.ඒ. අශෝක ආනන්ද මහතා | - | වතු කළමනාකාර |
| 07. | ඩබ්. කේ. ප්‍රදීප් මහතා | - | කළමනාකාර (තාක්ෂණ/සංවර්ධන) |
| 08. | ඒ.එම්.ටී.එච්.බී. අතපත්තු මහතා | - | කළමනාකාර (මානව සම්පත්/පාලන) |
| 09. | ඒ.එන්.ඒ.එස්. කරුණාතුංග මහතා | - | කළමනාකාර (අලෙවි) |
| 10. | පි.එන්.එන්. ගුණසීල මෙනවිය | - | කළමනාකාරිනි (සැලසුම් / පසුවිපරම්) |

### වතු අධිකාරිවරුන්

| | | | |
|---|---|---|---|
| 11. | ජේ.එච්. ප්‍රනාන්දු මහතා | - | වතු අධිකාරි, පලුගස්වැව වත්ත |
| 12. | එම්.ජී.සි. ඩයස් මහතා | - | වතු අධිකාරි, දිවුලපිටිය වතු කලාපය |
| 13. | ඩි.එම්.ජී.ඒ. දිසානායක මහතා | - | වතු අධිකාරි, මාදම්පේ වතු කලාපය |
| 14. | බි.එම්.යු.බී. බස්නායක මහතා | - | වතු අධිකාරි, හලාවත වතු කලාපය |
| 15. | එ.එම්.ඩි.ගුණතිලක මහතා | - | වතු අධිකාරි, බිංගිරිය වතු කලාපය |
| 16. | එච්.ටී.එස්. පෙරේරා මහතා | - | වතු අධිකාරි, තම්බපන්නි වතු කලාපය |
| 17. | බී.ඒ.පි.ඩි. ධර්මසේන මහතා | - | වතු අධිකාරි, මංගලඑළිය වතු කලාපය |
| 18. | කේ.ඒ.එන්.අයි. කරුණාරත්න | - | වතු අධිකාරි, නිකවැරටිය වතු කලාපය |

## කළමනාකරණ විමසුම

### සමාගමෙහි වතු කලාපයන්හි පිහිටීම



## වතු කලාපයන්හි තොරතුරු

| වතු කලාපය | වතු කොට්ඨාශ සංඛ්‍යාව | හෙක්. ගණන | ප්‍රධාන භෝග | අතුරු භෝග | ප්‍රා.ලේ. කොට්ඨාශ |
|---|---|---|---|---|---|
| බිංගිරිය වතු කලාපය | 11 | 1,109.74 | පොල් | බ්‍රගන් ෆෘට්, කුරුඳු, කජු | බිංගිරිය |
| හලාවත වතු කලාපය | 12 | 645.57 | පොල් | කජු, කුරුඳු, බ්‍රගන්ෆෘට්, අඹ | පල්ලම , ආරච්චිකට්ටුව, රස්නායකපුර |
| දිවුලපිටිය වතු කලාපය | 14 | 424.49 | පොල් | ගම්මිරිස්, රඹුටන්, කුරුඳු | දිවුලපිටිය, කටාන, වෙන්නප්පුව |
| මාදම්පේ වතු කලාපය | 12 | 655.86 | පොල් | බ්‍රගන්ෆෘට්, අන්නාසි, කජු | නාත්තන්ඩිය, හලාවත, බිංගිරිය, උඩුබද්දාව, කුලියාපිටිය |
| මංගලඑළිය වතු කලාපය | 11 | 816.64 | පොල් | කජු | පුත්තලම, මුන්දලම, මහකුඹුක්කඩවල |
| නිකවැරටිය වතු කලාපය | 13 | 399.92 | පොල් | කජු | කොබෙයිගනේ, පඩුවස්නුවර |
| පළුගස්වැව වත්ත | 01 | 672.22 | පොල් | බ්‍රගන්ෆෘට්, කජු | ආරච්චිකට්ටුව |
| තම්බපණ්නි වතු කලාපය | 10 | 1,008.79 | පොල්, කජු | කජු | පුත්තලම, වනාතවිල්ලුව, කල්පිටිය |
| **එකතුව** | **84** | **5,733.23** | | | |

### ව්‍යාපාර ව්‍යුහය
### කෘෂි ව්‍යාපාර කළමනාකරණය

හලාවත වැවිලි සමාගම පුත්තලම, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් ප්‍රමුඛකොට සහ ගම්පහ යන දිස්ත්‍රික්කය ද ඇතුලත්ව හෙක්ටයාර් 5,733.23 ක් කළමනාකරණය කරන අතර, ඉන් හෙක්ටයාර් 3,804.94 ක ව්‍යාප්ත වන පරිදි විවිධ වයස් සීමාවන්ට අයත් පොල් වගාවන් ස්ථාපිත කර ඇත. අප සමාගමෙහි ප්‍රධාන ව්‍යාපාර ව්‍යුහය ලෙසට පොල් ප්‍රමුඛ කොට ගනිමින් අතුරු බෝග ලෙසට සහ පළතුරු ලෙසට කජු, අඹ, රඹුටන්, බ්‍රගන්ෆෘට් සමඟ කුළු බඩු වශයෙන් කුරුඳු සහ ගම්මිරිස් වගාවන් ඇත. ඊට අමතරව සත්ව පාලන කටයුතු ද ඉතාමත් සාර්ථකව සිදුකරමින් පවතී. කුරුණෑගල සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් තුළ පිහිටි බොහොමයක් ඉඩම් අතර මැදි හා තෙත් දේශගුණික ලක්ෂණයන්ද, පුත්තලම දිස්ත්‍රික්කය ඇතුලත පිහිටි සියළුම ඉඩම් වියලි දේශගුණික තත්වයන් පෙන්නුම් කරනු ලබයි. ඉහත සඳහන් දිස්ත්‍රික්කයන්ට අයත්ව විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත වතු ඒකක 84 ක් පවතින අතර, එම වතු ඒකක සියල්ලම වතු කලාප 8 ක් යටතේ කළමනාකරණය කරනු ලැබේ. එම වතු ඒකක විවිධ දේශගුණික පරිසරයන්ට අයත් වීම මත ඵලදායිතාවයන් එකිනෙකට සංසන්දනාත්මකව වෙනස් වේ. එතුළින් අඩු ඵලදායිතාවයක් වියලි කලාපයට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි වතු ඒකක තුළ දක්නට ලැබේ.

## වාර්ෂික පොල් නිෂ්පාදනය පිළිබඳ තොරතුරු

| වසර | පොල් අස්වැන්න (ගෙඩි) | වෙනස % | ඵලදරණ ගස් සංඛ්‍යාව | වෙනස % | පොල් ගසක සාමාන්‍ය ගෙඩි ගණන | ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය (මිලියන) | වෙනස |
|---|---|---|---|---|---|---|---|
| 1992 | 20,782,648 | 0 | 421,875 | - | 49 | 2,296 | - |
| 1993 | 19,145,214 | -8 | 407,512 | -05% | 47 | 2,164 | -06% |
| 1994 | 21,382,314 | +12 | 426,722 | +03% | 50 | 2,622 | +21% |
| 1995 | 22,603,156 | +6 | 441,379 | +04% | 51 | 2,275 | +05% |
| 1996 | 19,336,658 | -14 | 421,716 | -04% | 46 | 2,546 | -08% |
| 1997 | 19,235,974 | -1 | 412,006 | -02% | 47 | 2,630 | +03% |
| 1998 | 18,921,808 | -2 | 415,718 | +01% | 46 | 2,522 | -04% |
| 1999 | 21,348,626 | +13 | 393,360 | -05% | 54 | 2,828 | +12% |
| 2000 | 23,216,882 | +9 | 399,454 | +02% | 58 | 2,396 | +09% |
| 2001 | 21,829,630 | -06 | 395,435 | -01% | 55 | 2,769 | -11% |
| 2002 | 15,031,795 | -31 | 413,465 | +05% | 36 | 2,392 | -14% |
| 2003 | 17,585,652 | +17 | 402,937 | -03% | 44 | 2,562 | +11% |
| 2004 | 18,354,614 | +04 | 401,162 | 00% | 46 | 2,591 | +01% |
| 2005 | 14,391,265 | -22 | 408,006 | +02% | 35 | 2,515 | -03% |
| 2006 | 17,070,324 | +19 | 411,968 | +01% | 41 | 2,785 | +11% |
| 2007 | 17,815,317 | +04 | 395,762 | -04% | 45 | 2,869 | +03% |
| 2008 | 16,280,051 | -09 | 378,333 | -04% | 43 | 2,908 | +01% |
| 2009 | 18,632,247 | +14 | 380,000 | 00% | 49 | 2,762 | -05% |
| 2010 | 18,256,007 | -2 | 340,586 | -10% | 54 | 2,317 | -16% |
| 2011 | 14,527,770 | -20 | 353,113 | +04% | 41 | 2,808 | +09% |
| 2012 | 15,807,753 | +09 | 312,456 | -12% | 51 | 2,940 | +05% |
| 2013 | 09,595,275 | -39 | 313,048 | +01% | 31 | 2,513 | -14% |
| 2014 | 12,969,381 | 35 | 283,449 | -9% | 46 | 2,870 | +14 |
| 2015 | 12,517,083 | -3 | 288,951 | 2% | 43 | 3,026 | +5 |
| 2016 | 16,522,290 | 32% | 304,043 | 5% | 54 | 2,845 | -7% |
| 2017 | 11,651,155 | -29% | 282,005 | -7% | 41 | 2,450 | -14% |
| 2018 | 8,132,121 | -30% | 262.517 | -7% | 31 | 2,737 | +10% |
| 2019 | 14,993,952 | 84% | 259,808 | -1% | 58 | 3.106 | -13% |

2019 වර්ෂයේදී වර්ෂාපථන ව්‍යාප්තියේ සහ තීව්‍රතාවයෙහි හිතකර වෙනස්කමක් පෙර වර්ෂයන්ට සාපේක්ෂව වාර්තාවිය. එහි සෘජු ප්‍රතිඵලයක් වශයෙන් පොල් වගාව දිගු වියලි දේශගුණික තත්වයන්ට මුහුණපෑමට ඇතිවූ අවස්ථාවන් වැලකීම මත පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ පොල් අස්වැන්නක් ලබා ගැනීමට හලාවත වැවිලි සමාගම සමත්විය.

පොල් අස්වැන්න - (ගෙඩි) - 1992 වර්ෂයේ සිට




## පොල් පැළ යටි වගාව

හලාවත වැවිලි සමාගම වර්ෂ 2009 - 2013 යන කාලයන්හිදී කෘෂිකාර්මික කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඉතාමත් පහළ මට්ටමක පැවති පොල් යටි වගාවන් ව්‍යාප්තිය වැඩිකර ඇත. එම කාල වකවානුව තුළ ස්ථාපිත සහ ඊට පසුව වතු ඒකක වල විටින් විට ස්ථාපිත පොල් යටි වගාවන් නිසි ලෙස නඩත්තු කිරීම මූලික ඉලක්කය කරගනිමින් මෑත කාලයේදී පොල් යටි වගාවන් නැවත ස්ථාපිත කිරීම සීමාකර ඇත. වර්ෂ 2019 අවසානය වන විට හලාවත වැවිලි සමාගම සතුවූ පොල් යටි වගාවන් ප්‍රමාණය හෙක්ටයාර් 814.19 කි. මෙය මුළු පොල් වගා ඉඩම් ප්‍රමාණයෙන් 27.22% ක් වේ. එමෙන්ම වියලි හා අතරමැදි තෙත් කලාපයට වාර්ෂිකව පවතින දිගු වියලි දේශගුණික තත්වයන් පැල වගාවේ අඛණ්ඩ වර්ධනයට බලපෑමක් ඇති කරයි. තවද මෙම කලාපයන් තුළ පවතින රතු කුරුම්ණි හානියද අහිතකර ලෙස පැළ වගාවේ වර්ධනයට බලපෑමක් එල්ල කර ඇත.

| වතු කලාපය | පොල් වගා ප්‍රමාණය (හෙක්.) | පොල් පැළ වගා ප්‍රමාණය (හෙක්.) | පැළ වගාව මුළු වගාවේ ප්‍රතිශතයක් (%) ලෙසට |
|---|---|---|---|
| බිංගිරිය | 492.04 | 195.00 | 39.63 |
| හලාවත | 393.14 | 92.22 | 23.46 |
| දිවුලපිටිය | 319.74 | 84.00 | 26.27 |
| මාදම්පේ | 496.95 | 106.7 | 21.47 |
| මංගලඑළිය | 242.6 | 51.19 | 21.10 |
| නිකවැරටිය | 255.91 | 76.96 | 30.07 |
| පළුගස්වැව | 456.16 | 161.00 | 35.29 |
| තම්බපණ්නි | 334.21 | 47.12 | 14.01 |
| **එකතුව** | **2,990.75** | **814.19** | **27.22** |

## බෝග විවිධාංගීකරණය හා සත්ව පාලනය

### බෝග විවිධාංගීකරණය

වැඩි භූමි ප්‍රමාණයක් වියලි දේශගුණික කලාපයට අයත් වීම මත එම ඉඩම් තුළ බහු වාර්ෂික අතුරු බෝගයක් ලෙසට කජු වගා කොට ඇත. සමාගම සතු කජු වගා ප්‍රමාණයෙන් බහුතරයක් පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම හා මංගලඑළිය වතු මූලික කරගනිමින් ව්‍යාප්තව ඇත. එහි හෙක්ටයාර් 805.88 ක් ලෙසට දැක්වේ. වර්ෂ 2019 දී පෙර වර්ෂයන්ට සාපේක්ෂව ඉහළම කජු අස්වැන්න ලබා ගත් අතර එය කිලෝ ග්‍රෑම් 151,542 ක් පමණ වේ. කෙසේ වෙතත් පවතින පාංශු ලක්ෂණ හා වර්ෂාපතනය මත භූමියෙන් උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් සමාගමෙහි පොල් වගාව ඇතුලත කජු වගාවට අමතරව රඹුටන්, කුරුඳු, ගම්මිරිස්, ඩ්‍රැගන් ෆෘට් යනාදිය අතුරු බෝගයන් ද වගාකර ඇත.

| වත්ත | කජු (හෙක්.) | ගම්මිරිස් (හෙක්.) | රඹුටන් (හෙක්.) | ඩ්‍රැගන් ෆෘට් (හෙක්.) | කුරුඳු (හෙක්.) | අන්නාසි (හෙක්.) | අඹ (හෙක්.) |
|---|---|---|---|---|---|---|---|
| තම්බපණ්නි | 399.25 | - | | - | - | - | - |
| මංගලඑළිය | 317.24 | | | - | - | - | - |
| බිංගිරිය | 20.00 | - | | 4.40 | 0.81 | - | - |
| නිකවැරටිය | 18.20 | | | - | - | - | - |
| හලාවත | 45.12 | - | | - | 1.6 | - | 1.6 |
| මාදම්පේ | 6.07 | - | | 3.64 | - | 0.4 | - |
| දිවුලපිටිය | - | 16.06 | 20.00 | 4.00 | 11.40 | - | - |
| පලුගස්වැව | - | - | | 0.50 | - | - | - |
| **එකතුව** | **805.88** | **16.06** | **20.00** | **12.54** | **13.81** | **0.4** | **1.6** |

**වර්ෂ 2019 දී අතුරු බෝග ආදායම**

| වත්ත | කජු (රු.) | ගම්මිරිස් (රු) | රඹුටන් (රු) | ඩ්‍රැගන් ෆෘට් (රු) | කුරුඳු (රු) | අන්නාසි (රු) |
|---|---|---|---|---|---|---|
| තම්බපණ්නි | 32,762,851.50 | - | - | 17,250.00 | - | - |
| මංගලඑළිය | 10,982,267.75 | - | - | - | - | - |
| බිංගිරිය | 459,840.00 | - | - | 717,720.00 | 157,813.00 | - |
| නිකවැරටිය | 445,060.00 | - | - | 1,840.00 | - | - |
| හලාවත | 801,920.00 | - | - | 13,875.00 | - | - |
| මාදම්පේ | - | - | - | 356,182.50 | - | 38,239.50 |
| දිවුලපිටිය | - | 239,715.00 | 500,000.00 | - | 501,000.00 | - |
| පලුගස්වැව | 665,088.00 | - | - | 82,686.50 | - | - |
| **එකතුව** | **46,117,027.25** | **239,715.00** | **500,000.00** | **1,189,554.00** | **658,813.00** | **38,239.50** |

## සත්ව පාලනය

### මී ගව පාලනය

පළුගස්වැව වත්තේ පවත්වාගෙන යනු ලබන මී ගව ව්‍යාපෘතියේ ලබා ගන්නා මී කිරි, මුදවපු මී කිරි හා යෝගට් බවට පත් කරමින් පලුගස්වැව වත්තේ හා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇති අලෙවි මධ්‍යස්ථාන තුළින් පාරිභෝගිකයින් වෙත උසස් ගුණාත්මයකින් යුතුව අලෙවි කිරීම කරනු ලැබේ.

## බැටළු පාලනය

සමාගමෙහි බිංගිරිය වතු කලාපයේ කිණියම හා මාදම්පේ වතු කලාපයේ හීම්මැලියාගාර යන වතු දෙකෙහි බැටළු පාලන ව්‍යාපෘතීන් දෙකක් ක්‍රියාත්මක අතර, එහි ප්‍රධාන ආදායම සතුන් ජීව බරට අනුව අභිජනන කටයුතු වලට අලෙවි කිරීම වේ. ඊට අමතරව සත්ව වසුරු කාබනික පොහොර ලෙස පොල් පැළ වගාවන්ට යොදා ගැනීම මත පසෙහි කාබනික සංඝටක ප්‍රමාණය වැඩි කිරීම සඳහා ද එය ඉවහල් වී ඇත.







| වත්ත | මී ගවයින් ගණන | බැටළුවන් ගණන |
|---|---|---|
| පලුගස්වැව | 187 | - |
| හලාවත | 12 | - |
| දිවුලපිටිය | 43 | |
| මාදම්පේ | 2 | 114 |
| බිංගිරිය | - | 587 |
| **එකතුව** | **244** | **711** |

**පතස් ප්‍රතිසංස්කරණය**

වර්ෂාවකදී පසට උපරිම ජල අවශෝෂණයෙන් පසුව මතුපිටින් ගලායන වැසි ජලය වත්ත ඇතුලත ගබඩාකර තබා ගනිමින් වියලි කාලයන්හිදී එම ගබඩා ජලය අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් සහ පාංශු උප ස්ථරයේ තෙතමනය රඳවා ගැනීමේ අරමුණු කොටගෙන බොහොමයක් වතු කොට්ඨාශයන්හි විවධ විශාලත්වයෙන් යුතුව පතස් පිහිටා ඇත. දීර්ඝ කාලයක සිට බොහොමයක් පතස් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් වර්ෂාවකදී එහි රඳන ජල ප්‍රමාණය ඉතා අල්ප වී ඇත. එබැවින් තෝරාගන්නා ලද වතු කොට්ඨාශ 8 ක පතස් 9 ක් කපා පිළිසකර කිරීමේ කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ කරන ලදී. එතුළින් පෙරට වඩා වැඩි ජල ප්‍රමාණයක් රඳවා ගැනීම අපේක්ෂා කරන අතර, වතුවල කෘෂිකාර්මික නවෝදය සඳහා ද එය ඉවහල් වනු ඇත.

**පාරිසරික සාධක වල බලපෑම්**

**වර්ෂාපතනය**

තාල වර්ගයට අයත් පොල් යන ශාකය වර්ෂය මුළුල්ලේ අඛණ්ඩ වර්ධනයක් සහිතව ඵල දරන තත්වයන් මත දේශගුණික සාධකයන්ගෙන් වාර්ෂික වර්ෂාපතනය ඉතාමත් වැදගත් සාධකයක් වේ. වර්ෂය මුළුල්ලේ ලැබෙන වර්ෂාපතනයත් සමඟ පස තෙත්ව තබා ගනිමින් මූල මණ්ඩලයට හිතකර පාංශු පරිසරයක් ගොඩනගා ගැනීමට ඉවහල් වේ. දිගු වියලි කාලගුණික තත්වයන් ඇති නොවී ක්‍රමිකව පතිත වන වර්ෂාපථනය දීර්ඝකාලයක් පසෙහි තෙතමනය රඳවා ගැනීමට ඉවහල් වේ.

**පරිසර උෂ්ණත්වය**

පරිසර උෂ්ණත්වය පොල් මල් පරාග වල ජෛවතාවයට සහ ඵල හටගැනීමට බලපානු ලබන ප්‍රධාන සාධකය වේ. පරිසර උෂ්ණත්වය ඉහල යාමත් සමඟ මල් පරාගනය සීමා වන අතර වාෂ්පී උත්ස්වේදනය ඉහලයාම මත පාංශු තෙතමනය අවම වීම සහ ගස් හි ප්‍රකෘති තත්වය බිඳ වැටීමකට ලක් වේ.

අපගේ සියළුම වතු අතරමැදි තෙත් හා වියලි දේශගුණික කලාපයන් තුළ පිහිටීම මත වාර්ෂිකව පවතින අයහපත් දිගු වියලි දේශගුණික තත්වයන්ට මුහුණ පෑමට සිදු වේ. එමෙන්ම සියළුම වතු වැසි ජලය මූලික ජල ප්‍රභවය ලෙස ගනිමින් පැවතීම ද අයහපත්ව වගාවට බලපා ඇත. මෙම තත්වයන් ප්‍රභාසංස්ලේෂණයට ද අයහපත් ලෙස බලපෑමෙන් එහි ප්‍රතිඵලයක් ලෙස අඩු පොල් නිෂ්පාදනයක් ලැබීම ද දක්නට ඇත.



### ජල සම්පාදනය සඳහා නව තාක්ෂණය එක් කිරීම

හලාවත වැවිලි සමාගම සතුව පොල් පැළ වගාවන්හි ජල අවශ්‍යතාවය වැසි ජලය මගින්ද, වියලි කාලයන්හිදී ජල සම්පාදනය ජල බවුසර් යොදා ගැනීම තුළින් සිදු කරනු ලැබේ. මෙම තත්වයෙන් මිදීම සඳහා නව තාක්ෂණය යොදා ගනිමින් ජල සම්පාදන ක්‍රම කෙරෙහි හලාවත වැවිලි සමාගම අවධානය යොමු කරන ලදී. ඒ අනුව පොල් පර්යේෂණ ආයතනය නිර්දේශිත, නඩත්තුව හා හැසිරවීම ඉතාමත් පහසු ජල සම්පාදන ක්‍රමයක් වන නල ජල සම්පාදන ක්‍රමය ක්‍රමිකව පොල් පැළ වගාවන් සඳහා ස්ථාපිත කිරීමට මූලික කටයුතු කරනු ලැබීය. ඒ අනුව භූගත ජල ප්‍රභවයක් ඇති හලාවත වතු කලාපයේ නව වගාවක් ලෙසට අක්කර 75 ක භූමියක ස්ථාපිත කොට ඇති සීනුගල වත්තේ පොල් පැළ වගාව ආදර්ශයක් ලෙසට යොදා ගන්නා ලදී. එහිදී මූලික අදියර ලෙසට අක්කර 05 ක් ආවරණය වන පරිදි ජල සම්පාදන පද්ධතියක් 2018 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබීය. එය තවදුරටත් පුළුල් කිරීම යටතේ 2019 වර්ෂයේදී තවදුරටත් අක්කර 15 ක පමණ කොටසක ජල නල එළීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කොට අවසන් කර ඇත.

මීට අමතරව පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ආරම්භකර ඇති කිණියම ''කප්රුවන'' බීජ පොල් උයන සඳහාද නල ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපිත කිරීමට පොල් පර්යේෂණ ආයතනය කටයුතු කරනු ලැබූ අතර, එතුළින් ආවරණය වන සමස්ථ පොල් පැළ යටිවගා ප්‍රමාණය අක්කර 143 ක් පමණ වේ.

### අත්පරාගනය මගින් ජානමය වැඩිදියුණු කරන ලද බීජ පොල් නිෂ්පාදනය

පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණික සහයෝගය ඇතිව පලුගස්වැව වත්තේ වර්ෂ 2012 දී ආරම්භ කරන ලැබූ අත්පරාගනය මගින් CRISL 98 යන වැඩිදියුණු කරන ලද පොල් ප්‍රභේදය නිපදවීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන අතර, මේ සඳහා ඉහළ ඵලදායිතාවයකින් හා උසස් ලක්ෂණ වලින් යුක්ත උස ප්‍රභේදයට අයත් පොල් ගස් තෝරා එම ගස් පොල් පර්යේෂණ ආයතනයෙන් ලබාගන්නා සැන්රාමන් පරාග සමඟ මුහුම් කිරීමේ ක්‍රියාවලිය තුළින් ඉහත පොල් ප්‍රභේදය නිපදවනු ලැබේ. ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේ සිට මේ දක්වා නිෂ්පාදිත බීජ පොල් ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | බීජ පොල් නිෂ්පාදනය (ගෙඩි) |
|---|---|
| 2012 සිට 2018 දක්වා | 77,233 |
| 2019 | 5,846 |
| **එකතුව** | **83,079** |



**කිණියම ''කප්රුවන'' බීජ පොල් උයන**

වර්ෂ 2012 දී පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමකට අනුව ස්වාභාවික පරාගනයට ඉඩ ලබාදෙමින් කිණියම ''කප්රුවන'' බීජ පොල් උයන ස්ථාපිත කර ඇත. මෙය කප්රුවන ප්‍රබේදයට අයත් බීජ පොල් නිෂ්පාදනය අරභයා කිණියම බීජ පොල් උයන ස්ථාපිත කර ඇත. ස්වාභාවික පරාගන ක්‍රියාවලියකට යටත්ව බීජ පොල් නිෂ්පාදනයට ඉඩ ප්‍රස්ථාව ලබාදී ඇතත් විවිධ අවස්ථාවන්හිදී බලපානු ලැබූ විවිධ පාරිසරික ගැටළු හේතුවෙන් සමස්ථ වගාවම පරිනත අවධියට පත්වී නොමැතිකම හේතුවෙන් 2019 වර්ෂයේදී හොඳින් වැඩී ඇති හා ඵලදරා ඇති කුන්දිරා ගස් 200 ක් පමණ තොරාගෙන එම බීජ පොල් උයන තුළද අත්පරාගන කටයුතු ආරම්භ කර ඇත.

### අගය එකතු කළ නිෂ්පාදන

### කජු පිරිසැකසුම

හලාවත වැවිලි සමාගම අගය එකතු කිරීමේ නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කරමින් කජු පිරිසැකසුම් කොට අලෙවි කිරීමේ කටයුතු ඉතා සාර්ථකව සිදුකරමින් පවතී. 2019 වර්ෂය වනවිට අලෙවි ජාලය පුළුල් කරමින් රටෙහි විවිධ ප්‍රදේශයන්හි සුහසාධක සංගම් මගින් සහ විවිධ රාජ්‍ය ආයතන මට්ටමින් අලෙවි කිරීමේ කටයුතු සඳහා යාන්ත්‍රනයක් සකසා ඒ අනුව නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. මූලික ආරම්භයේදී තම්බපණ්නි වත්ත තුළ ස්ථාපනය කරනු ලැබූ මෙම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය කළමනාකරණය කිරීමේ පහසුව වෙනුවෙන් එම මධ්‍යස්ථානය පලුගස්වැව වත්තේ නැවත ස්ථාපිතකර ඇත. එම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය මගින් 2019 වර්ෂයේදී පිරිසැකසුම් කරන ලද කජු කිලෝ ග්‍රෑම් 4,282 ක් ලෙසට සටහන් වේ.



### පොල් තෙල් නිෂ්පාදනය

නිෂ්පාදන විවිධාංගීකරණ ක්‍රියාවලිය යටතේ පලුගස්වැව වත්ත තුළ වර්ෂ 2012 දී ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘතියක් වශයෙන් ගෘහස්ථ පොල් තෙල් (නැඹුල් පොල් තෙල්) නිෂ්පාදනය දැක්විය හැකිය. ඉහළ ගුණාත්මයකින් යුතුව පාරිභෝගිකයා හට සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදනයක් ලෙසට  මේ වන විට පාරිභොගික විශ්වාසය ජයගෙන ඇත. තවමත් සුළු පරිමාන ව්‍යාපාරයක් ලෙසට ක්‍රියාත්මක වන පොල් තෙල් නිෂ්පාදනය ඉදිරියේදී යන්ත්‍ර සූත්‍රවල උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉල්ලුමට ප්‍රමාණවත් සැපයුමක් ලබාදීම අප අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේ සිට වර්ෂ 2019 දක්වා කාලය ඇතුලත පොල් තෙල් ලීටර් 50,000 ක ප්‍රමාණයක් සකසා පාරිභෝගික ජනතාව වෙත අලෙවි කිරීමට ද අප කටයුතු කර ඇත.









වාර්ෂික පිරිත් දේශනාව හා දානමය පූජෝත්සවය



කොළඹ කාර්යාලය ජනතා වතු සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම




ජාතික පොල් දින සැමරුමට සමගාමීව පොල් පැල සිටුවීමේ ව්‍යාපෘතිය






පොසොන් පොහොය නිමිත්තෙන් දන් සැල් පැවැත්වීම





ජගත් පරිසර දින සැමරුමට සමගාමීව දැදුරු ඔය ඉවුර දෙපස පිරිසිදු කිරීම හා පැළ සිටුවීම

### තිරසාරත්වය

#### තිරසාරත්වය පිළිබඳ සමාලෝචනය

වැවිලි සමාගමක් වශයෙන් ඇති ජෛව සම්පත් නොනැසී පවත්වා ගනිමින් ඵලදායිව එම සම්පත් කළමනාකරණය කරගැනීම සහ හැසිරවීම තිරසාරත්වය ලෙස අපට හැඳින්විය හැක. පරිසර සංරක්ෂණය, සමාජීය වගකීම් හා ආර්ථික ප්‍රතිපත්ති මෙහි උදාර අරමුණු වේ. එම අරමුණු එක ලෙස සාමූහිකව හැසිරවීම මත සමාගමේ භෞතික, ආර්ථිකමය හා සමාජීයව තිරසාරත්වය ගොඩනැගෙනු ඇත. හලාවත වැවිලි සමාගම කෘෂිකාර්මික පරිසරයක් පදනම්ව ගොඩනැගී ඇති බැවින් පාරිසරික තුලනය හා පරිසර පද්ධති සංරක්ෂණය කෙරෙහි ප්‍රමුඛස්ථානය ලබා දී ඇත.

පරිසර පද්ධති සංරක්ෂණය කරමින් ගොඩනැගෙන්නා වූ ආර්ථික ප්‍රතිලාභයන් අන්‍යෝන්‍ය සමාජීය බැඳීම මත හලාවත වැවිලි සමාගමෙහි වතු ආශ්‍රිතව වෙසෙන බොහෝ සාමාජිකයින් හට එම ප්‍රතිලාභ අත්කර දීමට අප සමත් වී ඇත්තෙමු.

#### තිරසර කෘෂිකර්මය

ඉඩම් හෙක්ටයාර් 5,733.23 ක් හලාවත වැවිලි සමාගමෙහි පරිපාලනයට යටත්ව පාලනය වන අතර, එහිදී ප්‍රධාන වගාව ලෙසට පොල් වගාව පවත්වා ගනිමින් ජෛව සම්පත් විවිධාංගීකරණය කිරීම තුලින් භූමිය උපරිම ලෙස භාවිතා කිරීමට අප සමත් වී ඇත. එහිදී පොල් යටි වගාවන් ස්ථාපිත කිරීම, අතුරු බෝග වගා කිරීම, සත්ව පාලනය සිදු කිරීම වැනි දෑ සඳහා ප්‍රමුඛස්ථානය ලබා දී ඇත. වර්ෂ 2008 දී 6% ක අනුපාතයක පැවති පොල් යටි වගාවන් ප්‍රමාණය 2019 වර්ෂ අවසානයේදී ඵලදරණ වගාවට සාපේක්ෂව 27.52 % ක් වේ.

තවදුරටත් සත්ව පාලනය ව්‍යාප්ත කිරීම, අහිතකර කාලගුණික තත්වය මත හානි වන පැළ නැවත සිටුවීම, නයිට්‍රජන් තිරකාරක ශාක සිටුවීම වැනි ක්‍රියාකාරකම් මත ජෛව ගහණය වැඩි කරමින් සුවිශේෂි පරිසරයක් අඛණ්ඩව ගොඩනැගීම මත ඒකක නිෂ්පාදන පිරිවැය ද අවමකර ගැනීමට අප කටයුතු කර ඇත.

#### පාංශු ජෛවීය ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම

තිරසර පරිසරයක් ගොඩනැගීමෙහිලා රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර ආදේශ කරමින් කාබනික පොල් වගාවන් පාලනය, පාංශු වයනය හා ව්‍යුහය ගුණාත්මකව ඉහල නැංවීම සඳහා ශුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමෙහිලා සත්ව වසුරු පැළ වගාවන් වෙත යෙදීම, ජල සංරක්ෂණ ක්‍රමෝපායන් අනුගමනය කිරීම, ජල සංචායක ස්ථාපිත කිරීම මත මතුපිට ජලය සංරක්ෂණය, ආවරන බෝග මගින් පසෙහි කාබනික ජෛව ස්කන්ධය වැඩි කිරීම, ග්ලිරිසීඩියා වැනි ශාක මගින් වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීම වැනි දෑ තුලින්ද ඉඩම්හි ඵලදායිතාවය හා එහි තිරසාරත්වය තහවුරු කර ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට ගරුකරමින් හා අනුගත වෙමින් වර්ෂ කිහිපයක සිටම ජෛව හායනය නොවන බැරලෝහ අඩංගු වල් නාශක භාවිතයෙන් වැලකීමට අප ක්‍රියාකර ඇති අතර, ඒ සඳහා

1. වල් නාශක භාවිතය වෙනුවට ක්‍රමාණුකූලව සිදුකරන යාන්ත්‍රික වල් මර්ධනය, වගා ක්ෂේත්‍රය සී සෑම, පියුරේරියා වැනි ආවරණ බෝග ව්‍යාප්ත කිරීම හා ක්ෂේත්‍රය තුල සත්ව පාලනය සිදු කිරීම,
2. පොල් පැළ වගාව සඳහා තර්ජනයක් ඇති කරනු ලබන රතු කුරුමිණි හානිය වැලැක්වීමට පෙරමෝන උගුල් ස්ථාපිත කිරීම,
3. සමෝධානික ක්‍රම මගින් වගා ක්ෂේත්‍රය පිරිසිදුව තබා ගැනීම, පොල් මයිටා හානිය උග්‍රව ඇති හඳුනාගන්නා ක්ෂේත්‍රයන් වෙත පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන් විලෝපීය මයිටාවන් ක්‍රමාණුකූලව නිකුත් කිරීම, වැනි දෑ දැක්විය හැකිය.

#### කාබනික ද්‍රව්‍ය පොහොර ලෙස භාවිතය හා චක්‍රීකරණය

පෝෂක ඌනතාවයන් සඳහා සිදුකරන එකම ආදේශකය ලෙස සෘජුවම රසායනික පොහොර යෙදීම වෙනුවට රසායනික පොහොර සමග කාබනික පොහොර යෙදීමද හලාවත වැවිලි සමාගම වර්තමානයේදී සිදුකරන ක්‍රියාවකි. එතුලින් යම්තාක් දුරට පසෙහි ජෛවීය සාධක නොනැසී පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. හලාවත වැවිලි සමාගමෙහි පළුගස්වැව වත්ත තුල සිටින මී ගවයින්ගේ ගොම එම වත්තේම පොල් පැළ සඳහා කාබනික පොහොර ලෙසද, කිණියම, ආඩිගෙදර හා හීම්මැලියාගාර වතු වල සිටින බැටළුවන්ගේ වසුරු එම වතු වල ඇති පොල් පැළ වගාවන් වෙත රසායනික පොහොර වලට අමතරව යෙදීම කරනු ලැබේ.

රසායනික පොහොර සමග කාබනික ද්‍රව්‍ය එක් කිරීම තුලින් පාංශු වයනය දියුණු වීම මත හා පාංශු තෙතමනය සංරක්ෂණය වීම මත පෝෂක ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් පසෙහි අභ්‍යන්තරයට කාන්දුවීම වලක්වා මතුපිට රඳවා ගැනීමට සමත්වේ. එමගින් සිදුකරන ආයෝජනය වඩාත් ඵලදායි වේ. විශේෂයෙන් පොල් ශාකය අඛණ්ඩ නිෂ්පාදනයක් සහිත වර්ධනයක් පෙන්නුම්කරනු ලැබීම මත පාංශු පෝෂක විශාල ප්‍රමාණයක් එම ක්‍රියාවලිය වෙනුවෙන් අවශෝෂණය කරනු ලැබේ. එම අවශෝෂණය කරනු ලබන පෝෂක නැවත එම ශාකයටම ලබාදීම වස් වියලී වැටෙන්නා වූ පොල් අතු වසුන් ලෙස යෙදීම හා පොල් ලෙලි වසුන් ලෙස හා පොල් ලෙලි වලවල් ලෙස වගා ක්ෂේත්‍රයේ තැන්පත් කිරීම කරනු ලැබේ. 2019 වර්ෂයට අදාලව පහත පරිදි පොල් අතු වසුන් යෙදීම හා පොල් ලෙලි වැලලීම කර ඇත.

| වතු කලාපය | පොල් අතු වසුන් යෙදීම (ගස්) | පොල් ලෙලි වසුන් යෙදීම (ගස්) | පොල් ලෙලි වැලලීම (වලවල්) |
|---|---|---|---|
| හලාවත | 78,495 | 717 | 750 |
| බිංගිරිය | 47,118 | 2,447 | 1,793 |
| නිකවැරටිය | 37,875 | - | - |
| දිවුලපිටිය | 90,855 | 2,903 | - |
| මාදම්පේ | 82,422 | 5,599 | - |
| පළුගස්වැව | 44,552 | 560 | 1,703 |
| තම්භපණ්නි | 36,232 | 720 | 500 |
| මංගලඑළිය | 18,254 | 20 | - |
| මුළු එකතුව | **435,803** | **12,966** | **4,746** |

**ජෛව පද්ධති සංරක්ෂණය**

හලාවත වැවිලි සමාගම සතුව සංරක්ෂණය කරනු ලබන ජෛව සම්පතක් ලෙස අක්කර 50 ක පමණ වපසරියක් ඇති මාවතගම වන ලැහැබ, අක්කර 10 කින් පමණ සමන්විත ගල්කන්ද වන ලැහැබ දැක්විය හැකිය. මෙම වන පද්ධති තෙත් කලාපීය පරිසර පද්ධතියක ස්වරූපයක් පෙන්නුම්කරන අතර, එය දීර්ඝ කාලයක සිට ජෛව විවිධත්වය සංරක්ෂණය උදෙසා ආරක්ෂා කරමින් සිටින අතර, එය තිරසර ඉඩම් කළමනාකරණය මනාවට පෙන්නුම්කරනු ලැබේ.

ඊට අමතරව බොහොමයක් වතු කොට්ඨාශයන් ඇතුලත විවිද විශාලත්වයෙන් යුතු පතස් පවතින අතර, එතුළින් බොහොමයක් පතස් ජෛව සංරක්ෂණ පද්ධති ලෙසට සැකසී ඇත. එබැවින් එවැනි පද්ධති නොනැසී පවත්වා ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි.

**දැවමය වගාව කළමනාකරණය**

හලාවත වැවිලි සමාගම වතු ඒකක 85 කින් සමන්විත අතර, එම සමස්ත වතු ඒකකයන් තුල විවිධ විශේෂයන්ට හා වර්ධන අවධීන්ට යටත් දැවමය ගස් 22,000 ට වැඩි ප්‍රමාණයක් ඇත. බොහොමක් වගාවන් වතු මායිම් අවට ඇතත් කාලයත් සමග දැව වගාව වතු අභ්‍යන්තරයට වැඩී ඇති ස්ථානයන් හඳුනාගෙන ඇත. එවැනි ස්ථාන දැවමය වගාවන් සහිත භූමින් ලෙස හඳුනාගනිමින් කළමනාකරණය කරන අතර, කාලාණුරූපීව ගස් වල වර්ධනයත් සමඟ නිසි අවසරයන් හා සැලැස්මක් මත හෙළීම කරනු ලැබේ. ඊට අමතරව කාසමඩු වත්ත, තම්භපණ්නි වත්ත වැනි වතු වල තේක්ක ගහනය වැඩි කිරීමෙහිලා තේක්ක වගාව හෙක්ටයාර් 12 ක නැවත ආරම්භ කිරීමටද අප සමත් වී ඇත.

පරිසර කළමනාකරණයේදී හලාවත වැවිලි සමාගම විසින් ජෛව සම්පතක් වන වන වගාව ක්‍රමාණුකූලව අදියරෙන් අදියර ව්‍යාප්ත කරමින් පවතී. වන වගාව කළමනාකරණය කරමින් එහි සම්පත් භාවිතා කිරීම උදෙසා හලාවත වැවිලි සමාගම විසින් වර්ෂ 2019 දී "පස් වසරක වන කළමනාකරණ සැලැස්මක්" සකසා ඒ අනුව දැව ගස් හෙලීමට සහ නැවත වන වගාව සිදු කිරීමට ප්‍රායෝගික සැලැස්මක් සකසා අවසන්කර එය ක්‍රියාත්මක කරමින් පවතී. එම සැලැස්ම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරදී ද ඇත..

**තිරසර නිෂ්පාදන**

හලාවත වැවිලි සමාගම වසර කිහිපයක් සිට අගය එකතුකරන ලද භාණ්ඩ ප්‍රාදේශීය වෙළෙඳ පොල තුල අලෙවියට යොමු වී ඇත. එහිදී පළුගස්වැව උසස් කොප්පරා මගින් නිෂ්පාදිත "පළුගස්වැව පොල් තෙල්" හා පිරිසැකසුම් කරන ලද "තම්බපණ්නි කජු" හා පළුගස්වැව වත්තේ නිෂ්පාදිත මී කිරි හා යෝගට් දැක්විය හැකිය. මෙතුලින් උසස් තත්වයේ නිෂ්පාදන පාරිභෝජනය කිරීමේ හැකියාව රටෙහි මහජනතාව වෙත අප විසින් උදාකර දී ඇත. තවදුරටත් වෙළෙඳ ප්‍රජාව වෙත අපගේ නිෂ්පාදන සමීප කරවීම උදෙසා විවිධ ආයතන වල සුහසාධක සංගම් මගින් බෙදා හැරීම හා කොළඹ අලෙවි කුටිය මගින් අලෙවි කිරීම කරනු ලබයි. ඒ මගින් මහජනතාව නිෂ්පාදන සඳහා වැය කරන්නා වූ මුදලට උසස් ගුණාත්මයකින් යුතු නිෂ්පාදන බෙදා හැරීම අපගේ අරමුණ වේ.

**කාබන් පිය සටහන**

හලාවත වැවිලි සමාගමෙහි ඍජු හා වක්‍රාකාර ක්‍රියාකාරීත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස කාබන් ඩයොක්සයිට් හෝ ඒ හා සමාන ඒකකයන්ගේ නිෂ්පාදනය අවම කිරීමෙහිලා අරමුණු කරමින් කටයුතු යොදන බව දැක්වීමට කැමැත්තෙමු. අවම කාර්යක්ෂමතාවයක් ඇති යන්ත්‍රෝපකරණ වෙනුවට කාර්යක්ෂමතාවය ඉහල, නව යන්ත්‍රෝපකරණ ලබා දීම, අනවශ්‍ය පරිදි රථ වාහන ධාවනය නොකිරීම, වියෝජණය වන කාබනික ද්‍රව්‍ය නැවත පසට ප්‍රතිචක්‍රීකරණය වීමට ඉඩ හැරීම, සේවකයින්ගේ ආකල්ප හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම මත ඒකක

ඵලදායිතාවය වැඩි කිරීම හා ඒ සඳහා වැයකරනු ලබන සම්පත් භාවිතය අවම කිරීම වැනි දෑ තුලින් හලාවත වැවිලි සමාගම සාමූහිකව කාබන් පියසටහන අවම කිරීමට දායක වී ඇත.

**සේවක හා සමාජීය සම්බන්ධතා**

**සේවක ප්‍රතිලාභ**

හලාවත වැවිලි සමාගම සෑම විටම සේවකයින්ගේ ආකල්ප ඉහල නංවා ඔවුන්ට අත්කර දෙනු ලබන ප්‍රතිලාභ කෙරෙහි වඩාත් උනන්දුවෙන් පසුවන ආයතනයක් ලෙස හැදින්විය හැකිය. ආයතනයක වටිනාම සම්පත මානව සම්පත ලෙස හඳුනාගනිමින් කාර්යය සාධනය මත පදනම්ව 2019 වර්ෂයේදී සාම්ප්‍රදායිකව හලාවත වැවිලි සමාගම විසින් තම සේවකයින් වෙත පිරිනමන සේවක දිරි දීමනාව ලබා දීමට හැකිවිය. ඊට අමතරව සෑම මසකම නාමික මිලකට පොල් නිකුත් කිරීම, සියළුම සේවකයින් රක්ෂණය කිරීම හා රක්ෂණ වන්දි ගෙවීම, අඩුපොළී අනුපාත යටතේ ආපදා ණය ලබාදීම, වතු සේවකයින්ගේ වාර්ෂික විනෝද චාරිකාව සඳහා අනුග්‍රහය ලබා දීම දැක්විය හැකිය.

මෙය මානව සම්පත් කළමනාකරණ උපයාමාර්ග සේවක අභිප්‍රේරණය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර, සමාගමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා සමාගම කෙරෙහි ඇති බැඳියාව වර්ධනය වීම කෙරෙහි හේතු වී ඇත.

**වතු යටිතල පහසුකම් දියුණු කිරීම**

සෑම විටම සේවකයින්හට යහපත් සෞඛ්‍ය තත්වයක් මත සේවය කිරීමට සුදුසු පරිසරයක් ගොඩනැගීමෙහිලා හලාවත වැවිලි සමාගම කැප වන අතර, විශේෂයෙන් වතු සේවකයින් හට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. එය පහත පරිදි දැක්විය හැක.

**සමාජීය වගකීම්**

හලාවත වැවිලි සමාගම නිරන්තරයෙන් බාහිර පාර්ශව සමග සහජීවන සම්බන්ධතා ගොඩනගමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබයි. සමාගම සතු සම්පත් සමාජීය සුභ සිද්ධිය උදෙසා තම ජීවන තත්වය ගොඩනංවා ගැනීම වෙනුවෙන් පරිහරනය කිරීමට අවස්ථාව ලබා දී ඇත. සමාගම සතු ඉඩම් බොහොමයක් සඳහා වතු අවට සිටින අඩු ජීවන තත්වයක් පෙන්නුම් කරනු ලබන ගොවීන්ට අයත් කිරි ගවයින්ට අවශ්‍ය තණකොළ උලාකෑමට අවස්ථාව ලබා දී ඇත. එතුලින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහල යාමත් සමග රටෙහි සමස්ථ කිරි නිෂ්පාදනය ඉහල නැංවීමට අප දායක වෙමින් පවතී. සතුන්ගේ උලාකෑම තුලින් වල් මර්දනය වීම, මළ ද්‍රව්‍ය එක් වීම හේතුවෙන් පසෙහි කාබනික සංයුතිය වැඩි වීම වැනි ප්‍රයෝජනවත් දෑ වක්‍රාකාරව සමාගමට වාසි ලෙසට අත් වේ.

අමතරව වාර්ෂිකව වෙහෙර විහාර, සිද්ධස්ථාන මගින් ඉල්ලුම්කරනු ලබන බොහෝ පහසුකම් අප සම්පාදනය කරන අතර, එහිදී අවශ්‍ය කටයුතු වෙනුවෙන් දැවමය ගස් ලබාදීම, මූල්‍යාධාර ලබා දීම, විවිධ පන්සල් හා දේවාල පෙරහැර වෙනුවෙන් කොප්පරා ලබා දීම මගින් ඒ සඳහා සමාගම අනුග්‍රාහකත්වය ලබාදීම මෙන්ම රටෙහි ඇතිවන්නා වූ ව්‍යවසනයන්දී ඒ සඳහා ක්‍රියාකාරීව සහන සැලසීම වෙනුවෙන් කටයුතු කරනු ලබයි.

වැවිලි සමාගමක් ලෙස අප පාරිසරික, සමාජීයව හා ආර්ථික සංතුලනය තුලින් තිරසර සංවර්ධනයක් අත්කර ගැනීම, ආර්ථිකමය ඵලදායි කෘෂිකාර්මික කටයුතු වල නියැලෙමින් සමස්ථ සේවකයින්ගේ අභිප්‍රායන් ඉෂ්ඨ කරමින් රටෙහි සංවර්ධනයේ කොටස්කරවෙකු වශයෙන් දායක වීමට හලාවත වැවිලි සමාගම කෘෂි ව්‍යාපාර සමාගමක් ලෙස ඉදිරියට ගමන් කිරීම අපගේ ඒකායන අපේක්ෂාව වේ.



## මූල්‍ය සමාලෝචනය

වාර්ෂික වාර්තාවේ කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය තත්වය හා මූල්‍ය ප්‍රගතිය පිළිබිඹු කරයි. මූල්‍ය සමාලෝචනය මගින් සමාගමේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව දළ විශ්ලේෂණයක් සාකච්ඡාවට භාජනය කරනු ලබයි.

බාහිර පාරිසරික සාධක වල අහිතකර බලපෑම් හේතුවෙන් වාර්තා කරන මූල්‍ය වර්ෂය හලාවත වැවිලි සමාගමට අභියෝගාත්මක වර්ෂයක් විය. පොල් සඳහා අඩු ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිලක් වාර්තා වීම හා කෘෂි කාර්මික කටයුතු සඳහා අහිතකර පාරිසරික සාධකයන්ගේ බලපෑම් ඇති වීම ඒ අතර විය. එවැනි අහිතකර බලපෑම් මධ්‍යයයේ වුවද 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය තුලදී හොඳ මූල්‍ය තත්වයක් අත්කර ගැනීමට සමාගමට හැකි විය.

### සමාගමේ මූල්‍ය ප්‍රගතිය ලුහුඩින්

| අයිතමය | 2019 | 2018 | විචලනය (2017-2018) | | |
|---|---|---|---|---|---|
| | | | | % | ප්‍රධාන සාධකය |
| පොල් ගෙඩි (මිලි.) | 14.9 | 8.1 | 6.8 | 84% | |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය (රු.) | 25/= | 36/= | (11) | (30%) | |
| | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | | |
| අයභාරය | 445 | 350 | 95 | 27% | අස්වැන්න වැඩි වීම |
| විකුණුම් පිරිවැය | 356 | 350 | 6 | 2% | |
| අනෙකුත් ආදායම් | 94 | 72 | 22 | 31% | විවිධ ආදායම් වැඩි වීම |
| පරිපාලන වියදම් | 93 | 86 | 7 | 8% | 2018 වර්ෂයේ දී සේවක කාර්ය සාධන දිරි දීමනාව නොගෙවීම |
| මූල්‍ය ආදායම් | 11 | 15 | (4) | (26%) | කෙටි කාලීන තැම්පතු අඩු වීම සහ කෙටි කාලීන තැන්පතු මත පොළී ප්‍රතිශතය අඩුවීම |
| මූල්‍ය පිරිවැය | 40 | 36 | 4 | 11% | දළ දේශීය නිෂ්පාදන අවධමනකයේ වෙනස් වීම හේතු කොටගෙන ජනවසම කල් බදු පොළී වැඩි වීම. |

### අයභාරය

ප්‍රවර්තන වර්ෂය තුලදී පසුගිය වර්ෂයට සාපේක්ෂව 27% ක වර්ධනයක් සහිතව රුපියල් මිලියන 445 ක අයභාරයක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. 2018 වර්ෂයට සාපේක්ෂව පොල් මිල 30% කින් පහත වැටුන ද ප්‍රවර්තන වර්ෂයට තුල පොල් හා කජු අස්වැන්නේ වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

අයභාරයෙහි සංයුතිය පහත පරිදි වේ.

| | 2019 රු.මිලි | 2018 රු.මිලි |
|---|---|---|
| පොල් | 348 | 291 |
| කජු | 46 | 24 |
| සත්ත්ව පාලනය | 23 | 17 |
| අනෙකුත් භෝග හා ව්‍යාපෘති | 28 | 18 |
| | **445** | **350** |

### දළ ලාභය

2018 වර්ෂයේ පැවති රු. 207,522 ක අලාභයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුලදී සමාගම රු. මිලියන 89 ක දළ ලාභයක් වාර්තා කර ඇත.

### දළ ලාභය විශ්ලේෂණය

රු. මිලියන 65 ක දළ ලාභයක් උපයමින් දළ ලාභය තුල ප්‍රධාන දායකත්වය පොල් වලින් ලැබී ඇති අතර එය මුලු දළ ලාභයෙන් 73% කි. දළ ලාභයෙන් 17% ක ප්‍රතිශතයක් කජු වගාවෙන් උපයා ඇති අතර එය රුපියල් මිලි. 15 කි. වෙනත් ප්‍රභවයන් මගින් උපයා ඇති දළ ලාභය රුපියල් මිලි. 9 ක් වන අතර 10% ක ප්‍රතිශතයක් නියෝජනය කරයි.

### දළ ලාභය

| | 2019 රු.මිලි | 2018 රු.මිලි |
|---|---|---|
| පොල් | 65 | (3) |
| කජු | 15 | (2) |
| සත්ත්ව පාලනය | 2 | 2 |
| අනෙකුත් භෝග හා ව්‍යාපෘති | 7 | 3 |
| | **89** | **(.2)** |

2019 වර්ෂයේ දී පොල් දළ ලාභ අනුපාතිකය 18.6% ක් හා කජු 33% ක් විය.

### බදු පෙර ලාභය

2018 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලි. 35 ක බදු පෙර අලාභයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුල රුපියල් මිලි. 61 ක බදු පෙර ලාභයක් උපයා ඇත.

## පොල් ක්ෂේත්‍රය

හලාවත වැවිලි සමාගම පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇති වතු කලාප 8 ක් යටතේ කළමනාකරණය කරනු ලබන, පොල් වගා හෙක්. 3804.94 ක පොල් වගාවකින් සමන්විත වැවිලි සමාගමකි.

දැනට හෙක්ටයාර 814.19 ක පොල් පැල වගාවක් පවතින අතර එය මුළු පොල් වගා ප්‍රමාණයෙන් 22% කට සමාන වේ.

2018 වර්ෂයේ වාර්තා වූ පොල් ගෙඩි මිලියන 8.1 ට සාපේක්ෂව 84% ක වර්ධනයක් සහිතව ප්‍රවර්තන වර්ෂය තුලදී හලාවත වැවිලි සමාගම ගෙඩි මිලියන 14.9 ක පොල් නිෂ්පාදනයක් ලබා ගෙන ඇත. කෙසේ වෙතත් පොල් ගෙඩියක ශුද්ධ සාමාන්‍ය විකුණුම් මිල (NSA) 2018 වර්ෂයේ පැවති රු.36/- සිට 2019 වර්ෂය තුලදී රු. 25/- දක්වා 30% අඩුවීමක් වාර්තා වේ.







### පොල් නිෂ්පාදන පිරිවැය හා විකුණුම් පිරිවැය

| | 2019 රු.මිලි | 2018 රු.මිලි |
|---|---|---|
| නිෂ්පාදන පිරිවැය | **306** | **290** |
| ආරම්භක තොග ගැළපුම් | 29 | 33 |
| අවසාන තොග ගැළපුම් | (51) | (29) |
| **විකුණුම් පිරිවැය** | **284** | **294** |

2018 වර්ෂයේ පැවති රුපියල් මිලි. 290 ට සාපේක්ෂව 2019 වර්ෂයේ දී නිෂ්පාදන පිරිවැය රුපියල් මිලි. 306 ක් දක්වා රු. මිලි. 16 කින් වැඩි වී ඇත. කෙසේ වෙතත් නිෂ්පාදන පිරිවැය මත ආරම්භක තොග හා අවසන් තොග ගැලපීමෙන් පසු 2019 වර්ෂය සඳහා විකුණුම් පිරිවැය රු. මිලි. 284 ක් විය.

පොල් නිෂ්පාදන පිරිවැය වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක පහත පරිදි වේ.

- 2018.10.01 දින සිට පඩිපාලක සභා මගින් කම්කරු වැටුප් සංශෝධනය කිරීම හේතුවෙන් 2018 වර්ෂය වෙනුවෙන් දැරූ රුපියල් මිලි.114.1 ක කම්කරු වැටුප 2019 වර්ෂය තුලදී රුපියල් මිලි.140.6 ක් දක්වා 23% කින් වැඩි වී ඇත.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ හා සාමුහික ගිවිසුම් වලට අනුව වාර්ෂික වැටුප් වැඩිවීම හේතුවෙන් වතු කළාප විධායක හා විධායක නොවන සේවක වැටුප් රු. මිලි.3.1කින් ඉහළ ගොස් ඇත.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 19, පාරිතෝෂික ආයු ගණනයට අනුව රු. මිලියන 5 ක් නිෂ්පාදන පිරිවැයට ගැළපුම් කර ඇත.
- වර්ෂය තුලදී නොමේරූ වගා වෙනුවෙන් දරන ලද සෘජු පිරිවැය අඩු වීම හේතුවෙන් මේරූ වගා වලට අන්තර්ග්‍රහණය කරන ලද පොදු කාර්ය පිරිවැය රු. මිලි. 8 කින් ඉහල යාම. (මේරූ, නොමේරූ වගා වෙත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ මේරූ, නොමේරූ වගා වෙනුවෙන් සෘජු පිරිවැය දරන ලද ප්‍රතිශතය පදනම් කරගනිමිනි).
- 2018 වර්ෂයේ පොහොර යෙදීම වෙනුවෙන් දරන ලද පිරිවැය වූ රු. මිලියන 32 ට සාපේක්ෂව 2019 වර්ෂය තුල දී රු. මිලියන 5.5 ක් දක්වා අඩු වී ඇත. 2019 වර්ෂයේ පැවති අහිතකර සාධක හේතුවෙන් සීමිත ප්‍රදේශයකට පමණක් පොහොර යෙදීම මීට හේතු විය.



### කජු වගාව

හලාවත වැවිලි සමාගම හෙක්ටයාර 757.91 ක ඵල දරන කජු වගාවක් පවත්වගෙන යන අතර 2018 වර්ෂයේ ලබා ගන්නා ලද කිලෝ ග්‍රෑම් 91,196 ක කජු අස්වැන්නට සාපේක්ෂව 2019 වර්ෂය තුලදී කිලෝ ග්‍රෑම් 151,542 ක කජු අස්වැන්නක් ලබා ගෙන ඇත. එය හලාවත වැවිලි සමාගමේ ඉතිහාසය තුල වාර්තා කල ඉහළම කජු අස්වැන්නයි.

2018 වර්ෂයේ කජු අලෙවියෙන් උපයන ලද රුපියල් මිලියන 24 ක අයභාරයට සාපේක්ෂව 2019 වර්ෂයේ දී රු. මිලියන 46 ක අයභාරයක් හා රු. මිලියන 15 ක ලාභයක් කජු වගාවෙන් උපයා ඇත.

### අනෙකුත් වගා සහ ව්‍යාපෘති

සමාගම ප්‍රධාන අතුරු බෝග ලෙස ඩ්‍රැගන් ෆෲට්, කුරුඳු, රඹුටන් සහ ගම්මිරිස් යන වගාවන් ස්ථාපිත කර ඇත. පලුගස්වැව වතු කලාපයේ නිෂ්පාදිත ඉහළ ගුණත්වයෙන් යුත් කොප්පරා භාවිතා කර පොල් තෙල් නිෂ්පාදනය කිරීම සඳහා පොල් තෙල් නිෂ්පාදනාගාරයක් පලුගස්වැව වතු කලාපය තුල ස්ථාපිත කර ඇත. කජු සැකසුම් මධ්‍යස්ථානය ද පලුගස්වැව වතු කලාපය තුල ස්ථාපිත කර ඇත.

### අනෙකුත් මෙහෙයුම් ආදායම්

අනෙකුත් මෙහෙයුම් ආදායම් 2018 වර්ෂයේ පැවති රුපියල් මිලි. 71.7 ක සිට 2019 වර්ෂයේ දී රුපියල් මිලි. 93.5 ක් දක්වා 30% කින් වර්ධනය වී ඇත. අනෙකුත් මෙහෙයුම් ආදායම්, පොල් ලෙලි අලෙවිය, දැව, කුඹුරු ආදායම සහ මැරුණු / ඵල නොදරන පොල් ගස් අලෙවිය වැනි ආදායම් වලින් සමන්විත වේ.

අනෙකුත් ආදායම් ප්‍රභවයන්ට අදාල විස්තර මූල්‍ය වාර්තා සටහන් අංක 21 තුල ඇතුලත් වේ.

### පරිපාලන හා පොදු වියදම්

පරිපාලන හා පොදු වියදම් 2018 වර්ෂයේ පැවති රුපියල් මිලි. 86 ක සිට 2019 වර්ෂයේ දී රුපියල් මිලි. 93 ක් දක්වා 8% කින් වැඩි වී 2018 වර්ෂයේ පැවති මූල්‍ය තත්වය හේතුවෙන් සමාගමට සේවක දිරිදීමනා ගෙවීමට නොහැකි වූ අතර 2019 වර්ෂයේ දී රු. මිලියන 7.2 ක මුදලක් සේවක දිරිදීමනා ලෙස ගෙවීමට හැකි විය. වර්ෂය තුල පරිපාලන වියදම් වැඩිවීම කෙරෙහි මෙය ප්‍රධාන වශයෙන් බලපා ඇත.

### මූල්‍ය ආදායම

මූල්‍ය ආදායම ප්‍රධාන වශයෙන් කෙටිකාලීන තැම්පතු මත පොලී ආදායම හා සේවක ණය මත පොලී ආදායම නියෝජනය කරනු ලබයි. බැංකු පොලී අනුපාත අඩුවීම හා කෙටිකාලීන තැම්පත් ප්‍රමාණය පහත වැටීම හේතුවෙන් ලංකා බැංකුවේ ඇති කෙටිකාලීන තැම්පතු මත උපයන ලද පොලී ආදායම 2018 වර්ෂයේ පැවති රුපියල් මිලි. 13.9 සිට ප්‍රවර්තන වර්ෂයේ දී රුපියල් මිලි. 9.7 ක් දක්වා පහත වැටී ඇත. 2018 වර්ෂයේ වාර්තා වූ අහිතකර මූල්‍ය තත්වය සමාගමේ කෙටිකාලීන තැම්පතු ප්‍රමාණය පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත.

### මූල්‍ය පිරිවැය

ජනවසම කල්බදු වත්කම් මත ගෙවිය යුතු පොළිය හා අසම්භාව්‍ය කල්බදු කුලිය ප්‍රධාන වශයෙන් මූල්‍ය පිරිවැය තුල අන්තර්ගත වේ. 2019 වර්ෂයේ දී අදාල පිරිවැය රුපි. මිලි. 37 ක් වූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එය 6% ක වර්ධනයකි. දළ දේශීය නිෂ්පාදන අවධමනකය (GDP Deflector) පදනම් කර ගනිමින් වාර්ෂිකව මෙම වැඩිවීම සිදු වේ.

මීට අමතරව කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් සමාගම විසින් ලංකා බැංකුව වෙතින් ලබා ගත් මූල්‍ය පහසුකම් වෙනුවෙන් 2019 වර්ෂය තුලදී රු. මිලියන 2 ක මූල්‍ය පිරිවැයක් දරා ඇත.




### ශුද්ධ ලාභය

පසුගිය වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 36.6 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේ දී සමාගම විසින් රු. මිලියන 49.4 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. සමාගම මෙම ලාභදායිත්වය අත්කරගෙන ඇත්තේ පසුගිය වර්ෂයේ ඉහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිල වන රු. 36/- ට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේ දී අඩු ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිලක් වන රු. 25/- ක මිලක් යටතේ ය.

### ලාභාංශ

2008 වර්ෂයේ මැයි මස හලාවත වැවිලි සමාගමෙහි කළමනාකාරිත්වය යලි රජයට පවරා ගැනීමෙන් පසු හලාවත වැවිලි සමාගම විසින් රුපියල් මිලි. 305 ක මුළු ලාභාංශ මුදලක් සමස්තයක් ලෙස මහා භාණ්ඩාගාරය / ස්වර්ණමය කොටස් හිමිකරු වෙත ගෙවීම් කර ඇත. 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල උපයන ලද ලාභයට සාපේක්ෂව මෙම අගය සැලකිය යුතු ඉහළ වටිනාකමකි. එමෙන්ම 1992 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගත් කල හලාවත වැවිලි සමාගම විසින් මහා

භාණ්ඩාගාරය වෙත ගෙවා ඇති මුළු ලාභාංශ ප්‍රමාණය රු. මිලියන 467 කි.

### කොටසක ඉපයීම

සමාගමේ කොටසක ඉපයීම 2018 වර්ෂයේ පැවති සෘණ රු. (1.62) සිට 2019 වර්ෂයේ දී රු. 2.37 ක් දක්වා වර්ධනය වී ඇත.




### ජංගම අනුපාතය

ජංගම අනුපාතය පසුගිය වර්ෂයේ පැවති වාර 1.7 ක සිට 2019 වර්ෂයේ දී වාර 1.5 ක් දක්වා අඩු වී ඇත. මෙම වර්ෂය තුල වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඉහළයාම මෙම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත.

### වත්කම් සමුදාය

ප්‍රවර්තන වර්ෂය තුලදී සමාගමෙහි මුලු වත්කම් 2018 වර්ෂයෙහි පැවති රුපියල් මිලියන 1305 ක සිට රුපි.මිලියන 1412 ක් දක්වා 8% කින් වර්ධනය වී ඇත. ජංගම මෙන්ම ජංගම නොවන වත්කම් වල වැඩිවීම මුලු වත්කම් සමුදායෙහි වර්ධනයට හේතු වී ඇත.

වත්කම් සමුදාය තුල ජංගම නොවන වත්කම් 2018 වර්ෂයේ පැවති රුපි.මිලියන 1121 ක සිට 2019 වර්ෂයේ දී රුපි. මිලි.1178 ක් දක්වා 5% කින් වර්ධනය වී ඇත.

ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා දරන ලද වියදම් හේතුවෙන් ධාරක ජෛව වත්කම් ඉහළ යාම හා නව තක්සේරු කිරීම් හේතුවෙන් පාරිභෝජ්‍ය ජෛව වත්කම් අගය ඉහළ යාම ජංගම නොවන වත්කම් වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

සමාගමේ ජංගම වත්කම් සමුදාය 2018 වර්ෂයේ පැවති රුපියල් මිලි. 184 ක සිට 2019 වර්ෂයේ දී රුපියල් මිලි. 234 ක් දක්වා 27% කින් වර්ධනය වී ඇත. වර්ෂය අවසනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ඉහළ යාම, තොග සහ කෙටිකාලීන තැම්පත් වැඩිවීම මෙම ජංගම වත්කම් වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත.

| වත්කම් සමුදාය | 2019 රු.මිලි. | 2018 රු.මිලි. |
|---|---|---|
| ජනවසම වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම | 68 | 71 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම | 1 | 1 |
| ජනවසම වතුයායන් වල ජෛව වත්කම් වල කල්බදු හිමිකම | 18 | 21 |
| කල්බදු දේපල සංවර්ධනය | 899 | 849 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් | 90 | 58 |
| ජෛව වත්කම් - පශු සම්පත් | 15 | 19 |
| සින්නක්කර දේපල පිරියත හා උපකරණ හිමිකම | 81 | 95 |
| වෙනත් මූල්‍ය වත්කම් | 6 | 7 |
| ජංගම වත්කම් | 234 | 184 |
| **මුළු වත්කම්** | **1,412** | **1,305** |

### ස්කන්ධය

කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 200 කින් හා සංචිත රුපි. මිලියන 748 කින් ස්කන්ධය සමන්විත වේ. සංචිත වල සංයුතිය පහත පරිදි වේ.

| | 2019 රු.මිලි. | 2018 රු.මිලි. |
|---|---|---|
| නොබෙදූ ලාභ | 617.1 | 612.9 |
| දැව සංචිතය | 130.6 | 95.3 |
| **මුළු සංචිත** | **747.7** | **708.2** |

### කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය

වර්ෂය තුල කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය 67% ලෙස පවතී.



### ජංගම වත්කම් සහ ජංගම වගකීම්




### කාරක ප්‍රාග්ධනය

පසුගිය වර්ෂය අවසනට පැවති රුපි. මිලියන 77 ට සාපේක්ෂව වාර්ථා කරන වර්ෂය අවසානයට කාරක ප්‍රාග්ධනය රුපි. මිලියන 77 ක් වේ.

### මුදල් ප්‍රවාහ

#### ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය

2018 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 2.8 ක සෘජු ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුලදී රුපි. මිලියන 60 ක ධනාත්මක ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහයක් වාර්තා වූ විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ කාර්ය සාධනයක් අත්පත් කර ගැනීම තුලින් පසුගිය වර්ෂයේ සෘණාත්මක අගයක් ලෙස වාර්තා වූ ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය මෙම වර්ෂය තුලදී ධනාත්මක අගයක් බවට පරිවර්ථනය කරගත හැකි විය.

### ප්‍රාග්ධන වියදම්

ප්‍රවර්තන වර්ෂය තුලදී සමාගම රුපියල් මිලි. 60 ක මුදලක් වතු ක්ෂේත්‍ර සංවර්ධනය (යටි වගා/ නොමේරූ වගා) වෙනුවෙන් දරා ඇත.

ඒ අනුව රුපියල් මිලි. 59 ක් පොල් නව වගා/ යටි වගා සහා නොමේරූ වගා හෙක්ටයාර 814.19 ක් වෙනුවෙන් ද රුපියල් මිලි. 1 ක් අතුරු බෝග වගා වෙනුවෙන් ද සමාගම විසින් ආයෝජනය කර ඇත.

ඊට අමතරව රුපියල් මිලි. 2 ක මුදලක් දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් සමාගම විසින් දරා ඇත.

### ශුද්ධ මුදල් ප්‍රවාහය

2018 වර්ෂය තුල වාර්තා වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වන සෘණ (රුපියල් මිලි. 84) ට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුල දී රුපියල් මිලි. 22 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් වාර්තා විය.

### කෙටිකාලීන තැම්පතු හා බැංකු ශේෂය

ප්‍රවර්තන වර්ෂය අවසන් වන දිනට මුදල් හා මුදල් සමාන දෑ හා ලංකා බැංකුවේ ඇති කෙටිකාලීන තැම්පතු වල වටිනාකම රුපියල් මිලි. 111 ක් වූ අතර එය 2018 වර්ෂය අවසනට පැවති රුපියල් මිලි. 89 ට සාපේක්ෂව 23% ක වර්ධනයක් නිරූපණය කරයි.

| වර්ෂය | පොල් ගෙඩි | ශ.වි.ආ. (ගෙඩි 1000) | ආදායම (රු.) |
|---|---|---|---|
| 2014 | 12,969,381 | 29 | 374,850,643 |
| 2015 | 12,517,083 | 30 | 399,365,998 |
| 2016 | 16,522,290 | 25 | 383,089,914 |
| 2017 | 11,651,155 | 42 | 516,178,934 |
| 2018 | 8,132,121 | 36 | 291,313,372 |
| 2019 | 14,933,952 | 25 | 348,349,082 |

### වතු මට්ටමින් පොල් අස්වැන්න - 2019

| වතු කලාපය | පොල් ගෙඩි |
|---|---|
| හලාවත | 1,637,232 |
| පලුගස්වැව | 4,309,571 |
| තම්බපන්නි | 1,204,903 |
| මංගලඑළිය | 852,394 |
| බිංගිරිය | 2,001,491 |
| නිකවැරටිය | 1,098,234 |
| දිවුලපිටිය | 1,879,790 |
| මාදම්පේ | 2,010,337 |
| **එකතුව** | **14,993,952** |



## ආයතනික පාලන ප්‍රකාශනය

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරිම සදහා හේතු වි ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස් කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටින්, ක්‍රියා පිලිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සදහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරිම සදහා හේතු වි ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යය සාධනය සදහා වගකීව යුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැදි සිටින්නේය.

### වගකීම්

මුලික ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණ සකස් කිරිමටත් එවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැදි සිටි. සමාගමේ මූල්‍ය තොරතුරු වල විශ්වාසනියත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සදහා ද අවසාන වගකීම් දරන්නාවන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය 2019 වර්ෂයේ අධ්‍යක්ෂවරුන් හත්දෙනෙකුගෙන් සමන්විත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්ථන වියදම් සමාලෝචනයට ලක් කිරිම මෙම රැස්වීමේදි සිදුවේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2019 වර්ෂය තුලදි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 5 ක් පවත්වා ඇත.

### විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් යුක්තය.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන පි.බි.එස්.සි. නොනිස් මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුල ඇගයීම් 5 ක් සිදුකර ඇත.

විගණකාධිපති දෙපාර්ථමේන්තුවේ නිලධාරියකු නිරික්ෂකයෙකු වශයෙන් විගණන කමිටු රැස්වීම් වලට සහභාගි වි ඇත.

සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, විධායක අධ්‍යක්ෂක, සහකාර සමාන්‍යාධිකාරි වැවිලි, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි විමසීම් කරන අවස්ථා වලදි මෙම කමිටු රැස්වීම් වලට සහභාගි වේ.

### නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථා පත්‍රය, සංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සදහා බලපවත් වන අනෙකුත් නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරිමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන බවට සහතික වේ. එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රි ලංකා ගිණුම් කරන ප්‍රමිතින්ට අනුකූල වන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලබයි.

## අවදානම් කළමණාකරණය

විශේෂයෙන් කෘෂි ක්ෂේත්‍රයේ පවතින සමාගමක් ලෙස පරිසරය තුල විකාශය වීම හා විවිධ මට්ටමේ අවදානම් කෙරෙහි නිරාවරණය වී ඇති අතර කාළගුණ රටාව හා වෙළඳපළ උච්චාවචනයන් කෙරෙහි ඉහළ සංවේදී බවක් දක්වයි. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුලින් දැනුවත්ව හා දූරදර්ශීභාවයෙන් අවදානම් දැරීම කෙරෙහි සහතික වීම බලාපොරොත්තු වේ.

**අවදානම් පාලන ක්‍රමෝපායන්**

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| දේශගුණික වෙනස්වීම් | මාස ගණනක් අඛණ්ඩව පවතින අනපේක්ෂිත නියග වැනි අයහපත් කාළගුණික තත්වයන් නිසා පොල්, කජු සහ අනෙකුත් බහු වාර්ෂික බෝග වල අස්වැන්න උච්චාවචනය. | වගාවේ පස් අතර වර්ෂා ජලය රඳවා තබා ගැනීම සඳහා වලවල් කපා පොල් ලෙලි වළලා පසේ තෙතමනය වැඩිකර ගැනීමට කටයුතු කිරීම හා ගිනිසීරියා, පියුරේරියා වැනි ආවරණ බෝග වැවීම.<br>පසු කාලීනව වාරි සම්පාදනය සඳහා භාවිතා කිරීමට හා පාංශු තෙතමනය ආරක්ෂා කිරීම තුලින් මුල් මගින් ශාක වලට අවශ්‍ය ජලය සැපයීම සඳහා වර්ෂා ජලය එක් රැස් කර ගැනීමට වැව් වැඩි සංඛ්‍යාවක් පිළිසකර කිරීම.<br>පැල හා ශාඛ වල ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා නල මගින් වාරි ක්‍රම ස්ථාපිත කිරිම. |
| නිෂ්පාදනය අඩුවීම | වයස අවුරුදු 50 ට වැඩි මේරූ ගස් ඉහළ ප්‍රතිශතයක් පැවතීම නිසා එම ගස් වියපත්, ඵල නොදරන තත්වයට පත්වීම.<br>ඊට අමතරව, අනපේක්ෂිත රෝග හා ස්වාභාවික හේතු ශාක වලට සහ වගාවට බලපෑම. | වයස් ගත ශාක ගහණය වෙනුවට යටි වගා හා නව වගා ඇති කිරීම.<br>මයිටා මර්ධනය සඳහා රසායනාගාර 02 ක් පළුගස්වැව වතුයායේ සහ දිවුලපිටිය වතුයායේ ස්ථාපිත කිරීම.<br>ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණ උපාය මාර්ග ඇති කිරීම. |
| භාණ්ඩ වෙළඳ චක්‍රය | ආහාර සඳහා ගනු ලබන පොල් හා ආශ්‍රිත නිෂ්පාදන වෙනුවට ආදේශක භාණ්ඩ පැවතීම තුලින් පාරිභෝගික ඉල්ලීම අඩු වීමෙන් මිල පහත වැටීම සහ අස්ථාවර අලෙවිය නිසා විශාල පොල් ගෙඩි ප්‍රමාණයක් වතුයායන් තුල ගොඩ ගැසී තිබීම හා විකල්ප ක්‍රියා මාර්ග නොගත හොත් නරක් වීමට හා විනාශ වීමට ඉඩ තිබීම.<br>පාම් තෙල් වැනි තරඟකාරී ආදේශක භාණ්ඩ වල මිල අඩුවීම නිසා වැඩි පාරිභෝගික ආකර්ෂණයකට ලක් වීම තුලින් පොල් මිල හා ඉල්ලුම කෙරෙහි බලපෑම. | පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසියට අමතරව එහිදී අලෙවි නොවන පොල් ප්‍රධාන කාර්යාලයේ සෑම සති දෙකකට වරක් පවත්වනු ලබන පොල් පොළේ දී අලෙවි කිරීම.<br>අගය එකතු කල නිෂ්පාදන සඳහා යොමු වීම.<br>වෙන්දේසියේ දී අලෙවි නොවන පොල් මගින් කොප්පරා නිෂ්පාදනය කර කොටසක් කොප්පරා ලෙස වෙන්දේසියේ දී අලෙවි කිරීම හා ඉතිරිය පලුගස්වැව වතුයායේ ස්ථාපිත කර ඇති තෙල් මෝලේ දී පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනය කිරීම. |
| ණය අවදානම | නීති රෙගුලාසි වලින් බැඳීමට අපොහොසත් වීම මත ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ගෙවීමට ප්‍රමාද වීමේ ඉඩකඩ තිබීම. | සමීප ගෙවීම් සුපරීක්ෂන ක්‍රමවේද මගින් ගැනුම්කරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ සහතික කිරීම.<br>ගෙවීම් කල්ගත වී ඇති හෝ ප්‍රතිචාර නොදක්වන ගැනුම්කරුවන්ගෙන් මුදල් පියවා ගැනීම සඳහා නීතිමය මැදිහත් වීම ලබා ගැනීම.<br>රජයේ කල්බදු ගෙවීම සුපරීක්ෂාකාරීව සොයා බලා ප්‍රමාදයකින් තොරව ගෙවා දැමීම. |

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| සේවක කළමනාකරණය | අඩු ඵලදායීතාවයක් හා නිමැවුමක් ඇති වීමට හේතු වන රැකියාව පිළිබඳ දැනුම හා අභිප්‍රේරණය නොමැතිකම.<br><br>වැඩි වැටුප් හා ඉහළ තනතුරු අපේක්ෂාවෙන් සේවකයන් වෙනත් ක්ෂේත්‍රයන් හෝ සමාගම් වෙත යාම. | වැඩමුළු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br><br>මූල්‍ය දිරිදීමනා හා සුභසාධන ක්‍රියාමාර්ග මගින් සේවක ප්‍රතිලාභ වැඩි කිරීම.<br><br>නිතිපතා සංවාද මගින් සේවක වෘත්තීය සංගම් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.<br><br>සේවකයින්ට අදාල වන ප්‍රතිලාභ වලට අදාලව පාලන අවශ්‍යතා සියල්ලම ඇති කිරීමට කටයුතු කිරීම.<br><br>වෘත්තීයමය යෝග්‍යතාවය අනුව ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා හැකි තරම් දුරට අභ්‍යන්තරිකව රැකියා උසස්වීම් ලබා දීමට ක්‍රියාකිරීම. |
| වත්කම් අවදානම | ගිනි, සොරබිය සහ යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීමේ අවදානම.<br><br>කෘමීන්, සතුන්ගෙන් වන හානි සහ අකුණුසැර, ගංවතුර වැනි ස්වාභාවික ආපදා. | සියලු ස්පෘශ්‍ය වත්කම් සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීම.<br><br>එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට වත්කම් රැගෙන යාමේ දී දැඩි පාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.<br><br>ගිනි බාධක ඇති කිරීම මගින් පිටත සිට ආයතනයේ වතු වලට ගින්න පැතිරීම වලක්වා ගැනිම හා අනෙකුත් පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම.<br><br>හානි වළක්වා ගැනීමේ නඩත්තු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාවට නැංවීම.<br><br>යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරිම. |
| ප්‍රාග්ධන ආයෝජන අවදානම | අපේක්ෂිත ලාභ නොලැබීමේ අවදානම සහ ආයෝජන වලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම. | ආයෝජන මට්ටම් අනුව හා අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීම් කාලය පදනම් කර ගනිමින් ප්‍රාග්ධන වියදම් අනුමත කිරීම සඳහා දැඩි පාලන ක්‍රමවේද අනුගමනය කිරීම. |
| කීර්තිනාම අවදානම | ආයතනයක පළිබඳව හා වෙළඳාම, සේවා නියුක්තිය, කාර්ය පටිපාටියට අදාල මූලධර්ම, ක්‍රියාපටිපාටින්, ප්‍රමිතීන්, නීති හා රෙගුලාසි පිළිබඳ ප්‍රමානවත් අවබෝධයක් නොමැති වීම.<br><br>පාරිභෝගික හෝ වෙළඳපොල අවශ්‍යතා හා ප්‍රමිති වලට නොගැලපෙන නිෂ්පාදන.<br><br>කාර්ය සාධනය, ඉලක්ක හා ප්‍රමිති පිළිබඳ දැනුම නොමැතිකම. | කාර්ය මණ්ඩලය, බැංකුකරුවන්, පාරිභෝගිකයන් වැනි විවිධ උනන්දුවක් දක්වන පාර්ශව සමග ඵලදායී සන්නිවේදනයක් ඇති කිරීම.<br><br>නිෂ්පාදන ප්‍රමිතිය, නිෂ්පාදන ක්‍රමවේදය ප්‍රමිතිගත මට්ටමින් පවත්වාගෙන යාම.<br><br>අයවැය ක්‍රියාවලියේ හා අයවැය පාලන ක්‍රමවේදයක් මාසිකව අනුගමනය කිරීම මගින් සමාගමේ කාර්යසාධනය එහි ඉලක්ක සමඟ අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කිරීම.<br><br>භාණ්ඩ හා සේවා වල ගුණාත්මක භාවය පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාර ලබා ගැනිම. |

## විගණන කමිටු වාර්තාව

අවම වශයෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂකවරුන් අතුරින් තිදෙනෙකුගෙන් සැදුම්ලත්, විගණන කමිටුව සමාගමේ ව්‍යවස්ථාවේ සහ එහි සඵලදායි අභ්‍යන්තර විගණනය පැවැත්ම කෙරෙහි බලපාන වැදගත් සාධකයකි.

මහා භාණ්ඩාගාරය නියෝජනය කරන හෝ මූල්‍ය කළමනාකරණය පිළිබද හසල දැනුමකින් යුතු ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු, විගණන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරනු ඇත.

විගණන කමිටුවේ කැදවුම්කරු ලෙස කටයුතු කරනුයේ ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වන අතර අවම වශයෙන් තෙමසකට වරක්වත් කමිටුව රැස්විය යුතුය.

විගණන කමිටුවේ විෂය පථය පහත පරිදිය,

- වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය සහ අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය භාරය නිශ්චය කිරීම.
- සමාගමේ අභ්‍යන්තර පාලන පිළිවෙත් සමාලෝචනය සහ ඇගයිමට ලක් කිරීම
- විගණකාධිපති සමග සම්බන්ධීකරණය සහ කළමනාකරන ලිපි සම්බන්ධව ක්‍රියා කිරීම
- ආයතනයේ කටයුතු එහි ව්‍යවස්ථා නීතිරීති හා චක්‍ර ලේඛණ සමඟ අනුකූලදැයි යන්න පරීක්ෂාව
- මූල්‍ය වාර්තා, අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා සහ කළමනාකරන ලිපි සම්බන්ධව ගෙන තිබූ ක්‍රියා මාර්ග සමාලෝචනය
- පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශයන් සහ උපදෙස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව
- ගිණුම් හා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබේ දැයි යන්න සමාලෝචනය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 55 දරණ චක්‍ර ලේඛණයේ නියමයන් සහ රාජ්‍ය යහපාලන සංග්‍රාමයට අනුව සී/ස හලාවත වැවිලි සමාගමේ විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස රාජ්‍ය භාණ්ඩාගාරයේ නියෝජිත මහතා කටයුතු කරන අතර ඒ මහතා ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් කමිටුව සමන්විත විය.

සමාගමේ විගණන කමිටු සාමාජිකයින් සහ කමිටු රැස්වීම් පැවැත්වූ දිනයන් පහත පරිදිය.

| | රැස්වීම් පැවත්වූ දිනයන් | | |
|---|---|---|---|
| කමිටු සාමාජිකයින්ගේ නම | ජූනි 11 | සැප්. 24 | නොවැ. 01 |
| පි.බි.එස්.සි. නෝනිස් මහතා | ✓ | ✓ | ✓ |
| අරුණි. එස්. රණසිංහ මිය | ✓ | ✓ | ✓ |
| කේ.ඒ. ජීවන්ත මහතා | ✓ | ✓ | - |

ඉහත කමිටු සමාජිකයින්ට අමතරව, ක්‍රියාකාරි අධ්‍යක්ෂක මහතාද, සාමාන්‍යාධිකාරි මහතා ඇතුළු සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයද, කමිටුවේ ඉල්ලීම මත රැස්විම සඳහා සහභාගි වූහ. විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් විගණන අධිකාරිවරයෙකු නිරීක්ෂකයෙකු ලෙසද, විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරුන් වන කෝපරේට් ඇඩ්වයිසරි සහ සමාගමද සහභාගි විය. තවද විමල් හේමචන් මහතා විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරන ලදි.

**විගණන කමිටුවේ කටයුතු වල සාරාංශය,**

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විගණන කමිටුව 2019 වර්ෂයේ සිදු කල කටයුතු වලින් බිඳක්,

- විගණන කමිටු තුනක් පැවැත්විම.
- 2019 සහ 2020 වර්ෂය වලට අදාල වාර්ෂික විගණන වැඩ සටහන සමාලෝචනය
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡා කිරීම සහ ඊට අදාලව කළමනාකාරීත්වයේ පිළිතුරු සහ කළමනාකාරීත්වය ගෙන තිබූ ක්‍රියාමාර්ගයන් සමාලෝචනය හා විග්‍රහය.
- සමාගමේ අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රමවේදයන්, පිරිවැය කාර්යක්ෂමතාවයන්, කෘෂිකාර්මික මෙහෙයුම් කටයුතු වල ප්‍රගතීන් මෙන්ම ව්‍යවස්ථාපිතමය ගෙවීම් නිසි පරිදි සිදු කර ඇත්ද යන්න සම්බන්ධව සමාලෝචනය හා ඇගයිම යනාදිය,

තවද, හලාවත වැවිලි සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂක මහතුන් අතුරින් පහත නම් සඳහන් අධ්‍යක්ෂකවරුන් 2020 වර්ෂය සඳහා කමිටු සාමාජිකයින් ලෙස නම් කර ඇත.

1) එච්.ජී.සුමනසිංහ මහතා
2) අරුණි එස්.රණසිංහ මිය
3) එන්.කේ.කේ.රාජසිංහ මහතා

එච්.ජී. සුමනසිංහ
සභාපති - විගණන හා කළමනාකරන කමිටුව

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

### නෛතික තත්වය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි) සහ 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කල වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය, කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 55/75, යන ලිපිනයෙහි පිහිටා ඇත. වතුයායන් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

පහත සඳහන් ආකාරයට වතු කලාප 08 ක් යටතේ පාලනය කෙරේ.

- පලුගස්වැව වත්ත
- හලාවත වතු කලාපය
- තම්බපන්නි වතු කලාපය
- මංගලඑලිය වතු කලාපය
- දිවුලපිටිය වතු කලාපය
- මාදම්පේ වතු කලාපය
- බිංගිරිය වතු කලාපය
- නිකවැරටිය වතු කලාපය

### ප්‍රධාන ක්‍රියාකාරකම්

හලාවත වැවිලි සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පොල්, කජු සහ වෙනත් කෘෂි භෝග වගා කිරීම, අනෙකුත් කෘෂි නිෂ්පාදනය, පශු සම්පත් හා ඒවා අලෙවි කිරීම දැක්විය හැක.

### මූල්‍ය වාර්තා

2020 ජූලි මස 13 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද මූල්‍ය වාර්ථා පිටු අංක 43 සිට 82 දක්වා ඉදිරිපත් කර ඇත.

### විගණන වාර්තා

සමාගමේ මූල්‍ය වාර්තා මත විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 36 සිට 42 දක්වා පිටු තුල අන්තර්ගතව ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරන ප්‍රතිපත්ති පිටු අංක 47 සිට 61 දක්වා සඳහන්ව ඇති අතර, පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී ගිණුම් කරන ප්‍රතිපත්ති වල වෙනසක් සිදු කර නොමැත.

### අඛණ්ඩ පැවැත්ම

සමාගමේ කටයුතු පුරෝකථනය කල හැකි අනාගතයක් දක්වා ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

2019 වර්ෂයේ සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සංක්ෂිප්තව පහත පරිදි වේ.

### 2019 අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| වි.කේ.සී. හේරත් මහතා (14.07.2016 -31.12.2019) | සභාපති |
| එම්.කේ.බි. සෙනවිරත්න මහතා (08.05.2015 -05.02.2020) | විධායක අධ්‍යක්ෂ |
| පී.සී. විජේවර්ධන මහතා (28.02.2019 - 05.02.2020) | ක්‍රියාකාරි අධ්‍යක්ෂ |
| පී.බී.එස්.සි. නෝනිස් මහතා (05.09.2016 - 03.02.2020) | අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත |
| ජ්. ලක්කතාස් මහතා (19.05.2016 - 28.02.2019) | අධ්‍යක්ෂ |
| අරුණි එස්. රණසිංහ මහත්මිය (28.02.2019 - 05.02.2020) | අධ්‍යක්ෂ / අමාත්‍යාංශ නියෝජිත |
| ජේ.බි. කළුආරච්චි මහතා (31.01.2019 - 05.02.2020) | අධ්‍යක්ෂ |
| ආනන්ද පුෂ්පකුමාර මහතා (19.03.2019 - 05.02.2020) | අධ්‍යක්ෂ |
| එච්.එම්.එන්.සී. හේරත් මහතා (20.03.2015 - 31.01.2019) | අධ්‍යක්ෂ |
| එස්. විජේගුණවර්ධන මහතා (24.07.2018 - 28.02.2019) | අධ්‍යක්ෂ |

### වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| ආර්.ඩබ්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා (31.12.2019 සිට) | සභාපති |
| එච්.ජී. සුමනසිංහ මහතා (03.02.2020 සිට) | අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත |
| අරුණි එස්. රණසිංහ මහත්මිය (14.02.2020 සිට) | අධ්‍යක්ෂ / අමාත්‍යාංශ නියෝජිත |
| එන්.කේ.කේ. රාජසිංහ මහතා (05.02.2020 සිට) | අධ්‍යක්ෂ |
| ඕ.පී.කේ. පතිරණගේ මහතා (05.02.2020 සිට) | අධ්‍යක්ෂ |
| අජන්ත මූණමලේ මහතා (05.02.2020 සිට) | අධ්‍යක්ෂ |
| අයි.එස්.ජේ.පී. ගුණවර්ධන මහතා (05.02.2020 සිට) | අධ්‍යක්ෂ |
| ඩබ්.ඩබ්.ඒ.එන්.ටී.ඒ. ප්‍රනාන්දු මහතා (05.02.2020 සිට) | අධ්‍යක්ෂ |

### විගණන කමිටුව

පහත සදහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 3 ක් සිදු කර ඇත.

### විගණන කමිටුව -2019

| | |
|---|---|
| පී.බී.එස්.සී. නෝනිස් මහතා | සභාපති |
| අරුණි එස්. රණසිංහ මහත්මිය | සාමාජික |
| ජේ.බී. කළුආරච්චි මහතා | සාමාජික |
| රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව | නිරීක්ෂක |

### කාර්යය සාධනය

වර්ෂය තුල සමාගමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය, කළමනාකරණ හා මූල්‍ය සමාලෝචනය යන සමාලෝචනයන් යටතේ දක්වා ඇත.

### අයභාරය

2019 වර්ෂයේදී සමාගමේ අයභාරය රුපියල් මිලියන 445 කි. (2018 රු. මිලියන 350) එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 27% වැඩි වීමකි. වර්ෂය තුල පොල් අස්වැනෙහි වැඩිවීම මෙම හිතකර වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත. අයභාරයෙහි සංයුතිය මූල්‍ය වාර්තා සටහන් අංක 19 තුල අන්තර්ගතව ඇත.

වර්ෂය තුලදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස රු.මිලියන 93 ක් උපයා ඇත. (2018 වර්ෂයේ එය රුපියල් මිලියන 72 කි).

වර්ෂය තුල පොළී ආදායම ලෙස රුපියල් මිලියන 11 ක් උපයා ඇති අතර ඊට අදාල විස්තර විගණනය කරන ලද මූල්‍ය වාර්තා සටහන් අංක 23 යටතේ ඉදිරිපත් කර ඇත.

### මූල්‍ය ප්‍රතිඵල

පසුගිය වර්ෂයේ පැවති රු. මිලි 35.1 ක අලාභයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂය තුලදී රු. මිලි 60.9 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

මූල්‍ය ප්‍රතිඵල වලට අදාල තොරතුරු විස්තීරන මූල්‍ය ප්‍රකාශනය තුල සදහන්ව ඇත.

### ස්ථාවර වත්කම්

2019 වර්ෂය තුලදී සමාගම රු. මිලියන 60.5 ක් (2018 වර්ෂයේදී රු. මිලියන 80) නව වගාවන්, යටි වගාවන් හා නොමේරු වගාවන් නඩත්තුව වෙනුවෙන්ද රු. මිලියන 2.3 ක් දේපල පිරියත උපකරණ වෙනුවෙන් ද ආයෝජනය කර ඇත. (2018 රු. මිලියන 11.5)

2019 වර්ෂයේ ශේෂ පත්‍ර දිනට ජංගම නොවන වත්කම් (දේපල, පිරියත, උපකරණ, ජෛව වත්කම්, කල්බදු වත්කම්) වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 1178 කි. (2018 රු. මිලි. 1121 කි). ඊට අදාල තොරතුරු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 04 සිට 08 සහ 11 මගින් ඉදිරිපත් කර ඇත.

### කෙටි කාලීන ආයෝජන

2018 වර්ෂයේ පැවති රු. මිලියන 80.6 ට සාපේක්ෂව 2019 වර්ෂය අවසන් වන දිනට කෙටිකාලීන ආයෝජන රු. මිලියන 105 කි. ඊට අදාල තොරතුරු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 12 හි දක්වා ඇත.

### සංචිත

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ සංචිත, නොබෙදූ ලාභ රු. මිලියන 617 කින් හා දැව සංචිතය රු. මිලියන 131 කින් සමන්විත වේ.

සංචිත වල වෙනස් වීම් හා සංයුතිය විගණනය කරන ලද මූල්‍ය වාර්තාවන්හී ස්කන්ධය වෙනස් වීම් ප්‍රකාශය යටතේ අනාවරණය කර ඇත.

### බදුකරණය

බදු අයකල හැකි ආදායම මත 14% ක බදු අනුපාතයකට සමාගම යටත්වේ. 2017 අංක 24 දරණ ආදායම් බදු පනතට ගෙන එන ලද සංශෝධන වලට අනුව 2019 අප්‍රේල් 01 වන දින සිට සාමගම කෘෂිකර්මාන්තයෙන් උපයන ලද ආදායම බද්දෙන් නිදහස්ව ඇත. බදුකරණය පිළිබඳ තොරතුරු මූල්‍ය වාර්තා සටහන් අංක 24 යටතේ ඉදිරිපත් කර ඇත.

### කොටස් ප්‍රාග්ධනය

2019 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රු. 200,000,010 ක් වන අතර එය ස්වර්ණමය කොටස ද ඇතුලුව සාමාන්‍ය කොටස් 20,000,001 කින් සමන්විත වේ. කිසිඳු ආකාරයක කොටස් නිකුත් කිරීමක් වර්ෂය තුල සිදු කර නොමැත.

## ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් පිළිබඳ විගණනය කරන ලද මූල්‍ය වාර්තා සටහන් අංක 28 තුල අනාවරණය කර ඇත.

## මූල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා සටහන් අංක 26 තුල හෙළිදරව් කර ඇති කරුණු හැර සමාගම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කල හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් කිසිවක් නොමැත.

## අධ්‍යක්ෂකවරුන්ගේ බැඳීම්

සමාගමෙහි ගිණුම් වාර්තා වල සටහන් අංක 27 හි ප්‍රකාශ කර ඇති කරුණු හැර අධ්‍යක්ෂවරුන් සමාගම සමඟ සෘජු හෝ වක්‍ර වෙනත් බැඳීම් නොමැත.

## අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ / ඇයගේ කාලාත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකම් දරන්නේ නැත.

## සේවා නියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සදහා රජයේ නීති වලට අනුකූලව කටයුතු කරන අතර සේවකයින් සම්බන්ධයෙන් පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදි කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට කුසලතාව පදනම්ව එක හා සමාන අවස්ථාවන් සලසනු ලබයි. එසේම සමාගම සේවකයන්ට සම තැන පදනම මූලික කර ගනිමින් සෑම සේවා නියුක්තිකයෙකු හටම ලිංග බේදය, ජාති බේදය, ආගම, විවාහක තත්වය, දේශපාලන පසු බිම හෝ කායික දුබලතාවයන් නොසලකා සම අවස්තාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාගමේ සේවා නියුක්තියන් සදහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ ඔවුන් දැනුවත් උපරිම කරුණු අනුව අධ්‍යක්ෂක වරුන් සහතික වේ.

## විගණකවරු

2019 වර්ෂයට අදාල ගිණුම් වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන ලදි.

මූල්‍ය වාර්තා පිළිබඳව විගණන මතය පිටු අංක 36 සිට 42 දක්වා වූ පිටු තුල අන්තර්ගතව පවතී.

## වාර්ෂික මහා සභා රැස්වීම

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම, 2020 දෙසැම්බර් මස 30 දින පස්වරු 1.30 ට හලාවත වැවිලි සමාගමට අයත් පළුගස්වැව වතු යායේදී පැවැත්වේ.

මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය මේ සමග අමුණා ඇත.

මෙම වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

සභාපති /ප්‍රධාන විධායක නිලධාරි

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම
ලේකම්වරු, හලාවත වැවිලි සමාගම
කොළඹ.

(මෙය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාවේ සිංහල පරිවර්ථනයකි.)

## අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳව ප්‍රකාශනය

2017 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳව වගකීම හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි. සමාගමේ විගණක වන විගණකාධිපතිතුමාගේ වගකීම පිළිබඳ සිය වාර්තාවෙන් සංක්ෂිප්තව දක්වා ඇත.

මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත.

සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති බවටත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි අදාල සියලු ගිණුම්කරන ප්‍රමිතීන් භාවිතා කල බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතිකවේ. මෙම ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසිආකාරයෙන් අනාවරණය කර ඇති අතර ඊට හේතු පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සඳහා භාවිතා කරන ලද විනිශ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලි වෙයි. සමාගම තම මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයන් හා සාධාරණ ලෙස නිර්වචනය කිරිම සඳහා නිසි ලෙස මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටීයි.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළබඳව සමස්ථ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වාලන අභ්‍යන්තර පාලන ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ගෙන් සමන්විත අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් ගණුදෙනු නිසි අධිකාරියට අනුව සිදු වන බවට හා නිසි පරිදි වාර්තා වන බවටත් සියලු වත්කම් ආරක්ෂා විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වා හෝ සධාරණ කාලයක් තුල දැන ගැනිමට හැකි වන පරිදි සකසා ඇති බව සනාථ කරයි.

ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි අඛණ්ඩ පැවැත්ම නොවෙනස්ව අනුගමනය කරනු ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරික්ෂණයන් හා සමාලෝචනයන් කිරිමට සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දි ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා, අදාල දත්ත සමග පරික්ෂා කර ඔවුන් ගේ නිදහස් අදහස් පළ කර ඇති අතර, එම වාර්තාද වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කර ඇත.

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවිම් සිදු කිරිම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම
ලේකම්වරු, හලාවත වැවිලි සමාගම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ජී/ඒ/සීපීඑල්/01/2019/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 සැප්තැම්බර් 15 දින

සභාපති

එල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්

**එල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

එල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් ("සමාගම") හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර ඇති පිරිවැය රු.මිලියන 130.3 ක් වූ වාහන 08 ක්, යතුරුපැදි 18 ක් සහ කෘෂිකාර්මික වාහන තවදුරටත් ධාවන තත්ත්වයේ පැවතුණද එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 1992 වර්ෂයේදී සමාගම වෙත ලබාදුන් ඉඩම් හෙක්ටයාර් 5733 න් සමාලෝචිත වර්ෂය අවසානයට අනවසර අත්පත් කරගැනීම්, පොදු පහසුකම් සඳහා වෙන්කිරීම්, රජයේ අවශ්‍යතා සඳහා වෙන් කිරීම් වැනි හේතු මත සමාගමට අහිමි වූ රු.මිලියන 4.6 ක් වටිනා ඉඩම් හෙක්ටයාර් 184.15 ක් ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) භූමිය පිළිබඳව අධ්‍යයනයකින් තොරව, සමාගම විසින් 2013 හා 2014 වර්ෂයන්හි රු.මිලියන 4.45 ක වියදමින් පුත්තලම, මංගලඑළිය වතුයායේ හෙක්ටයාර් 18.75 ක භූමියක ආරම්භ කර තිබුණු කජු ගස් 3,850 ක වගාවක් 2015 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණ ද, ඊට අදාළ ගැලපිලි ගිණුම්වල සිදුනොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වියදම ප්‍රාග්ධනිත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගම ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ මාණ්ඩලික නිලධාරීන් 28 දෙනෙකු සඳහා රු.මිලියන 1.72 ක අයවැයගත දීමනා, රු.මිලියන 2.12 ක රියදුරු දීමනා සහ මධ්‍ය හා පහළ මට්ටමේ කළමනාකරුවන් නව දෙනෙකු සඳහා රු.438,934 ක ගමනාගමන දීමනා සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණි. |
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | දුරකථන දීමනාව සඳහා සුදුසුකම් නොලබන නිලධාරීන් දස දෙනෙකුට රු.102,167 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3.2.1 ඡේදය | රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු.352,690 ක ඉන්ධන ලබාගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 2.14.1 මාර්ගෝපදේශය | අංක KV-4068 දරන වාහනය රු.488,604 ක වියදමින් අලුත්වැඩියා කර තිබුණ ද, ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2019 ජුලි 30 දින හලාවත සහ පළුගස්වැවව අලෙවි මධ්‍යස්ථාන දෙකෙහි සහ පළුගස්වැවව කජු සැකසුම් මධ්‍යස්ථානයේ ලේඛනගත තොග ශේෂයන් සහ භෞතික තොග ශේෂයන් අතර, රු.551,581 ක් වටිනා නිමි කජු කි.ග්‍රෑ.259 ක ඌනතාවටක් පැවැති අතර, පළුගස්වැව හා ප්‍රධාන කාර්යාලයේ රු.76,860 ක් වටිනා පොල්තෙල් බෝතල් 200 ක ඌනතාවයක් පවැතුණි. 2020 ජුලි 31 දින වන විටත් මෙම ඌනතාවයන්ට වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතියික මට්ටමේ තනතුරු 17 ක නිලධාරීන් 35 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන සේවක අවශ්‍යතා මත තනතුරු හා සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර කළමනාකරු සහ සහකාර ගණකාධිකාරි යන තනතුරු සඳහා නිලධාරීන් වර්ෂ 10 ට පෙර බඳවාගෙන තිබුණද, මෙම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණු අතර, රියදුරන් දෙදෙනෙකු සහ කම්කරුවන් දෙදෙනෙකු අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවාගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජුලි 05 දින පළුගස්වැව වතු යායේ පැවැති උත්සවයකට අදාළ පුවත්පත් දැන්වීම් පල කිරීම, ආහාරපාන, තෑගි හා වෙනත් වියදම් වශයෙන් රු.707,991 ක්ද, මෙම උත්සවය සඳහා සහභාගී වූ දින වැටුප් ලබන වතු සේවකයින් 616 දෙනෙකු සඳහා රු.462,000 ක දින වැටුප් ද සමාගම විසින් ගෙවා තිබුණි.

(ඈ) සමාගමට ණය දීමටත්, මෙහි සඳහන් සංස්ථා, සමාගම් හා අමාත්‍යාංශවලට ණය ගැනීමටත්, නීත්‍යානුකූල බලයක් නොමැති වුවද, සමාගම විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය සම්පත් ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාවට, 2010 වර්ෂයේදී ලබා දී තිබූ රු.මිලියන 105 ක ණය මුදල හා සමාලෝචිත වර්ෂය අවසානයට ඒ සඳහා අදාළ පොලියද සමඟ එකතුව රු.මිලියන 164.5 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට | සටහන් | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| අයභාරය | 19 | 445,502,499 | 350,021,923 |
| විකුණුම් පිරිවැය | 20 | (356,416,322) | (350,229,446) |
| **දළ ලාභය** | | **89,086,177** | **(207,522)** |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ප්‍රතිලාභ | 21 | 93,596,807 | 71,737,039 |
| පරිපාලන වියදම් | 22 | (92,731,503) | (86,058,557) |
| මෙහෙයුම් තුලින් ජනනය වු ලාභය | | 89,951,481 | (14,529,041) |
| ශුද්ධ මූල්‍ය ආදායම/(වියදම) | 23 | (29,043,670) | (20,649,655) |
| **බදු පෙර ලාභය** | | **60,907,811** | **(35,178,696)** |
| බදු වියදම් (වෙන්කිරිම්) | 24 | (13,511,396) | 2,876,786 |
| **වර්ෂය සඳහා ලාභය** | | **47,396,415** | **(32,301,910)** |
| **වෙනත් විස්තිර්ණ ආදායම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභය/(අලාභය) | 16 | 2,043,520 | (4,339,689) |
| **වර්ෂයට මුළු විස්තීර්ණ අදායම බදු පසු** | | **49,439,935** | **(36,641,599)** |
| කොටසක ඉපැයුම | 25.2 | 2.37 | (1.62) |
| වරහන් තුල ඇත්තේ අඩුකිරිමය | | | |

පිටු අංක 47 සිට 82 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශවනවලම කොටසක් වේ.

**හලාවත**
**2020 ජුලි මස13 වන දින**

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජනවසම වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම | 04 | 68,422,539 | 71,111,261 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම් කල්බදු ජෛව හිමිකම් හැර) | 05 | 857,864 | 893,651 |
| ජනවසම වතු යායන් වල ජෛව වත්කම් වල කල්බදු හිමිකම | 06 | 18,374,312 | 21,178,083 |
| කල් බදු දේපල සංවර්ධනය | 7.1 | 898,794,943 | 848,924,079 |
| ජෛව වත්කම් පශු සම්පත් | 7.2 | 15,405,500 | 18,694,952 |
| පාරිභෝජ්‍ය ජෛව වතකම් | 7.3 | 89,830,484 | 57,845,660 |
| සින්නක්කර දේපල, පිරියත හා උපකරන හිමිකම | 08 | 80,669,983 | 95,346,553 |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 5,881,336 | 6,864,344 |
| | | 1,178,236,961 | 1,120,858,583 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 09 | 67,383,469 | 56,610,036 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 10 | 42,760,113 | 27,450,756 |
| ආදායම් බදු ලැබිය යුතු | | 8,535,353 | 6,001,154 |
| රාජ්‍ය ව්‍යවසායයන් වලට සපයන ලද මූල්‍ය පහසුකම් | 11 | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 3,588,140 | 3,705,156 |
| වෙනත් ජංගම වත්කම් | | 638,557 | 1,715,111 |
| කෙටි කාලීන ආයෝජන | 12 | 105,000,000 | 80,624,822 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 6,185,420 | 8,359,059 |
| | | 234,091,051 | 184,466,095 |
| **මුළු වත්කම්** | | **1,412,328,012** | **1,305,324,678** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| කොටස් ප්‍රාග්ධනය | 13 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපැයීම | | 617,167,866 | 612,984,504 |
| දැව සංචිත | | 130,654,898 | 95,398,324 |
| මුළු ස්කන්ධය | | 947,822,774 | 908,382,839 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්භිත අදායම්** | | | |
| විලම්භිත බදු බැරකම | 14 | 111,959,742 | 98,448,346 |
| විලම්භිත ආදයම් - ප්‍රදාන හා ආධාර | 15 | 5,822,837 | 6,011,377 |
| විශ්‍රාමික ප්‍රතිලාභ පාරිතෝෂිත බැදීම් | 16 | 89,414,823 | 82,684,532 |
| කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 17 | 100,296,963 | 102,696,807 |
| | | 307,494,365 | 289,841,062 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 18 | 154,611,029 | 104,793,235 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 17 | 2,399,844 | 2,307,542 |
| | | 157,010,873 | 107,100,777 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,412,328,012** | **1,305,324,678** |

**වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය.**
පිටු අංක 47 සිට 82 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ.

**සනාථ කිරීම**
2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිලියෙල කර ඇති බව සහතික කරමි.

ආර්.එම්.ආර්.බී. රත්නායක මහතා
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි

මූල්‍ය වාර්ථා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබනු ලැබේ.

ආර්.ඩබ්ලිව්.එම්.ජේ.එස්.ආර්. පෙරේරා මහතා
(සභාපති/ප්‍රධාන විධායක නිලධාරී)

එන්.කේ.කේ. රාජසිංහ මහතා
(අධ්‍යක්ෂ)

හලාවත
2020 ජුලි මස13 වන දින

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| සටහන් | කොටස් ප්‍රාග්ධනය රු. | දැව සංචිත රු. | සමුච්චිත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 200,000,010 | 82,327,840 | 662,696,587 | 945,024,437 |
| 2018 වර්ෂයේ ලාභය | | | (32,301,910) | (32,301,910) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | | (4,339,689) | (4,339,689) |
| දැව සංචිතයට මාරු කිරීම් | - | 13,070,485 | (13,070,485) | |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **95,398,324** | **612,984,504** | **908,382,839** |
| 2017 සඳහා ලාභාංශ | - | | (10,000,000) | (10,000,000) |
| වර්ෂයේ ලාභය | | | 47,396,415 | 47,396,415 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 2,043,520 | 2,043,520 |
| දැව සංචිතයට මාරු කිරීම් | | 35,256,574 | (35,256,574) | - |
| මුළු විස්තිර්ණ ආදායම් | 200,000,010 | 130,654,898 | 617,167,866 | 947,822,774 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **130,654,898** | **617,167,866** | **947,822,774** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය.

පිටු අංක 47 සිට 82 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ.

**හලාවත**
**2020 ජුලි මස 13 වන දින**

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 රු. | 2018 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු / (යෙදවු) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | 60,907,811 | (35,178,696) |
| **ගැලපීම්:** | | |
| - ක්ෂයවීම්/ක්‍රමක්ෂයවීම් | 33,124,829 | 34,179,685 |
| - ප්‍රදාන සදහා වු ක්‍රමක්ෂයවීම් | (188,540) | (384,524) |
| - මූල්‍ය වියදම් | 39,886,905 | 35,847,724 |
| - මූල්‍ය ආදායම් | (10,843,235) | (15,198,069) |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා වෙන්කිරීම් | 17,154,766 | 14,839,503 |
| - දේපල පිරියත හා උපකරණ අපහරණය කිරිමෙන් ලත් ලාභය | (189,248) | - |
| - පාරිභෝජ්‍ය ජෛව වත්කම් ලාභ/අලාභ | (35,163,086) | (12,642,200) |
| - පොල් ගස් විකිණිමේන් ලද ලාභය | (23,667,318) | (17,647,958) |
| | 81,022,884 | 3,815,466 |
| **වෙනස්වීම්** | | |
| - තොගවල වැඩිවීම්/(අඩුවීම්) | (10,773,432) | 2,143,553 |
| - කිරි පශු සම්පත් | 3,289,452 | (2,598,340) |
| - පාරිභෝජ්‍ය ජෛව වත්කම් | | |
| - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (15,602,897) | (929,693) |
| - වෙනත් ජංගම වත්කම් | 1,076,555 | 11,452 |
| - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 287,473 | (16,914,410) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | 59,300,034 | (14,471,971) |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | (8,380,955) | (10,877,509) |
| - මූල්‍ය වියදම් ගෙවීම් | (2,077,336) | (43,180) |
| - මූල්‍ය ආදායම් ලැබිම් | 10,549,984 | 16,545,896 |
| - ආදයම් බදු ගෙවීම් | (2,534,199) | (3,354,313) |
| - දැවමය ගස් විකිණිමේන් ලද මුදල් | 3,178,263 | 9,370,715 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | 60,035,791 | (2,830,361) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වු මුදල් ප්‍රවාහය** | | |
| - දේපල පිරියත හා උපකරණ එකතු කිරිමෙන් | (2,310,154) | (11,530,663) |
| - ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | (60,580,869) | (80,037,794) |
| - පොල් ගස් විකිණිමෙන් ලද මුදල් | 23,756,233 | 17,766,094 |
| - සේවක ණය ප්‍රදානයන් | (3,300,000) | (3,730,000) |
| - සේවක ණය අයකර ගැනිම් ප්‍රදානයන් | 4,400,025 | 4,569,031 |
| - කෙටි කාලීන ආයෝජන | (375,178) | 21,687,678 |
| - දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබිම් | 200,513 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවු ශුද්ධ මුදල් ප්‍රවාහය** | (38,209,430) | (51,275,654) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු මූල්‍ය ප්‍රවාහය** | | |
| - ලාභාංශ ගෙවීම් | | (30,000,000) |
| - රාජ්‍ය කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවු ශුද්ධ මුදල් ප්‍රවාහය** | - | (30,000,000) |
| - **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් /(අඩුවිම්)** | 21,826,361 | (84,106,015) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන අ) | 8,359,059 | 92,465,074 |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන ආ) | **30,185,420** | **8,359,059** |
| **සටහන අ** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසර ආරම්භයේ | | |
| - කෙටි කාලීන ආයෝජන | | 88,000,000 |
| - මුදල් හා බැංකු ශේෂය | 8,359,059 | 4,465,074 |
| | **8,359,059** | **92,465,074** |
| **සටහන ආ** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසර අවසානයේ | | |
| - කෙටි කාලින ආයෝජන | 24,000,000 | |
| - මුදල් හා බැංකු ශේෂය | 6,185,420 | 8,359,059 |
| | **30,185,420** | **8,359,059** |

වරහන් තුල ඇත්තේ අඩුකිරිමිය.
පිටු අංක 47 සිට 82 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ.

**හලාවත**
**2020 ජුලි මස13 වන දින**

# 1 සංස්ථාපිත තොරතුරු

## 1.1 වාර්තාකරණ ස්ථිතිය

### 1.1.1 පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යලි ලියාපදිංචි කරන ලදී) සහ 1987 අංක 23 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර වතුයායවල් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය වසර තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

### 1.1.3 පරිපාලකය සහ අවසන් පරිපාලකය

සමාගමේ පරිපාලකය වනුයේ ශ්‍රී ලංකා රජයයි.

## 1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2020 ජූලි මස 13 වන දින දරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2019 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

# 2 සකස් කිරීමේ පදනම

## 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරන පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL) විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව සකසා ඇත.

## 2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 04, 05 සහ 06 දරන සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් එනම්, ජනවසම කල්බදු ගිවිසුම් යටතේ ඇති කල්බදු වත්කම් හැරුණු කොට ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. සුදුසු පරිදි විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල විස්තර කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවල ඇති උද්ධමනිය සාධක සඳහා ගැලපීමක් සිදු කර නැත.

## 2.3 භාවිතා කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිතා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මගින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

## 2.4 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාළ කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් යනාදියට බලපාන ඇස්තමේන්තු විනිශ්චය සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු ඓතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම්වය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කර ඇත. ඇස්තමේන්තු සංශෝධනය එම කාලපරිච්ඡේදයට හා අනාගත කාල වකවානුවට බලපාන්නේ නම් එම කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

### 2.5 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකාරීත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර නුදුරු අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත්විය. තව ද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වයට වාර්තා වී නොමැත. අඛණ්ඩ බව පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

### 2.6 සංසන්දනාත්මක තොරතුරු

ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගෙන යන අතර ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර ඇත.

### 2.7 වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සිද්ධීන්

වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සියලුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් යනු මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාල පරිච්ඡේදයක් ඇතුළත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන වත්කම් වේ. වාර්තා කරන දිනයේ සිට වසරක කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගමට රඳවා ගැනීමට සිදුවන වත්කම් ජංගම නොවන වත්කම් වේ.

#### 3.1.1 දේපළ, පිරියත හා උපකරණ

#### 3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහරණයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

**(අ) සන්තක දේපළ**

දේපළ, පිරියත හා උපකරණ ඒවා අත්පත් කර ගැනීමේ දී දැරූ සෘජු පිරිවැයයි. සමාගම විසින් ඉදිකරන ලද වත්කමක් නම් එම වත්කම අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒම දක්වා දැරූ සියලු පිරිවැය, එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා ඒ සඳහා සෘජුව දායක විය හැකි වෙනත් වියදම් ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරීත්වයට අදාළව මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනීත කර ඇත.

දේපළ, පිරියත හා උපකරණවල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාල සීමාවල දී මාරු කිරීම් සිදුකරන අවස්ථාවල දී පිළිවෙලින් එම කොටස් ඵලදායී ආයු කාලයක් හා ක්ෂය කළ හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම සැලකිය යුතු අන්දමින් පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී හඳුනා ගැනීමේ නිර්ණායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය දේපල පිරියත හා උපකරණවල ප්‍රතිෂ්ඨාවක් ලෙස ධාරණ අගයට එකතු කිරීමක් ලෙස හඳුනා ගනු ලැබේ. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීරණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිම් ප්‍රාග්ධනය, ඊට අදාළ

වත්කම්වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය. ප්‍රාග්ධන නොනිමි වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

**(ආ) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපළ, පිරියත හා උපකරණ ( බදු ගත් භාණ්ඩය හිමිකර ගැනීමෙන් සමාගමට අවධානමක් හෝ වාසියක් ඍජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම කල්බදු ගෙවීම් වල කල්බද්ද ආරම්භයේ තීරණය කරන ලද වර්තමාන වටිනාකමට සමාන අගයන්ගෙන් අඩු අගය මත ප්‍රාග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.

බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොළී ප්‍රමාණය එක් එක් වර්ෂයේ වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වයි. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොළී ගණනය වීම සිදුවේ.

බදු දේපළ වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාල පරිච්ජේදය තුළ ක්ෂය කරනු ලබයි.

**3.1.1.2 පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදී දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය විශ්වාසනිය ලෙස මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි. මෙලෙස ප්‍රතිෂ්ඨාපනය කරන ලද කොටස් වල ධාරණ අගය පහත දක්වා ඇති ප්‍රතිහඳුනාගැනීම් ප්‍රතිපත්තීන්ට අනුව ප්‍රතිහඳුනාගැනීම් සිදුකරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

**3.1.1.3 හඳුනා ගැනීම් ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී හෝ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැගෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. ඒ තුළින් ලැබෙන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයභාරය ලෙස වර්ගීකරණය නොකරයි.

**3.1.1.4 ක්ෂයවීම සහ ක්‍රමක්ෂය**

**(අ) ක්ෂයවීම්**

ක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා අතර දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමානයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10 | 10.00 |
| මෝටර් රථ | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| ස්ථිර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැටවල් | 03 | 33.33 |
| ජල සැපයුම | 20 | 5.00 |

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ගත් අවස්ථාවේ ආරම්භ වී එය අලෙවි සඳහා තබා ඇති බවට හෝ වත්කමක් ලෙස හඳුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රමය ඵලදායී ජීවිත කාලය හා ශේෂ වටිනාකම් වාර්තාකරන දිනයේ දී අවශ්‍ය වන්නේ නම් නැවත තක්සේරු කරනු ලබයි

(ආ) **ක්‍රමක්ෂය**

කල්බදු කාලය අවසන් වීමත් සමගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්වා විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ජනවසමෙන් බදු ගත් වත්කම්වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම මඟින් අත්කර ගත් වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස්වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත දැක්වෙන පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| හිස් ඉඩම් සඳහා කල් බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩමේ වැඩි දියුණු කිරීම | 30 | 3.33 |
| වෙනත් පවරා ඇති වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම | 20 | 5.00 |

### 3.1.2 ජීව විද්‍යාත්මක වත්කම්

### 3.1.2.1 නොමේරූ හා මේරූ වගාවන්

(අ) **නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගා)**

වැවිලි වතු පෞද්ගලීකරණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ UITF රීති නියමයන්ට අනුව ජනවසම වතුයායවල මූල්‍ය කල්බදු යටතේ නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගාවන්) 1992 ජුනි 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ගිණුම්වලට ගෙන ඇත.

කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශනය තුළ වර්තමාන සහ ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය පුරා සංසන්දනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| මේරූ වගාව | 30 | 3.33 |

(ආ) **කල්බදු දේපළ සංවර්ධනය කිරීම (නොමේරූ හා මේරූ වගා)**

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුනරුත්ථාපනය, අලුත් වගා කිරීම, නැවත වගා කිරීම, අන්තර් වගා කිරීම් සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙළීම දක්වා (වගා කර ඇති ප්‍රදේශ වසර 8 කට පසු මේරූ තත්ත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. මෙම නොමේරූ වගා ඍජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්ය පිරිවැය වලින් සමන්විත වේ. පවත්වාගෙන යන ජීව විද්‍යාත්මක වත්කම් (උදාඃ පොල්) වෙනුවෙන් දරණ ලද වියදම ඵල දරණ බවට පත් වන වර්ෂයේදී මේරූ වගාවන්ට මාරු කරනු ලබයි.

කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායී ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.

වර්ෂය තුල මේරූ වගා බවට පත්වන වගාවන් ඒවා නොමේරූ වගා ලෙස පැවති කාලය තුල ඒ වෙනුවෙන් දරණ ලද වියදම් වර්ෂය අවසානයේදී මේරූ වගා වෙත මාරු කර එහි ඵලදායී ජීවන කාලය පුරා පහත පරිදි ක්ෂය කරනු ලබයි.

නොමේරූ වගා කාලය වර්ථමාන හා විස්තීර්ණ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය පහත පරිදි වේ. (ඵලදායී ආයු කාලය නොමේරූ කාලයෙන් පසුව ගණනය කරනු ලබයි)

| | නොමේරූ කාලය වසර ගණන | ආයු කාලය වසර ගණන | ක්ෂයවීම අනුපාතිකය % |
|---|---|---|---|
| පොල් | 08 | 50 | 2% |
| කජු | 08 | 25 | 4% |
| ඩ්‍රැගන් ෆෘට් | 03 | 20 | 5% |
| කුරුඳු | 04 | 20 | 5% |
| ගම්මිරිස් | 06 | 20 | 5% |
| රඹුටන් | 06 | 20 | 5% |
| අඹ | 08 | 20 | 5% |

**(ඇ) පාරිභෝජ්‍ය ජෛව වත්කම්**

පාරිභෝජ්‍ය ජෛව වත්කම් යටතේ ගැනෙන දැව ගස් මූලික ප්‍රභව හඳුනා ගැනිමේදී මිනුම් කරන අතර එක් එක් වාර්තා කරන කාල සීමාව අවසානයේ ශ්‍රිලංකා ගිණුම් කරන ප්‍රමිත 41 අනුව විකිනීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස් වල සාධාරණ වටිනාකම වර්තමාන දැව වල ගනන් හා එම දැව ගස් පරිනත තත්වයට පත් වූ විට එම දැව ගස් වලින් අපේක්ෂා කරන දැව පරිමාව සැලකිල්ලට ගනිමින් වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රමය (DFC) යොදා ගෙන ගණනය කරනු ලබයි.

නොමේරූ ගස් වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි. මෙම ගණනය කිරිම සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරු කරුවෙකු විසින් කරනු ලබයි.

පාරිභෝජ්‍ය ජෛව වත්කම් මූලික/ප්‍රථම හඳුනාගැනිමේදි හඳුනාගනු ලබන ලාභ හෝ අලාභ සහ ඉන් පසුව එම වතකම් වල සාධාරණ අගය වෙනස් වීම හේතු කොට ගෙන ඇතිවන්නා වූ කාලච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශ තුල හදුනා ගනු ලබයි.

මේ හා සම්බන්ධ අනෙකුත් සියලුම උපකල්පන ගිණුම් සටහන් අංක 7.3 හි දක්වා ඇත.

වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රමය/ ආකෘතිය (DFC) තුල අවධානය යොමු කොට ඇති ප්‍රධාන විචල්‍යයන්.

| විචල්‍ය | විස්තරය |
|---|---|
| මුදල් ඒකකය | ශ්‍රි ලංකා රුපියල් |
| දැව පරිමාව | උස හා වට ප්‍රමාණය භෞතිකව තහවුරු කර ගැනිමෙන් හා විවිධ භූගෝලිය ප්‍රදේශයන් තුල එක් එක් දැව වර්ගයෙහි වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදුකරයි මෙහිදි දැව හෙලීමට අදාල බලපවත්වනු ලබන සියලුම ව්‍යවස්ථාපිත විධි විධාන සැලකිල්ලට ගනු ලබයි. |
| ආර්ථීක ඵලදායි කාලය | සමාගමේ වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය තීරණය කරනු ලබයි. |
| විකුණුම් මිල | ශ්‍රි ලංකාවේ පවතින වෙළඳ පොල මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. මෙහිදි දැවගස් විකුණුම් තත්වයට පත්කිරිම සඳහා සම්පුර්ණ කලයුතු සියලුම අවශ්‍යතා පිළිබඳව සලකා බලයි. |
| වට්ටම් අනුපාතය | අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ.<br>- අස්වැන්න නෙලන වයස අවුරුදු 5 හෝ 5 ට අඩු 14%<br>- අස්වැන්න නෙලන වයස අවුරුදු 6 ත් 15ත් අතර නම් 15%<br>- අස්වැන්න නෙලන වයස අවුරුදු 15 වැඩිනම් 16% |

#### 3.1.2.2 ගව පශු සම්පත

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

### 3.1.3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගයසේ සැලකේ. පවතින තත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.

"විකිණීමට වෙන්කර ඇති දෑ" ලෙස වර්ගීකරණය කළ දේපළ, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

### 3.1.4 තොගය

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත යල්පැනුම් හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තන සිදු කර සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

තොගය වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කර ගණනය කරනු ලැබේ.

| පාරිභෝජන සහ අමතර ද්‍රව්‍ය යෙදවුම් | පෙර ලැබීම් පෙර නිකුත් පදනම මත සත්‍ය පිරිවැය |
|---|---|
| පැළ තවාන් සහ බෝග වැවීම | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය පිරිවැය හා සෘජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය. |
| නෙලාගත් අස්වැන්න | ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙලා ගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර නෙලාගත් අවස්ථාවේ අගය කරයි.<br>අර්ධ නිමි සහ නිමි කෘෂිකාර්මික තොග අගය කිරීමේදී කෘෂි නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කර අගය කරයි. |
| පශු සම්පත් | කිරි පශු සම්පත් තොග මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කිරීමෙනි.<br>කිරි පශු සම්පතේ සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව තීරණය කරනු ලැබේ. |

### 3.1.5 මූල්‍ය උපකරණ

#### 3.1.5.1 හඳුනා ගැනීම සහ මූලික මිනුම්

වෙළඳ ලැබිය යුතු දේ මුලින්ම හඳුනාගනු ලබන්නේ ඒවායෙහි ආරම්භයේදීය. අනකුත් සියළුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මුලින්ම හඳුනාගනු ලබන්නේ සමාගම එම උපකරණයෙහි ගිවිසුම්ගත විධි විධාන වල පාර්ශවකරුවෙකු වන විටදීය.

මූල්‍ය වත්කමක් (එය සැළකිය යුතු මූල්‍ය දායකත්වයන් නොමැති වෙළඳ ලැබිය යුතු දෙයක් නොවන විට) හෝ මූල්‍ය වගකීමක් මුලින්ම මනිනු ලබන්නේ සාධාරණ අගය සමඟ වන අතර, FVTPL නොවන අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපනය වන ගණුදෙනු පිරිවැයෙන් වේ. සැළකිය යුතු මූල්‍ය දායකත්වයක් උපාංගයක් නොමැති වෙළඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී මනිනු ලබන්නේ ගණුදෙනුවෙහි මිළටය.

**3.1.5.2 වර්ගීකරණය සහ පසුකාලීන මැනීම**

**3.1.5.2.1 මූල්‍ය වත්කම්**

i) ප්‍රතිපත්තිය 2018 ජනවාරි 1 දින සිට අදාල වේ.

මූල්‍ය වත්කමක ආරම්භක හඳුනා ගැනීම සිදු කරනුයෙ, ක්‍රමක්ෂය පිරිවැය; FVOCI – ණය ආයෝජනය; FVOCI – ස්කන්ධ ආයෝජනය; හෝ FVTPL අනුව මැන වර්ගීකරණය කිරීමෙනි.

මූල්‍ය වත්කම් ඒවායෙහි හඳුනාගැනීමට පසුව ප්‍රතිවර්ගීකරණය නොකරන විටදී සමාගම මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා ඔවුන්ගේ ව්‍යාපාරික ආකෘතිය වෙනස් නොකරන්නේ නම්, එම අවස්ථාවේදී බලපෑමට ලක්වූ සියළුම මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියේ වෙනස්වීමෙන් පසු එළඹෙන ප්‍රථම වාර්තාකරණ කාල පරිච්ඡේදයේ පළමුවන දිනයේ ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPL හි නම් කර නොමැති නම් ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ;

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබාගැනීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුල එය පවත්වනු ලැබේ; සහ
- එහි ගිවිසුම්ගත කොන්දේසි මඟින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන්ට හුදෙක්ම බලපානු ලබන්නේ ගෙවිය යුතු මුල් මුදල සහ මුල් මුදල සඳහා වන පොළී මුදල්වේ.

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPL හි නම්කර නොමැති නම්, ණය ආයෝජනයක් FVOCI යටතේ මනිනු ලැබේ;

- එය පවත්වනු ලබන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකෙන් අරමුණු සාක්ෂාත් කරගනු ලබන ව්‍යාපාරික ආකෘතියක් තුල සහ
- එහි ගිවිසුම්ගත නියමයන් මඟින් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන් සඳහා හුදෙක්ම බලපානු ලබන්නේ ගෙවිය යුතු මුල් මුදල සහ මුල් මුදල සඳහා වන පොළී මුදල්වේ.

වෙළඳම සඳහා රඳවාගෙන නොමැති ස්කන්ධ ආයෝජනයක් ආරම්භක හඳුනා ගැනීම මත, OCI හි ආයෝජනයේ සාධාරණ අගයෙහි පසු කාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමාගම විසින් වෙනස් කළ නොහැකි ලෙස තෝරාගත හැකිය. මෙම තෝරා ගැනීම සිදුකරනු ලබන්නේ ආයෝජන - අනුව - ආයෝජන පදනම මතය.

ඉහත විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ FVOCI අනුව මනිනු ලැබ වර්ගීකරණය නොකරන ලද සියළුම මූල්‍ය වත්කම් FVTPL අනුව මනිනු ලැබේ. සියළුම ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මෙයට ඇතුලත් වේ. ආරම්භක හඳුනා ගැනීම මත සමූහය විසින් අවලංගු කළ නොහැකි ලෙස මූල්‍ය වත්කම් නම් කරනු ලැබිය හැකිය. එසේ නොමැති නම් ක්‍රමක්ෂය පිරිවැයෙන් හෝ FVOCI

අනුව හෝ FVTPL අනුව මැනිය යුතු අවශ්‍යතා සපුරාලන විටදී සමාගම විසින් එසේ කිරීමෙන් පැන නැඟිය හැකි ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීම හෝ සැළකිය යුතු ලෙස අඩුකිරීම සිදු කරයි.

අ) ව්‍යාපාර ආකෘති ඇගයීම

මූල්‍ය වත්කම් කළඹ මට්ටමක් ලෙස පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියේ අරමුණු ඇගයීම සමාගම විසින් සිදුකරනු ලබන්නේ මෙමගින් ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයන ආකාරය මනාව පිළිබිඹු කරන බැවිනි. සළකා බැලූ තොරතුරුවලට ඇතුලත් වන්නේ,

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති හා අරමුණු සහ එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම. මෙයට ගිවිසුම්ගත පොළී ආදායම් උපයා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ උපාය මාර්ග යොමුවී තිබීම, විශේෂිත පොළී අනුපාත පැතිකඩක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාල සීමාව අදාල වගකීම්වල කාලයට ගැලපීම හෝ අපේක්ෂිත මුදල් පිටතට ගලායෑම හෝ වත්කම් විකිණීමෙන් මුදල් ප්‍රවාහයන් සාක්ෂාත් කර ගැනීම යන කරුණු ඇතුලත්වේ.
- කළඹෙහි ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක්කර සමාගමේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද?
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ ව්‍යාපාර ආකෘතිය තුල ඇති මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද?
- පූර්ව කාල පරිච්ඡේදයන්හි මූල්‍ය වත්කම් විකිණීමේ වාර ගණන, පරිමාව සහ වේලාව, එවැනි විකුණුම් සඳහා හේතුව සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාව.

සමූහයේ වත්කම් අඛන්ඩව හඳුනාගැනීමට අනුකූලව ප්‍රතිහඳුනාගැනීම සඳහා සුදුසුකම් නොලබන ගණුදෙනුවල මූල්‍ය වත්කම් තෙවන පාර්ශවයකට පැවරීම මෙම අරමුණු සඳහා විකුණුම් ලෙස නොසැළකේ.

වෙළඳාම සඳහා තබා ඇති හෝ කළමනාකරණය කරනු ලබන සහ සාධාරණ අගයක් මත කාර්ය සාධනය ඇගයීමට ලක් කරන මූල්‍ය වත්කම් FVTPLහි මනිනු ලැබේ.

ආ) පසුකාලීන මිනුම් සහ ප්‍රතිලාභ හා අලාභ

| | |
|---|---|
| FVTPLහි මූල්‍ය වත්කම් | මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. ඕනෑම පොළියක් හෝ ලාභාංශ ආදායමක් ඇතුළුව ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. |
| ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම් | මෙම වත්කම් පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. හානිකරණ අලාභ හේතුවෙන් ක්‍රමක්ෂය පිරිවැය අඩුවේ. පොළී ආදායම සහ හානිකරණය, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන ඇත. ප්‍රතිහඳුනාගැනීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. |
| FVOCIහි ණය ආයෝජන | මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමය භාවිතා කර ගණනය කරනු ලබන පොළී ආදායම සහ හානිකරණය, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ. අනෙකුත් ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ, OCIහි හඳුනාගෙන ඇතග ප්‍රතිහඳුනාගැනීමේදී OCIහි එකතුවී ඇති ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස ප්‍රති වර්ගීකරණය කෙරේ. |
| FVOCIහි ස්කන්ධ ආයෝජන | මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයකින් මනිනු ලැබේ. ලාභාංශ පැහැදිලිවම ආයෝජන පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් නියෝජනය නොකරන්නේ නම් ලාභාංශ, ලාභයේ හෝ අලාභයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ OCIහි හඳුනාගෙන ඇති අතර, ඒවා කිසි විටකත් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ. |

(ii) 2018 ජනවාරි 1 දිනට පෙර අදාලවූ ප්‍රතිපත්තිය

සමාගම සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩ වලට වර්ගීකරණය කර ඇත.

- ණය සහ ලැබිය යුතුදේ
- පරිනත භාවයට පත්වීම
- විකිණීමට ඇති දේ සහ
- FVTPL හි සහ මෙම කාණ්ඩය තුල
- වෙළඳාම සඳහා පවතින
- FVTPL හි නම්කර ඇති

**අ) පසුකාලීන මිනුම් සහ ප්‍රතිලාභ හා අලාභ**

| | |
|---|---|
| FVTPL හි මූල්‍ය වත්කම් | කිසියම් පොළී හෝ ලාභාංශ ආදායම් සහ එහි වෙනස්කම් ඇතුළුව සාධාරණ අගයකින් මනිනු ලබන අතර, ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගෙන ඇත. |
| පරිනත භාවයට පත්වන මූල්‍ය වත්කම් | සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. |
| ණය සහ ලැබිය යුතුදේ | සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | හානිකරණ පාඩු හැරුණු විට සාධාරණ අගයකින් සහ එහි සිදුවන වෙනස්කම් වලින් මනිනු ලැබේ. පොළී ආදායම සහ ණය උපකරණ වල විදේශ මුදල් වෙනස්කම් OCI හි හඳුනාගෙන ඇති අතර සාධාරණ අගය සංචිතයෙහි එකතුවී ඇත. මෙම වත්කම් ප්‍රතිහඳුනාගන්නා විට, ස්කන්ධයට එකතුවී ඇති ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය කරන ලදී. |

**3.1.5.2.2 මූල්‍ය වගකීම්**

**I) වර්ගීකරණය, පසුකාලීන මිනුම් සහ ප්‍රතිලාභ හා අලාභ**

මූල්‍ය වගකීම් FVTPL හි ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. මූල්‍ය වගකීමක් FVTPL හි වර්ගීකරණය කර තිබෙන විට එය වෙළඳාම සඳහා රඳවාගෙන ඇති ලෙසට වර්ගීකරණය කර ඇත්නම්, එය ව්‍යුත්පන්නයක් හෝ මූලික හඳුනාගැනීම මත එය නම්කර ඇත. FVTPL හි මූල්‍ය වගකීම් කිසියම් පොළී වියදම් ඇතුළුව ශුද්ධ ප්‍රතිලාභ සහ අලාභ සාධාරණ අගයකින් මනිනු ලබන අතර, ලාභය හෝ අලාභය ලෙසට හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය වගකීම් පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. පොළී වියදම් සහ විදේශ විනිමය ප්‍රතිලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ. ප්‍රතිහඳුනාගැනීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභය හෝ අලාභය තුලද හඳුනාගැනේ.

**3.1.5.3 ප්‍රතිහඳුනාගැනීම**

**3.1.5.3.1 මූල්‍ය වත්කම්**

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත්වූ විට හෝ මූල්‍ය වත්කම් වල හිමිකාරිත්වයෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කරනු ලබන ගණුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරනවිට හෝ සමාගම විසින් එහි හිමිකාරිත්වයෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර, මූල්‍ය වත්කම් පාලනය කිරීම ද රඳවා නොගන්නා විට සමාගම විසින් මූල්‍ය වත්කම් ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

සමාගම සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් ලෙසට හඳුනා ගෙන මාරු කරන ලද ගණුදෙනුවලට ඇතුලත් කරන නමුත් මාරු කරන ලද වත්කම් වල සියළු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම රඳවා ගනී.

මෙම අවස්ථාවලදී වත්කම් මාරු කරනු ලැබේ. මෙම අවස්ථාවලදී, මාරු කරන ලද වත්කම් ඉවත් කිරීම සිදුකරනු නොලැබේ.

**3.1.5.3.2 මූල්‍ය වගකීම්**

ගිවිසුම්ගත බැඳීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත්වූ විට සමාගම මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබයි. මූල්‍ය වගකීමක නියමයන් වෙනස් කරන විට සහ වෙනස් කරන ලද වගකීම්වල මුදල් ප්‍රවාහයන් සැළකිය යුතු ලෙස වෙනස් වන විටද සමාගම මූල්‍ය වගකීමක් ඉවත් කරන අතර, එම අවස්ථාවේදී වෙනස් කරන ලද නියමයන් මත පදනම්වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයකින් හඳුනාගනී.

මූල්‍ය වගකීමක් ඉවත් කිරීමේ දී, නිරුද්ධවූ ධාරණ අගය සහ ගෙවූ ප්‍රතිශ්‍යාව අතර වෙනස ( මාරු කරන ලද උපකල්පිත යම් මුදල් නොවන වත්කම් හෝ වගකීම් ඇතුළුව) ලාභය හෝ අලාභය ලෙස හඳුනාගැනේ.

**3.1.5.4 හිලව්කිරීම**

සමාගමට දැනට මුදල් හිලව් කිරීමට නිත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබීම සහ එය ශුද්ධ පදනමක් මත පියවා දැමීමට හෝ වත්කම සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම එකවර පියවීමට අදහස් කරන්නේ කවර දිනකදීද, එදිනට මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පියවා ඇති අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ශුද්ධ මුදල ඉදිරිපත් කර ඇත.

**3.1.5.5 හානිකරණය - මූල්‍ය වත්කම්**

**ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්**

ප්‍රතිපත්තිය 2018 ජනවාරි 1 දින සිට අදාලවේ.

**3.1.5.5.1 මූල්‍ය උපකරණ සහ ගිවිසුම් වත්කම්**

වෙළඳ ලැබිය යුතුදේ සඳහා වන අලාභ දීමනා සැම විටම මනිනු ලබන්නේ ජීවිත කාලීන අපේක්ෂිත ණය අලාභයට (ECL) සමාන මුදලකටය.

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න තීරණය කිරීමේදී සහ ECL තක්සේරු කිරීමේදී සමාගම අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව අදාල සහ ලබාගත හැකි සාධාරණ සහ සහාය තොරතුරු සළකා බලයි. සමාගමේ ඓතිහාසික අත්දැකීම් මත පදනම්ව සහ දැනුවත් ණය තක්සේරුව සහ ඉදිරි දැක්ම තොරතුරු ඇතුළුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ විශ්ලේෂණය මෙයට ඇතුලත්වේ.

නියමිත දිනට දින 365කට වඩා කල් ඉකුත්වී ඇත්නම් මූල්‍ය වත්කමක ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩිවී ඇති බවට සමාගම උපකල්පනය කරයි.

මූල්‍ය වත්කමක පැහැර හැරීමක් ඇති බවට සමාගම සළකනුයේ,

- ණයගැතියා හට සමාගමෙන් කිසිදු උපකාරයක් නොමැතිව සමාගම වෙත සිය ණය බැඳීම් සම්පූර්ණයෙන්ම ගෙවීමට අපහසු වනවිට, සමාගමට සුරකුම් උපලබ්ධි කිරීම වැනි ක්‍රියා රාශියක් ගැනීමට සිදුවේ (කිසියම් දෙයක් රඳවාගෙන ඇත්නම්) හෝ
- මූල්‍ය වත්කම දින 180කට වඩා කල් ඉකුත්වීම.

  ජීවිත කාලය පුරාවට ඇති ECL යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ආයු කාලය පුරාවටම සිදුවිය හැකි සියළු පැහැර හැරීමේ සිදුවීම්වල ප්‍රතිඵලයක් වන ECL ය.

මාස 12 ක ECL යනු ECL හි කොටසක් වන වාර්තා කළ දිනට පසුව වන මාස 12 ක් තුල සිදුවිය හැකි පැහැර හැරීම් සිදුවීම් වේ. (හෝ උපකරණයේ අපේක්ෂිත ආයු කාලය මාස 12ට වඩා අඩුනම්, කෙටි කාලයක්).

ECL තක්සේරු කිරීමේදී සළකා බැලිය හැකි උපරිම කාල සීමාව වන්නේ සමාගම ණය අවදානමට අනාවරණය වන උපරිම ගිවිසුම් කාලයයි.

3.1.5.5.2 ECL මැනීම

ECL යනු ණය අලාභ පිළිබඳ - සම්භාවිතාවයෙහි බර තැබූ තක්සේරුවකි. ණය අලාභ මනිනු ලබන්නේ සියළුම මුදල් හිඟයන්හි වර්තමාන අගය ලෙසටය. (එනම්, ගිවිසුමට අනුකූලව අස්තිත්ත්වය විසින් ඇති කරන මුදල් ප්‍රවාහයන් සහ සමාගම ලැබීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනසයි).

ECL වට්ටම් කරනු ලබන්නේ මූල්‍ය වත්කම් වල සඵල පොළී අනුපාතයටය.

3.1.5.5.3 **ණය - හානිවූ මූල්‍ය වත්කම්**

සෑම වාර්තාකරණ දිනයකදීම, සමාගම විසින් මූල්‍ය වත්කම් ධාරණය කරනුයේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ ද සහ FVOCIහි ණය සුරකුම් පත් හානිවූ ණය අනුවද යන්න තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපාන සිදුවීම් එකක් හෝ කීපයක් සිදුවූ විට මූල්‍ය වත්කමක් ''හානිවූ ණය'' ලෙස සැළකේ.

මූල්‍ය වත්කමක් හානිවූ ණයක් බවට පත්වී ඇති බවට පහත දැක්වෙන දත්ත නිරීක්ෂණය කිරීමෙන් හැකිවේ.

- ණය ගැනුම්කරුගේ හෝ නිකුත් කරන්නාගේ සැළකියයුතු මූල්‍ය දුෂ්කරතා.
- පැහැර හැරීම හෝ දින 180කට වඩා කල් ඉකුත්වීම වැනි ගිවිසුම් කඩ කිරීම
- සමාගම වෙනත් ආකාරයකින් නොසළකන කොන්දේසි මත සමාගම විසින් ණයක් හෝ අත්තිකාරමක් ප්‍රතිව්‍යුහගත කිරීම.
- ණය ගැනුම්කරු බුන්වත් භාවයට පත්වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළුවීමට ඉඩ ඇතිබව හෝ
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආරක්ෂාවීම සඳහා ක්‍රියාකාරී වෙළඳපලෙන් අතුරුදහන් වීම

3.1.5.5.4 **මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ECL සඳහා දීමනාවක් ඉදිරිපත් කිරීම**

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනාව වත්කම් වල දළ ධාරණ අගයේ ප්‍රමාණයෙන් අඩුකරනු ලැබේ.

3.1.5.5.5 **ලියාහැරීම්**

මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් සමාගමට නොමැති විට මූල්‍ය වත්කමක දළ ධාරණ අගය ලියා හරිනු ලැබේ. එක් එක් ගණුදෙනුකරුවෙකුගෙන්, සමාන වත්කම් අයකර ගැනීමේ ඓතිහාසික අත්දැකීම් මත පදනම්ව මූල්‍ය වත්කම් දින 180ක් ඉක්මවා කල් ඉකුත්වූ විට දළ ධාරණ අගය ලියා හැරීමේ ප්‍රතිපත්තියක් සමාගම සතුව ඇත. ආයතනික ගණුදෙනුකරුවන් සඳහා, අයකර ගැනීම පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් තිබේද යන්න මත පදනම්ව, ලියාහැරීමේ කාලය හා මුදල සම්බන්ධයෙන් සමාගම විසින් තනි තනිව තක්සේරුවක් සිදුකරයි. ලියා හරින ලද මුදලින් සැළකිය යුතු අයකිරීමක් සමාගම අපේක්ෂා නොකරයි. කෙසේ වෙතත්, ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සමාගමේ ක්‍රියා පටිපාටි වලට අනුකූලවීම සඳහා ලියා හරින ලද මූල්‍ය වත්කම් තවදුරටත් බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වලට යටත් විය හැකිය.

**හානිකරණ ප්‍රතිපත්තිය - මූල්‍ය වත්කම් (ලැබිය යුතුදේ ඇතුළුව) 2018 ජනවාරි 1 දිනට පෙර අදාලවේ.**

ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයක් සිදු නොවන මූල්‍ය වත්කමක්, එය හානිවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි තිබේද යන්න තීරණය කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරනු ලැබේ. වත්කම් මුලින් හඳුනා ගැනීමෙන් පසු අලාභ සිදුවීමක් සිදුව ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ නම් සහ අලාභ සිදුවීම විශ්වාසදායක ලෙස තක්සේරු කළහැකි එම වත්කමෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපා ඇත්නම් මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇත.

මූල්‍ය වත්කම් (ස්කන්ධ සුරකුම්පත් ඇතුළුව) හානිවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි වලට ණයගැතියෙකු විසින් සිදුකළ පැහැර හැරීමක් හෝ වරදක්, සමාගම විසින් වෙනත් ආකාරයකින් නොසළකන කොන්දේසි මත සමාගමට ගෙවිය යුතු මුදලක් ප්‍රතිව්‍යුහගත කිරීම, ණයගැතියෙකු හෝ නිකුත් කරන්නෙකු බුන්වත් භාවයට පත්වන බවට හැඟවීම හෝ ආරක්ෂාවීම සඳහා ක්‍රියාකාරී වෙළඳපලෙන් අතුරුදහන් වීම ඇතුලත් විය හැකිය. මෙයට අමතරව, ස්කන්ධ සුරකුම්පත්වල ඇති ආයෝජනයක් සඳහා, එහි සාධාරණ අගයෙහි සැළකිය යුතු හෝ දීර්ඝකාලීන අඩුවීමක්, හානිය පිළිබඳ විෂයානුබද්ධ සාක්ෂයකි.

ලැබිය යුතුදේ සඳහා නිශ්චිත වත්කම් හා සාමුහික මට්ටමෙන් යන දෙයාකාරව සිදුවන හානිය පිළිබඳව වූ සාක්ෂි සමාගම විසින් සළකා බලනු ලැබේ. විශේෂිත හානිකරණය සඳහා තනි තනිව සැළකිය යුතු ලැබීම් සියල්ලම තක්සේරු කරනු ලැබේ. තනි තනිව සැළකිය යුතු ලැබීම් විශේෂයෙන් දුර්වල නොවන බව සොයාගත් පසු, සිදුවී ඇති නමුත්, තවමත් හඳුනාගෙන නොමැති ඕනෑම හානියක් සඳහා සාමුහිකව තක්සේරු කරනු ලැබේ. ලැබිය යුතුදේ සමාන අවදානම් ලක්ෂණ සහිතව කාණ්ඩගත කිරීමෙන් තනි තනිව සැළකිය යුතු නොවන ලැබිය යුතුදේ සාමුහිකව හානිය සඳහා තක්සේරු කරනු ලැබේ.

සාමුහික හානිකරණය තක්සේරු කිරීමේදී සමාගම විසින් පැහැර හැරීමේ සම්භාවිතාවය, අයකර ගැනීමේ වේලාව සහ අලාභයේ ප්‍රමාණය පිළිබඳ ඓතිහාසික ප්‍රවනතා භාවිතා කරන අතර, වර්තමාන ආර්ථිකය සහ ණය කොන්දේසි ගලපමින් සත්‍ය අලාභල ඓතිහාසික ප්‍රවනතා අනුව යෝජනාවූ ප්‍රමාණයට වැඩි හෝ අඩු වියහැකි බවට කළමනාකාරිත්වයේ විනිශ්චය අනුව සංශෝධනය කරනු ඇත.

ක්‍රමක්ෂය පිරිවැයකින් මනිනු ලබන මූල්‍ය වත්කමකට සිදුවන හානිකරණ අලාභය ගණනය කරනු ලබන්නේ වත්කම්වල මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ ධාරණ අගය සහ වර්තමාන අගය අතර වෙනස ලෙසය. අලාභ, ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇති අතර, ලැබිය යුතුදේට එරෙහිව දීමනා ගිණුමක පිළිබිඹුවේ. හානියට පත් වත්කම් සඳහා නොදැනීම තුලින් පොළිය, වට්ටම් දිගටම හඳුනාගැනේ. පසුකාලීන සිදුවීමක් මගින් සහ හානිකරණ අලාභයේ ප්‍රමාණය අඩුවූ විට, හානිකරණ අලාභ අඩුවීම සඳහා ලාභය හෝ අලාභය හරහා ආපසු හරවනු ලැබේ.

**3.2.1 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති**

සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වන්නේ වෙළඳාම සහ වෙනත් ගෙවියයුතු දේ, සහ ගෙවියයුතු ආදායම් බදු වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගමට රාජ්‍ය ව්‍යවසායයන් සහ වෙළඳාම හා වෙනත් ලැබියයුතු දේ සහ එහි මෙහෙයුම් වලින් ඍජුව ලැබෙන මුදල් සහ කෙටිකාලීන තැන්පතු සඳහා ණය ලබාදී ඇත. ඒ අනුව සමාගම එහි මූල්‍ය උපකරණ භාවිතා කරමින් ණය අවදානම, ද්‍රවශීලතා අවදානමල විනිමය අවදානම සහ පොළී අනුපාත අවදානමට නිරාවරණයවී ඇත. ඉහත සඳහන් එක් එක් අවදානම් වලට සමාගම නිරාවරණයවීම, සමාගමේ අරමුණ, අවදානම් මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලියක් පිළිබඳ තොරතුරු මෙම සටහන මගින් ඉදිරිපත් කෙරේ.

**3.2.1.1 ණය අවදානම**

ණය අවදානම යනු ගණුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක පාර්ශවකරුවෙකු එහි ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් සමාගමට මූල්‍යමය අලාභයක් වීමේ අවදානමක් ඇතිවන අතර, ප්‍රධාන වශයෙන් ඒවා පැන නගින්නේ සමාගමට ලැබියයුතු ගණුදෙනුකරුවන්ගෙනි.

**3.2.1.2 ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබාදීමෙන් පියවා ඇති මූල්‍ය වගකීම් හා බැඳීම් ඉටු කිරීමේදී සමාගමට දුෂ්කරතා ඇතිවීමේ අවදානමයි.

ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වන්නේ, පිළිගත නොහැකි අලාභයන් හෝ සමාගමේ කීර්තිනාමයට හානියක් නොවී, සාමාන්‍ය හා ආතති තත්ත්වයන් යටතේ නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

**3.2.2 සේවක ප්‍රතිලාභ**

**(අ) නිවර්චිත දායක සැලසුම් - අර්ථ සාධක අරමුදල සහ භාරකාර අරමුදල**

නිර්වචනය කරන ලද දායක සැලැස්ම යනු පශ්චාත් රැකියා සැලැස්මක් වන අතර, ඒ යටතේ අස්තිත්ත්වයක් විසින් වෙනත් අස්තිත්ත්වයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර, ඊට වැඩි මුදලක් ගෙවීමට නීතිමය හෝ ව්‍යුහාත්මක බැඳීමක් නොමැත. සියළුම සේවකයින් ආවරණය වන අර්ථ සාධක සහ භාරකාර අරමුදල් සඳහා වන දායකත්වය සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදයන්හිදී ලාභ සහ අලාභයෙහි වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

සමාගම එවැනි සේවකයින්ගේ ඒකාබද්ධ වැටුපෙන් 12%ක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සහ එම සේවකයින්ගේ ඒකාබද්ධ වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට දායකවේ.

**(ආ) නිවර්චිත ප්‍රතිලාභ සැලැස්ම**

නිවර්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචනය කරන ලද දායක සැලැස්මක් හැරුණුවිට ඇති පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිවර්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය තීරණය වන්නේ ආයුගණන තක්සේරු කිරීම් භාවිතා කරමිනි. ආයුගණන තක්සේරුවට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ කාර්ය මණ්ඩල පිරිවැටුම පිළිබඳ උපකල්පන ඇතුලත්වේ. එම බැඳීම්වල ඇති දිගුකාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැළකියයුතු අවිනිශ්චිතතාවයකට යටත්වේ. ඇස්තමේන්තුවල භාවිතාවන ප්‍රධාන උපකල්පන පිළිබඳ විස්තර සටහන 16 හි අඩංගුවේ.

ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පත් මගින් අරමුදල් වෙන් කර ඇත.

## 3.3 විලම්බිත ආදායම්

**ප්‍රදාන සහ සහනාධාර**

ප්‍රදානය ලැබෙන බවට සහ අමුණා ඇති සියළුම කොන්දේසි වලට අනුකූලවීම පිළිබඳව සාධාරණ සහතිකයක් ලැබීම අනුව රජයේ ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට සම්බන්ධවූ විට, එය ප්‍රදාන ලබාදීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ගැලපීමට අවශ්‍ය කාලසීමාව තුල ආදායමක් ලෙස හඳුනාගැනේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වනවිට, එය විලම්බිත ආදායමක් ලෙස හඳුනාගෙන අදාල වත්කම්වල අපේක්ෂිත ඵලදායි ජීවිත කාලයට සමාන ප්‍රමාණයකින් ආදායමට මුදාහරිනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ වලට අදාල ප්‍රදාන මුලින් විලම්බිත කරන අතර, අදාල දේපල, පිරියත සහ උපකරණ වල ඵලදායි ජීවිත කාලයට සමානව ක්‍රමානුකූල පදනමක් මත ආදායමට වෙන්කරනු ලැබේ.

වත්කම්, ඒවායෙහි ඵලදායි ජීවිත කාලය තුල හෝ කල් ඉකුත් නොවූ කල්බදු කාලසීමාව තුල යන ඒවායින් අඩු ප්‍රමාණයට පහත පරිදි ක්‍රම ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| ජල සම්පාදන | වසර 20 යි |
| මෝටර් රථ | වසර 05 යි |
| ලී බඩු සහ සවිකිරීම් | වසර 10 යි |
| උපකරණ | වසර 08 යි |

## 3.4 ආදායම් සහ වියදම්

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා වියදම් ශ්‍රිතය අනුගමනය කරනු ලබන්නේ, එමගින් සමාගමෙහි කාර්ය සාධනයේ මූලිකාංගයන් සාධාරණ ප්‍රමාණයෙන් ඉදිරිපත් කරන බැවිනි.

### 3.4.1 ආදායම් හඳුනාගැනීම

SLFRS 15 මගින් කොපමණ ප්‍රමාණයකින්, කවදා ආදායම හඳුනාගෙන තිබේද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් සපයයි. එමගින් LKAS 18 ආදායම්, LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ අදාල අර්ථ නිරූපනයන් ආදේශ කළේය. SLFRS 15 යටතේ ගණුදෙනුකරුවෙකු විසින් භාණ්ඩ හෝ සේවා වල පාලනය ලබාගත් විට ආදායම ලෙස හඳුනාගැනේ. පාලනය පැවරීමේ වේලාව තීරණය කිරීමේදී කාලයත් සමඟ - විනිශ්චය අවශ්‍යවේ.

ගණුදෙනුකරුවෙකු සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුමක දක්වා ඇති ප්‍රතිශ්ඨාව මත පදනම්ව ආදායම මනිනු ලැබේ. අස්තිත්ත්වයක් විසින් භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයෙකුට පවරනවිට හෝ ලැබියයුතු යැයි සමාගම අපේක්ෂා කරන ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ පොල් සහ කොප්රා අලෙවියෙනි.

2018 ජනවාරි1 දින සිට බලපැවැත්වෙන SLFRS 15ට අනුව, සමාගම විසින් ආදායම හඳුනාගැනීම සඳහා මූලධර්ම මත පදනම්වූ පියවරයන් පහක ආකෘතියක් අනුගමනය කරයි. ඒ අනුව, ආදායම හඳුනාගනු ලබන්නේ පහත සඳහන් සියළු නිර්නායක සපුරා ඇතිවිට පමණි.

- ගිවිසුමෙහි පාර්ශවයන් ගිවිසුම/ම් අනුමත කර ඇති බව.
- මාරු කළයුතු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයේ අයිතිවාසිකම් හඳුනාගැනීමට අස්තිත්ත්වයට හැකිබව.
- පැවරිය යුතු භාණ්ඩ හෝ සේවා සඳහා වන ගෙවීම් නියමයන් අස්තිත්ත්වයට හඳුනාගත හැකිබව
- ගිවිසුමට වාණජමය හරයක් ඇතිබව
- පාරිභෝගිකයා වෙත මාරුකරනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සඳහා ලැබියයුතු ප්‍රතිශ්ඨාව රැස් කිරීමට අස්තිත්ත්වයට හැකියාව ඇතිබව

SLFRS 15 අදාල කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශයට සැළකිය යුතු බලපෑමක් ඇති නොවේ.

අ) දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී ලැබෙන ප්‍රතිලාභ හෝ අලාභ තීරණය වන්නේ දේපල, පිරියත සහ උපකරණ වල ශුද්ධ විකුණුම් ඉපැයීම් ඒවායෙහි ධාරණ අගයත් සමඟ සසඳා ආදායම් ප්‍රකාශ තුල හඳුනාගැනීමෙනි.

ආ) වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ

### 3.4.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපල පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරණු ලබන සියළු වියදම් වර්ෂය සඳහාවූ ලාභය (අලාභය) ලඟාකර ගැනීමේදී ආදායමෙන් අයකෙරේ.

## 3.5 ආදායම් බදු

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්බිත බද්දෙන් සමන්විතවේ. ස්කන්ධය ලෙසට හඳුනාගන්නා අවස්ථාවේදී, ස්කන්ධයට සෘජුව අදාලව හඳුනාගන්නා අයිතමයන් හැර, ආදායම් බදු වියදම ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගනු ලැබේ.

ඇ) ප්‍රවර්තන බදු

වර්තමාන බද්ද යනු වර්ෂය මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද වන අතර, වාර්තා කරන දිනට පනවන ලද බදු අනුපාත සහ ඊට පෙර වර්ෂ වලට අදාලව ගෙවිය යුතු බදු සංශෝධන භාවිතා කෙරේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් යන මූලිකාංග මත වන අතර, දේශීය ආදායම් පනතේ විධි විධාන වලට අනුකූලව ගණනය කරනු ලැබේ.

ආ) විලම්බිත බදු

ශේෂපත්‍ර ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු හඳුනාගෙන ඇති අතර, වත්කම් හා වගකීම්වල මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන ධාරණ අගය සහ බදුකරණ අගය සඳහා භාවිතා කරන අගය අතර ඇති තාවකාලික වෙනස්කම්වේ. පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බද්ද හඳුනාගනු නොලැබේ, ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයට බලපානු නොලබන වත්කම් හෝ වගකීම් මුලින් හඳුනාගැනීමේදී, සහ අනාගතයේදී ආපසු හැරවිය නොහැකි තරමට වන පරිපාලිත සමාගම්වල ආයෝජන සම්බන්ධ වෙනස්කම්ය. මෙයට අමතරවල කීර්ති නාමයේ මූලික හඳුනාගැනීම මත පැන නගින බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බද්ද හඳුනාගෙන නොමැත. විලම්බිත බද්ද මනිනු ලබන්නේ වාර්තා කරන දිනයට බලාත්මක කර ඇති හෝ සැළකිය යුතු ලෙස බලාත්මක කරන ලද නීති මත පදනම්ව ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් වලට අදාලවනු ඇතැයි අපේක්ෂා කරන බදු අනුපාතයන් මතය. වර්තමාන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීම සඳහා නිත්‍යානුකූලව බලාත්මක කළහැකි අයිතියක් තිබේනම්, විලම්බිත බදු වගකීම් සහ වත්කම් හිලව් කරනු ලබන අතර, ඒවා එකම බදු අධිකාරිය විසින් එකම බදු අයකළ හැකි අස්තිත්ත්වයක් මත අයකරනු ලබන ආදායම් බදු හා සම්බන්ධවේ.

විලම්බිත බදු වත්කමක් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස උපයෝගී කරගත හැකි, අනාගත බදු අයකළ හැකි, ලාභ ලබාගත හැකි තරමට පමණි. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර, හඳුනාගනු ලබන අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් සිදුවිය නොහැකි බව සාක්ෂාත් වනවිට එම ප්‍රමාණයෙන් ඒවා අඩුකරනු ලැබේ.

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පරිපාලිතයන්හි සහ ආශ්‍රිතයන්හි ලාභාංශ ආදායම මත රඳවාගෙන ඇති බදු අදාල ලාභාංශ ගෙවීමේ වගකීම හඳුනාගත් අවස්ථාවේදීම හඳුනාගනු ලැබේ.

## 3.6 ඛණ්ඩ වාර්තාකරණය

සමාගමේ විවිධ ව්‍යාපාරික ඛණ්ඩ සඳහා ඛණ්ඩ තොරතුරු සපයනු ලැබේ. ව්‍යාපාරික ඛණ්ඩනය තීරණය කිරීම වැවිලි වත්කම් ස්ථානගතවී ඇති භූගෝලීය ප්‍රදේශ මත පදනම්ව ඇත. මූල්‍ය ප්‍රකාශවල 25.1 වන සටහනෙහි ඛණ්ඩවල ක්‍රියාකාරකම් විස්තර කර ඇති අතර, වැවිලි කර්මාන්තයේ භූගෝලීය ප්‍රදේශ පහත පරිදිවේ.

| සමූහ I වතුයායයන් | සමූහ II වතුයායයන් |
|---|---|
| හලාවත වතු කලාපය | බිංගිරිය වතු කලාපය |
| පලුගස්වැව වතුයාය | දිවුලපිටිය වතු කලාපය |
| තම්බපණ්නි වතු කලාපය | මාදම්පේ වතු කලාපය |
| මංගලඑළිය වතු කලාපය | නිකවැරටිය වතු කලාපය |

## 04. ජනවසම ඉඩම් වල කල්බදු අයිතිය

සියලු වතු වලට අදාල වසර 53 කාලයක් සදහා කල්බදු ගිවිසුම් අත්සන් කර ඇත. මෙම සියලු කල්බදු 1992 ජුනි 22 දින එනම්, සමාගම ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක වේ. මෙම සියලු වතු වලට අදාල කල්බදු අයිතිය 1992 ජුනි 22 දින සමාගම පිහිටුවන ලද අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හදිසි කරුණු කාර්ය බලකාය මේ සම්බන්ධයෙන් ලබා දෙන නියමයන්ට හා විධිවිධානයන්ට අනුව සමාගමේ පොත් වලට ගෙන ඇත. මේ සදහා 1995 මාර්තු 08 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් ඉඩම් සමාගම පිහිටුවීමට පෙර විශේෂඥ ඩී. ආර් වික්‍රමසිංහ සැකසූ වටිනාකම මත ප්‍රති ඇගයීමට තීරණය කර ඇත.

1992 ජුනි මස 22 දින මෙම වත්කම් ශේෂ පත්‍රයට ගෙන වසර 53 ක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. වාර්තාකරන දිනට ඉතිරි කල්බදු කාලය වසර 25.5 ක් වේ.

| | දළ පවත්වාගෙන යාමේ අගය | |
|---|---|---|
| | දිනට 31.12.2019 රු. | දිනට 31.12.2018 රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 142,502,287 | 142,502,287 |

| | ක්‍රමක්ෂය | | |
|---|---|---|---|
| | දිනට 31.12.2019 රු. | වසර සඳහා රු. | දිනට 01.01.2018 රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 74,079,748 | 2,688,722 | 71,391,026 |

| | පවත්වාගෙන යාමේ අගය | |
|---|---|---|
| | දිනට 31.12.2019 රු. | දිනට 31.12.2018 රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 68,422,539 | 71,111,261 |

## 05. ජනවසම වතුවල නිශ්චල කල්බදු වත්කම් (භාවිතයට අයිතිය ඇති ඉඩම් සහ කල්බදු ජෛව වත්කම් හැර)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හදිසි කරුණු කාර්ය සාධක බලකායේ (**UITF**) නියමයට අනුව මෙම වතුවල ඇති මූල්‍ය කල්බදු යටතේ ඇති සියලුම නිශ්චල දේපල අතීතයේ සිට බලපවත්වන පරිදි 1992 ජුනි 22 වන දින සිට ක්‍රියාත්මක වනසේ සමාගමේ පොත් වලට ගෙන ඇත. වත්කම් ජනවසම පොත්වල සටහන් වටිනාකම් මත සමාගම ආරම්භ කළ දිනට පොත් වලට ගැනීමට 1995 මාර්තු 08 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තිරණය කර ඇත. මෙම වත්කම් 1992 ජුනි 22 දින ශේෂ පත්‍රයට ගෙන ඇති අතර නිශ්චල වත්කම් හා ක්‍රමක්ෂය 2019 දෙසැම්බර් 31 වන දිනට පහත දක්වා ඇත.

| තක්සේරුවේදී | ඉඩම් සංවර්ධනය රු. | වෙනත් අයිති වූ වත්කම් රු. | ගොඩනැගිලි රු. | යන්ත්‍ර සූත්‍ර රු. | ජල සැපයුම රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනිත වටිනාකම | 841,193 | 1,002,944 | 25,356,498 | 530 | 4,026,236 | 31,227,401 | 31,227,401 |
| **ක්‍රමක්ෂය වීම** | | | | | | | |
| ජනවාරි 01 දා ට | 63,482 | 887,004 | 25,356,498 | 530 | 4,026,236 | 30,333,749 | 30,266,897 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 2,390 | 33,397 | | - | - | 35,787 | 66,853 |
| දෙසැම්බර් 31 දා ට | 65,872 | 920,401 | 25,356,498 | 530 | 4,026,236 | 30,369,536 | 30,333,749 |
| **පවත්වාගෙන යන වටිනාකම** | **775,321** | **82,543** | - | - | - | **857,864** | **893,651** |

## 06 කල්බදු යටතේ ඇති ජෛව වත්කම් (ජනවසම)

| ප්‍රත්‍යාගණනය | 2019 රු. | 2018 රු. |
|---|---|---|
| මේරූ වගාවන් | 81,527,221 | 82,532,211 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (997,282) | (1,004,990) |
| | **80,529,939** | **81,527,221** |
| ජනවාරි 01 දා ට | 60,349,138 | 58,487,669 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 2,714,856 | 2,748,323 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (908,367) | (886,853) |
| දෙසැම්බර් 31 දා ට | **62,155,627** | **60,349,138** |
| **පවත්වාගෙන යන වටිනාකම** | **18,374,312** | **21,178,083** |

වතු කල්බදු යටතේ සමාගමට භාර දෙන අවස්ථාවේ නොමේරූ වගාවන් සඳහා කළ ආයෝජනය (1992-06-22 දිනට ප්‍රත්‍යාගනිත) නොමේරූ වගා ලෙස දක්වා ඇති අතර වාර්ථා කරන දින වන විට ඒවා සියල්ල මේරූ වගාවන්ට මාරු කර ඇත. තවද, සමාගම මේරූ සහ නොමේරූ වගාවන් වෙනුවෙන් සිදු කල ආයෝජනයන් කල්බදු දේපල සංවර්ධන සටහන් අංක 7.1 යටතේ දක්වා ඇත. මෙම මේරූ/නොමේරූ වගාවන් LKAS 41 කෘෂිකාර්ම නියමයන් යටතේ ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

## 07 ජෛව වත්කම්

### 7.1 කල්බදු දේපල සංවර්ධනය (ධාරක ජෛව වත්කම්)

| පිරිවැය | නොමේරූ වගා රු. | මේරූ වගා පොල් රු. | මේරූ වගා කජු රු. | මේරූ වගා වෙනත් රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේදී | 480,917,631 | 344,742,382 | 87,056,399 | 6,658,115 | 919,374,527 | 839,388,467 |
| එකතු කිරීම් | 60,580,869 | - | - | | 60,580,869 | 79,986,060 |
| නොමේරූ වලින් මාරු කිරීම | | 98,245,595 | - | 759,697 | 99,005,292 | 78,959,644 |
| මේරූ වලට මාරු කිරීම | (99,005,292) | - | - | - | (99,005,292) | (78,959,644) |
| ලියා හැරි ශේෂය | - | - | - | - | - | - |
| වර්ෂය අවසානයේ දී | **442,493,208** | **442,987,977** | **87,056,399** | **7,417,812** | **979,955,396** | **919,374,527** |
| **ක්ෂයවීම** | | | | | | |
| වර්ෂය ආරම්භයේදී | | 35,812,666 | 33,550,836 | 1,086,945 | 70,450,448 | 61,345,593 |
| වර්ෂය සඳහා | | 6,894,845 | 3,482,255 | 332,905 | 10,710,005 | 9,104,855 |
| වර්ෂය අවසානයේ දී | | **42,707,511** | **37,033,091** | **1,419,850** | **81,160,453** | **70,450,448** |
| පවත්වාගෙන යන අගය | **442,493,208** | **400,280,465** | **50,023,307** | **5,997,962** | **898,794,943** | **848,924,079** |

**සටහන.**

මේවා සමාගම ස්ථාපිත කළ දින සිට මේරූ සහ නොමේරූ වගා සඳහා කළ ආයෝජනයි. කල්බදු යටතේ අත්පත් කර ගත් වත්කම් (වැවිලි වත්කම් ඇතුලත්ව) සටහන් අංක 4,5 සහ 6 යටතේ විදහා පෙන්වයි. තවදුරටත් කල්බදු පදනම යටතේ පවරාගන්නා ලද වත්කම් වල නොමේරූ වගාවන් වෙනුවෙන් කළ ආයෝජනයන් මෙම සටහන තුළ ඇතුලත් වේ. එවැනි වගා මේරූ තත්ත්වයට පැමිණි විට, මේරූ තත්ත්වයට ගෙන ඒමට යෙදූ අමතර ආයෝජනය මෙම සටහන අනුව නොමේරූ සිට මේරූ කොටසට මාරු කර ඇත. ඒ අකාරයෙන්ම, ජනවසම කල්බදු පෙර කරන ලද ආයෝජනය වෙනුවෙන්ද නොමේරූ සිට මේරූ දක්වා මාරු වීම් වලට අදාල වෙනස්වීම සටහන් අංක 06 මගින් පෙන්වයි.

ජෛව වත්කම් ගිණුම්කරණ ප්‍රමිත අංක 41 හි දක්වා තිබූ පරිදි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර අගය හඳුනා ගැනීමේ අවශ්‍යතාවය 2012 මාර්තු 02 දින වරලත් ගණකාධිකාරි ආයතනයෙන් නිකුත් කළ නිර්දේශයන් හා නියමයන් මගින් අවලංගු වේ. ඒ අනුව සමාගම ජෛව වත්කම් අගය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 -දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව පිරිවැය මත සිදු කරනු ලබයි.

වගා වියදම් මූල්‍යනය කිරීම සඳහා විශේෂිත ණය පහසුකම් ලබාගෙන නොමැත. එම නිසා ණය පිරිවැය වර්ෂය තුළ නොමේරූ වගාවන් යටතේ ප්‍රග්ධනිත කර නොමැත. (2019 නොමැත)

### 7.2 ජෛව වත්කම් - පශු සම්පත්

| | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| කිරි පශු සම්පත් | **07.2.1** | 8,188,790 | 8,066,800 |
| වෙනත් පශු සම්පත් | **07.2.2** | 7,216,710 | 10,628,152 |
| | | **15,405,500** | **18,694,952** |

### 7.2.1 කිරි පශු සම්පත්

| | නොමේරූ දෙනුන් පැටව් / වැස්සියන් රු. | මේරූ දෙනුන් (කිරි දෙන සහ නොදෙන දෙනුන්) රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| ජනවාරි 01 දා ට | 283,180 | 7,783,620 | 8,066,800 | 10,929,500 |
| වර්ෂය තුළ එකතු වූ | 153,400 | | 153,400 | 108,000 |
| වර්ෂය සධාරණ අගයට ලද ලාභය/පාඩු | 501,350 | 481,191 | 982,541 | (266,200) |
| මාරු කිරීම ඇතුළට/පිටතට | (12,770) | 346,480 | 333,710 | 579,100 |
| මරණ/විකුණුම් | (22,600) | (1,325,061) | (1,347,661) | (3,283,600) |
| දෙසැම්බර් 31 දා ට | **902,560** | **7,286,230** | **8,188,790** | **8,066,800** |

පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩුකිරීමෙනි. පශු සම්පත් සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කළ චක්‍රලේඛයට අනුව තීරණය කරනු ලබයි.

### 7.2.2 වෙනත් පශු සම්පත් (ධාරක ජෛව වත්කම්)

| | මී හරක් රු. | කරත්ත ගොන්නු රු. | පට්ට ගොන්නු රු. | බැටළුවන් රු. | එළ හරක් රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 01 දා ට | 3,415,065 | 1,430,550 | 346,080 | 4,638,057 | 798,400 | 10,628,152 | 5,167,112 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 266,885 | | | 97,850 | 52,000 | 416,735 | 478,500 |
| මාරු කිරීම් ඇතුලට /පිටතට | (231,315) | | 49,440 | | | (181,875) | 2,049,600 |
| මරණ/ විකුණුම් | (1,728,830) | (120,250) | (247,200) | (3,697,552) | (722,400) | (6,516,232) | (1,870,390) |
| වර්ෂය තුළ සාධාරණ අගය වැඩිවීම (අඩුවීම) | 2,014,095 | 361,060 | 37,980 | 412,995 | 43,800 | 2,869,930 | 4,803,330 |
| | **3,735,900** | **1,671,360** | **186,300** | **1,451,350** | **171,800** | **7,216,710** | **10,628,152** |

### 7.3 පරිභෝජ්‍ය ජෛව වත්කම් - දැව වගාව

| | 2019 රු. නොමේරූ | 2019 රු. මේරූ | 2019 රු. එකතුව | 2018 රු. නොමේරූ. | 2018 රු. මේරූ | 2018 රු. එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 2,857,785 | 54,987,875 | 57,845,660 | 2,806,051 | 51,716,391 | 54,522,442 |
| සංවර්ධනය/ආයෝජනය මත සිදුවන වැඩිවීම | - | | - | 51,734 | | 51,734 |
| වටිනාකම අඩු වැඩිවීම තුළ හඳුනාගත් ලාභ හෝ අලාභ | | 35,256,574 | 35,256,574 | | 13,070,485 | 13,070,485 |
| දැව ගස් හෙලිම නිසාවු වටිනාකමේ අඩුවීම | | (3,271,750) | (3,271,750) | | (9,799,000) | (9,799,000) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **2,857,785** | **86,972,699** | **89,830,484** | **2,857,785** | **54,987,875** | **57,845,660** |

ජෛව වත්කම් පරිවර්තනය මූල්‍යමය වටිනාකමක් දක්වා වර්ධනය වී නොමැති විට නොමේරූ දැව ගස් සඳහා වන පිරිවැය දළ සාධාරණ අගයක් වශයෙන් සැලකේ.

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමවේදය යොදා ගනිමින් ඒ.ඒ.එම්. ෆාතිහු මහතා විසින් අදාල තක්සේරුකරණය සිදු කර ඇත. දැව ගස් වල සධාරණ අගය නිශ්චය කිරීමේදී සියලු වතු ආවරණය කරමින් භෞතික නිශ්චය කිරීමක් සිදු කරන ලදී.

**තක්සේරුකරණයේදී යොදා ගැනුණ මූලික උපකල්පන**

1. රාජ්‍ය දැව සංස්ථාවේ දැව මිල ලේඛණය පදනම් කරගෙන ඇත.
2. වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ විකුණුම් මිල ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත.
3. වට්ටම් අනුපාතිකය - අස්වැන්න නෙලන වයස අවුරුදු 5 හෝ 5 ට අඩු 14%
   - අස්වැන්න නෙලන වයස අවුරුදු 6 ත් 15 ත් අතර 15%
   - අස්වැන්න නෙලන වයස අවුරුදු 15 ට වැඩි 16%
4. පරිනතවීමේ කාලසීමාව අවු 30 ක් ලෙස තක්සේරු කර ඇත.

ශුද්ධ වර්තමාන වටිනාකම මත පදනම්ව බාහිර තක්සේරුකරණය දැව ගස් වල දිගු කාලීන හානි වීම සැලකිල්ලට ගෙන ඇත. විචල්‍යන්ගේ වෙනස් වීම හේතුවෙන් සාධාරණ අගය මත ජෛව වත්කම් තක්සේරු කිරීමේදී පවතින ඒ හා බැඳුණු අස්ථාවරත්වය හේතුවෙන් ඒවායේ පවතින වටිනාකම තත්‍ය වටිනාකමින් වෙනස්විය හැක.

සමාගම සිය දැව ගස් සම්බන්ධයෙන් පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වේ.

**නියාමන සහ පාරිසරික අවධානම**

සමාගම ශ්‍රී ලංකාවේ නීති රීති හා රෙගුලාසිවලට යටත්වේ. දේශීය පාරිසරික සහ වෙනත් නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමාගම පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් පිහිටුවා ඇත. පාරිසරික අවදානම් හඳුනාගැනීම සඳහා කළමනාකාරිත්වය මගින් නිරන්තර විමර්ෂණයන් සිදුකෙරේ.

**සැපයුම් සහ ඉල්ලුම් අවදානම**

